

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2012 වාර්ෂික වාර්තාව

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2012 වාර්ෂික වාර්තාව

ලිපිනය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
574,
ගාලු පාර,
කොළඹ 03,
ශ්‍රී ලංකාව

: ශ්‍රී ලංකා තේ මණ්ඩලය,කොළඹ

දුරකතන :+94-11-2587814
+94-11-2582121
+94-11-2583687

ෆැක්ස් :+94 112587341
+94 112589132

ඊ-මේල් : teaboard@pureceylontea.com
වෙබ් : www.pureceylontea.com




# කළු තේ

ගුණාත්මක බව හා වර්ණය ප්‍රශස්ත මට්ටමින් ලබා ගැනීම සඳහා <u>Camella Sinensis</u> ශාක පත්‍ර ඔක්සිකරණයට භාජනය කිරීමෙන් නිෂ්පාදිත තේ වර්ගයක් වන කළු තේ සාමාන්‍යයෙන් වඩාත් රසවත්ය




# හරිත තේ

පිරිසැකසුම් ක්‍රියාවලිය තුළදී ඔක්සිකරණයට භාජනය නොවූ *Camellia sinensis* ශාක පත්‍රවලින් හරිත තේ නිපදවනු ලැබේ. හරිත තේ සම්භවය වූයේ චීනයේ වුවද, ආසියාව පුරා බොහෝ සංස්කෘතීන් සමඟ හරිත තේ මුසු වී තිබේ.

# පටුන


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | 06 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින් | 09 |
| විගණන කමිටු සාමාජිකයින් | 10 |
| ප්‍රවර්ධන හා අලෙවිකරණ සාමාජිකයින් | 11 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්ය මණ්ඩලය | 12 |
| සභාපතිතුමියගේ පණිවුඩය | 13 |
| මූලික සංසන්දනාත්මක දර්ශක | 15 |
| සංස්ථාපිත පසුබිම | 19 |
| කර්මාන්තය පිළිබඳ පැතිකඩ | 23 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් ඉටු කරන ලද ක්‍රියාකාරකම් | 65 |
| තේ කොමසාරිස් අංශය | 67 |
| තේ අපනයන ශාඛාව | 77 |
| තේ ප්‍රවර්ධන අංශය | 83 |
| තේ රස පිරික්සුම් ඒකකය | 95 |
| විශ්ලේෂණ රසායනාගාරය | 101 |
| පරිපාලන අංශය/ අභ්‍යන්තර විගණන | 107 |
| තොරතුරු තාක්ෂණ අංශය | 110 |
| මූල්‍ය සමාලෝචනය | 113 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල | 147 |

# දැක්ම

**ශ්‍රී ලංකා තේ**
ගෝලීය වෙළඳපොළ තුළ
**“ජනප්‍රියම පානය”**
බවට පත් කිරීම



# මෙහෙවර

කාලීන රෙගුලාසි හා **කර්මාන්තයේ තිරසාර සංවර්ධනය**
තුළින් රට වෙත විදේශ විනිමය ඉපැයීම්
ඉහළ නැංවීම හා එමඟින්
තේ වැවිලි ප්‍රජාවගේ
ආර්ථික සංවර්ධනය සහතික කිරීම



# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින්

| | |
|---|---|
| **සභාපති** | **ජානකී කුරුප්පු මහත්මිය** |
| **මණ්ඩලයේ ලේකම්** | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් |
| | **එච්.ඩී. හේමරත්න මහතා** (2012 ජූලි 23 දක්වා) |
| | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් |
| | **ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා** (2012 ඔක්තෝබර් 17 සිට) |
| **මණ්ඩලයේ සාමාජිකයින්** | |
| සාමාජික | අතිරේක ලේකම්(සංවර්ධන) |
| | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - නියෝජනය කරමින් |
| | **පී.එල්.යූ. දිසානායක මහතා** |
| සාමාජික | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නියෝජනය කරමින් |
| | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් |
| | **පුෂ්පා වෙල්ලප්පුලි මහත්මිය** (2012 මාර්තු 28 සිට) |
| සාමාජික | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති |
| | **එන්.පී. කාරියවසම් මහතා** |
| සාමාජික | කොළඹ තේ වෙළඳුන්ගේ සංගමයේ සභාපති |
| | **ජයන්ත කෑරගල මහතා** |
| සාමාජික | ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ සභාපති |
| | **එස්.කේ.එල්. ඔබේසේකර මහතා** |
| සාමාජික | කොළඹ තැරැව්කරුවන්ගේ සංගමයේ සභාපති |
| | **එන්.සී. මුණසිංහ මහතා** (2012 අප්‍රේල් 23 දක්වා) |
| | **දීපාල් ජයමාන්න මහතා** (2012 අප්‍රේල් 23 සිට) |
| සාමාජික | තේ අපනයනකරුවන්ගේ සංගමයේ සභාපති |
| | **නිරාජ් ද මෙල් මහතා** (2012 අගෝස්තු 27 දක්වා) |
| | **රොහාන් ප්‍රනාන්දු මහතා** (2012 නොවැම්බර් 14 සිට) |
| සාමාජික | ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනයේ |
| | සභාපත නියෝජනය කරමින් |
| | **කුමාර ගුණසිංහ මහතා** (2012 ඔක්තෝබර් 30 දක්වා) |
| | **නෙවිල් රත්නායක මහතා** (2012 දෙසැම්බර් 31 සිට) |
| සාමාජික | ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමිකරුවන්ගේ සංගමයේ සභාපති නියෝජනය කරමින් |
| | **අනිල් පෙරේරා මහතා** |
| සාමාජික | ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා |
| | විසින් නම් කරනු ලබන සාමාජිකයා |
| නිරීක්ෂකයින් | **ජේෆ් ඇලෝසියස් මහතා** |
| | **ආචාර්ය එස්.එස්.බී.ඩී.පී.ජයවර්ධන මහතා** |
| | **ටී සම්බසිවම් මහතා** |

# විගණන කමිටු සාමාජිකයින්

| | |
|---|---|
| **සභාපති** | **පුෂ්පා වෙල්ලප්පිලි මහත්මිය**<br>අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව<br>ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (2012 අප්‍රේල් 23 සිට) |
| **සාමාජික** | **පී.එල්.යූ. දිසානායක මහතා**<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| **සාමාජික** | **ජයන්ත කෑරගල මහතා**<br>සභාපති<br>තේ අපනයනකරුවන්ගේ සංගමය |
| **සාමාජික** | **අනිල් පෙරේරා මහතා**<br>සභාපති නියෝජනය<br>ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමිකරුවන්ගේ සංගමය |
| **නිරීක්ෂක** | **සී.එම්.එස්. ඇන්තනී මහතා**<br>විගණන අධිකාරී<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| **කැඳවුම්කරු** | **එච්.ඩී. හේමරත්න මහතා**<br>අධ්‍යක්ෂ ජෙනරාල්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය (2012 ජූලි 21 දක්වා) |
| **කැඳවුම්කරු** | **හසිත ද අල්විස් මහතා**<br>වැ.බ. අධ්‍යක්ෂ ජෙනරාල්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය (2012.07.31 සිට 2012.11.02 දක්වා) |
| **කැඳවුම්කරු** | **ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා**<br>අධ්‍යක්ෂ ජෙනරාල්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය (2012.11.02 සිට) |

# ප්‍රවර්ධන හා අලෙවිකරණ කමිටු සාමාජිකයින්

**ප්‍රවර්ධන හා අලෙවිකරණ කමිටුව ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රවර්ධනාත්මක හා අලෙවිකරණ ක්‍රියාකාරකම් පිළිබඳ මණ්ඩලය වෙත මාර්ගෝපදේශණය සැපයීම සඳහා පත් කරන ලද අනු කමිටුවකි.**

**සභාපති**

**ජානකී කුරුප්පු මහත්මිය**

සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**කමිටු සාමාජිකයින්**

**රාජ්‍ය අංශය**

**පී.එල්.යූ. දිසානායක මහතා**

අතිරේක ලේකම් (සංවර්ධන)

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**ඩී.ඩබ්.එස්. නාරංගොඩ මහතා**

අධ්‍යක්ෂ ජෙනරාල්

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**හසිත ද අල්විස් මහතා**

අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**පී.ඩී. ප්‍රනාන්දු මහතා**

අධ්‍යක්ෂ ජෙනරාල්

වාණිජ දෙපාර්තමේන්තුව

**කමිටු සාමාජිකයින් පෞද්ගලික අංශය**

**මලින් ගුණතිලක මහතා**

මහ ලේකම් ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

**රවී අබේවර්ධන මහතා**

සාමාජික පෞද්ගලික තේ කර්මාන්තශාලා හිමිකරුවන්ගේ සංගමය

**අනිල් කුක් මහතා**

සභාපති කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය

**රොහාන්ත අතුකෝරළ මහතා**

ප්‍රධානී ජාතික පෝට්ෆෝලියෝ සංවර්ධන (UNOPS)

**ආචාර්ය එස්.එස්.බී.පී. ජයවර්ධන මහතා**

සභාපති තේ පර්යේෂණ මණ්ඩලය

**නෙවිල් රත්නායක මහතා**

සභාපති ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සංගම් සම්මේලනය

**ආචාර්ය ගාමිණී අබේවික්‍රම මහතා**

කළමනාකරණ අධ්‍යක්ෂ බැසිලර් තේ අපනයන (පෞද්) සමාගම

**මුඟබෙල් ජැෆර්ජි මහතා**

කළමනාකරණ අධ්‍යක්ෂ ජැෆර්ජි සහෝදරයෝ ආයතනය

**රොමේෂ් මොරායස් මහතා**

අධ්‍යක්ෂ ෆින් ලේස් කලම්බු පුද්ගලික සමාගම

**ජයන්ත කරුණාරත්න මහතා**

ප්‍රධාන විධායක නිලධාරී ඉම්පීරියල් ටීස් (පුද්) සමාගම

**මලික් ප්‍රනාන්දු මහතා**

අධ්‍යක්ෂ එම් ජේ එෆ් සමූහ ව්‍යාපාරය

**රොහාන් ප්‍රනාන්දු මහතා**

ප්‍රධාන විධායක නිලධාරී, එච් වී ඒ සමූහ ව්‍යාපාරය

**නිරාජ් ද මෙල් මහතා**

කළමනාකරණ අධ්‍යක්ෂ වැන් රීස් ලංකා සමාගම

**ටියාබ් අක්බරාලි මහතා**

අධ්‍යක්ෂ සී/ස අක්බාර් සහෝදරයෝ සමාගම

**අවී ද සිල්වා මහතා**

කළමනාකරණ අධ්‍යක්ෂ යුනිලීවර් ලංකා සමාගම

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | **එච්.ඩී. හේමරත්න මහතා** (2012 ජූලි 23 දක්වා) |
| | **ඩී.ඩබ්.එන්.නාරංගොඩ මහතා** (2012 ඔක්තෝබර 17 සිට) |
| අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) | **ඒ.එච්. ද අල්විස් මහතා** |
| තේ කොමසාරිස් | **ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මහතා** |
| සහකාර අධ්‍යක්ෂ ජෙනරාල් (පාලන) | **එස්.අයි.සී. පෙරේරා මහතා** |
| සහකාර අධ්‍යක්ෂ ජෙනරාල් (මූල්‍ය) | **ඒ.ඩී.ඩබ්. බණ්ඩාරගේ මහත්මිය** |
| වැඩ බලන ප්‍රධාන අභ්‍යන්තර විගණක | **එච්.ඩී.කේ. ජයසිංහ මහතා** |

# සභාපතිතුමියගේ පණිවුඩය



2011 වසරේ දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපතිනිය ලෙස පත් වූ අවස්ථාවේදී, අවම පිරිවැයක් දරමින් තරගකාරී ලෙස නිෂ්පාදනය කිරීමේ අභියෝගය මෙන්ම ඵලදායීතාවය හීන වීම, නව්‍යකරණයේ හා ආයෝජනවල හිඟකම යනාදී බිම් මට්ටමේ ගැටලු හේතුවෙන් තරගකාරී ගෝලීය වෙළඳපොළ තුළ බොහෝ අභියෝගවලට ලක්ව තිබූ කර්මාන්තයක් භාරගැනීමට මට සිදු විය. බාහිර වශයෙන් පැවති තත්ත්වය මෙය වූ අතර තේ මණ්ඩලය අභ්‍යන්තරයේ මා දුටුවේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හා කාර්යක්ෂම තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයක් නොතිබීම මධ්‍යයේ වුවද, නිරතුරුවම ඉහළ යමින් පවතින තේ ඉල්ලුම සපුරාලීම ට මහත් පරිශ්‍රමයක් දරන ආයතනයකි. එම නිසා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට සේවකයන් බඳවා ගැනීම තහනම් කරමින් අධිකරණයේ විභාග වෙමින් පැවති නඩුව සමථයකට පත් කර ගනිමින් අනුමත සේවක සංඛ්‍යාවේ ඇබෑර්තු පිරවීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ද, පරිගණක මෘදුකාංග සමාගම් සමඟ නැවත සාකච්ඡා පවත්වා ආයතනයේ වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ පද්ධති ලබා ගැනීම සම්බන්ධයෙන්ද ක්ෂණික අවධානය යොමු කිරීමට මට සිදු විය. මෙයට පෙර සිටි සභාපතිවරයාගේ ධූර කාලය තුළ වසර ගණනාවක් මුළුල්ලේ සංශෝධනයකට ලක් කර නොතිබූ ගාස්තු හා අයබදු ඉහළ දැමීම මගින් ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම පිළිබඳ ගැටලුවට විසඳුමක් ලබා දීමට මට හැකි වූ අතර එසේ ගාස්තු හා අයබදු සංශෝධනය නොකළේ නම් ඉහත සඳහන් කරනු ලැබූ කිසිදු කටයුත්තක් ඉටු කළ නොහැකි වන්නට ඉඩ තිබුණි.

සමාලෝචනයට බදුන්වන වර්ෂය තුළ, තේ කර්මාන්තයේ ප්‍රධානතම ආයතනය වශයෙන් එහි සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව පවත්නා සියලුම නීති රීති හා රෙගුලාසි යළි සමාලෝචනයට බදුන් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාර්ථකව සම්පූර්ණ කරන ලදී. නව තේ පනත් කෙටුම්පත අමාත්‍යාංශය හා නීති දෙපාර්තමේන්තුව මගින් තව දුරටත් සුපරික්ෂාකාවට ලක් කෙරෙමින් පවතී. වර්ෂය තුළ පවත්නා නීති රීති හා රෙගුලාසි දැඩි අවධානයකින් යුතුව ක්‍රියාවට නැංවීම මගින් නිෂ්පාදන අවස්ථාවේදී මෙන්ම විකුණුම් අවස්ථාවේදීද සකසන ලද තේ වල ගුණාත්මක බව වඩාත් හොඳින් නියාමනයට ලක් කිරීමට හැකි විය. සහනාධාර යෝජනා ක්‍රම වල ඵල ලබන්නන් වන පාර්ශ්වකරුවන්ගේ සීමාසහිත සහභාගීත්වය හේතුකොට ගෙන කර්මාන්තශාලා නවීකරණ හා නැවත වගා කිරීමට සම්බන්ධ සංවර්ධන ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ප්‍රගතියක් දක්නට නොලැබිණි. පසු අස්වනු හානි අවම කිරීම සඳහා මෙන්ම තේ කර්මාන්තශාලාවල ක්‍රියාත්මක කරනු ලබන මනා නිෂ්පාදන භාවිතයන් අධීක්ෂණය ශක්තිමත් කිරීම පිණිස බී ලීෆ් 60 වැඩසටහන තේ කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් දියත් කරනු ලැබීය.

ගෝලීය තේ වෙළඳපොළේ තරග කිරීම සඳහා ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කළ හැකි වන පරිදි මනාව සැලසුම් කරන ලද සන්නිවේදන ක්‍රමෝපායක් පැවතීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා අරමුදල් රැස් කිරීමේ අරමුණින් 2010 ඔක්තෝබර් මාසයේදී, ප්‍රවර්ධන හා අලෙවිකරණ අයබද්දක් හඳුන්වා දී තිබේ. මෙම වැඩපිළිවෙළ සඳහා මෙන්ම මෙම අරමුදල භාවිතා කිරීමේ අරමුණු සඳහා ද කැබිනට් අනුමැතිය ලැබී තිබේ. එමනිසා 2012 වසරේදී මෙම සන්නිවේදන ව්‍යාපාරය දියත් කිරීම සඳහා ඉලක්ක වෙළඳපොළ හඳුනා ගනිමින් සවිස්තරාත්මක අලෙවිකරණ සැලැස්මක් සම්පාදනය කිරීමට ද, සුදුසු සන්නිවේදන පාර්ශ්වකරුවන් තෝරාගනිමින්, මෙම ව්‍යාපාරය සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ද කටයුතු සලසා තිබේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂය තුළ,ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් වෙළඳ දැන්වීම් සම්බන්ධ නියෝජිතායතන වල සේවා ලබා ගැනීම සඳහා ද ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කරනු ලැබූ අතර ඉදිරි වසරේදී තෝරාගැනීම් අවසන් කිරීමට සැලසුම් සකස් කර තිබේ. තවද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සියලුම අපනයන වෙළඳපොළවල් පිළිබඳව සමාලෝචනය කිරීම ආරම්භ කර තිබෙන අතර තුන් අවුරුදු ක්‍රමෝපායික අලෙවිකරණ සැලැස්මක් සම්පාදනය කිරීම සඳහා පසුබිම් අධ්‍යයනයක් සිදු කිරීමටද කටයුතු සලසා තිබේ. ගෝලීය වෙළඳපොළවල 100% ක් පිරිසිදු ශ්‍රී ලංකා තේ බව සංකේතවත් කරන .සිංහ ලාංඡනය" ද පරිසර හිතකාමී ඕසෝන් ලාංඡනය හා G1 රටවල් 7 කලාපීය ලංඡනය සඳහා තත්ත්ව සංකේත ලියාපදිංචි කිරීමේ කාර්යයේද ශ්‍රී ලංකා තේ මණ්ඩලය මේ වන විට නිරතව සිටියි.

ඉදිකිරීමෙන් පසු වසර 30 කටත් අධික කාලයක් මුළුල්ලේ අලුත්වැඩියා කර නොතිබූ, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සමාලෝචනයට බඳුන් වන වර්ෂය තුළ ආරම්භ කළ තවත් ප්‍රධාන කටයුත්තක් වූ අතර ලෝකයේ අනර්ඝතම තේ ලෙස .ලංකා තේ" සතු ප්‍රතිරූපයට වඩාත් ගැළපෙන ආකාරයේ උසස් නිමාවකින් මෙම ගොඩනැගිල්ලේ පිහිටි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව, අමුත්තන් සඳහා වෙන් කළ ශාලාව හා අලෙවිකරණ මධ්‍යස්ථානය සකස් කර තිබේ.

ලෝකයේ අනගිභවනීය තේ නිෂ්පාදකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව තවදුරටත් සැලකෙන අතර කෙන්යාව හා චීනය වැනි මෙම කර්මාන්තයට අළුතෙන් පිවිසෙන රටවල් හේතුකොට ගෙන ගෝලීය තේ ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය අභියෝගයට ලක් වෙමින් පවතී. කලකට පෙර හිමිකරගත් පළමු ස්ථානය හා සසඳන විට ප්‍රමාණාත්මක වශයෙන්

චීනයට යන්තමින් පිටුපසින් හා කෙන්යාවට සැලකිය යුතු තරම් පහළින් තේ අපනයන කරන රටවල් ලීගයේ තුන්වන ස්ථානයට ශ්‍රී ලංකාව පත්ව සිටිය ද, ගෝලීය අපනයන වටිනාකම් අනුව ප්‍රථම ස්ථානයට පත්ව සිටි අප රටේ මෙම ශ්‍රේෂ්ඨ කර්මාන්තය නැවත නැවතත් අවධාරණය කරන්නේ අගය එකතු කිරීම මත අපගේ උපාය මාර්ග කේන්ද්‍රගත කිරීමේ හා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයි. අගය එකතු කරන ලද තේ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග ශක්තිමත් කිරීම හා සමගාමීව, තේ නැවත වගා කිරීමේදී, පාලු සිටුවීමේ දී හා පොහොර යෙදීමේදී මෙන්ම ඉහළ තත්ත්වයේ තේ ප්‍රභේද භාවිත කිරීමේදී ද ප්‍රමාණවත් ලෙස මුදල් ආයෝජනය කිරීම මගින් අස්වැන්න ඉහළ නැංවීම පිළිබඳව ද අවධානය යොමු කළ යුතුයි.

ශ්‍රී ලංකාවේ තේ වගා කිරීමේ කර්මාන්තය නිරන්තරයෙන්ම සමස්ථ ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ඉතා වැදගත් සංඝටකයක් විය. ශ්‍රී ලංකා තේ කර්මාන්තය රටේ දළ දේශීය නිෂ්පාදිතයට මෙන්ම රාජ්‍ය ආදායම කෙරෙහි ද කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙයි. 2012 වර්ෂය තුළ අපනයන ප්‍රමාණය එහි ධාරිතාවෙන් 0.7% කින් පහළ යාමක් වූ අතර 2011 වර්ෂය හා සසඳන විට එහි ඉපැයීම් වලට 9.6% ක ඉහළ යාමකි.
එමගින් රට වෙත රැගෙන ආ විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණය අමෙරිකානු ඩොලර් 1,414 කි. පසුගිය වසර පුරා වාර්ෂික තේ නිෂ්පාදනය 0.3% කින් වර්ධනය වී ඇත්තේ නිෂ්පාදන ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 328.4 ක් කරා ළගා වෙමිනි. ශ්‍රී ලංකාවේ තේ වගා කරන ලද සමස්ත භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර 221,929 ක් බවට තක්සේරු කර ඇත.

දෙවන ප්‍රශස්තතම වෙන්දේසිය වන  මොම්බාසා වෙත ඇමරිකානු ඩොලර් 2.88ක් පමණක් උපයා ගැනීමට හැකිවෙද්දී කිලෝග්‍රෑමයක් සඳහා සාමාන්‍ය වෙන්දේසි මිල ඇමරිකානු ඩොලර් 3.07 ක් බවට පත්වීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. 2012 වර්ෂයේදී සංයුක්ත වෙන්දේසි මිල රු.391.64 ක් විය. එය 2011 වර්ෂයේ වාර්තා වූ පසුගිය ඉහළම සාමාන්‍ය වන රු. 359.89 සිට ඉහළ යමින් පවතින සර්ව කාලීන වාර්තාවකි. ශ්‍රී ලංකා තේ වල පවත්නා ප්‍රනීත රසය හා ගුණය හේතුකොට ගෙන ලොව අග්‍ර ගණයේ තේ අතර සාම්ප්‍රදායික තත්ත්වයක් උසුලනු ලබයි. එසේ හෙයින්, ලොව වෙනත් ප්‍රධාන තේ වෙන්දේසිවලට වඩා  කොළඹ තේ වෙන්දේසිවල මිල ගණන් නිශ්චිත වශයෙන්ම ඉහළ අගයක් ගනී.

2012 වසරේදී තේ කර්මාන්තයට අහිතකර ලෙස බලපෑම් සිදු වූ වඩාත් ම කැපී පෙනෙන සාධකය වූයේ ශ්‍රී ලංකා තේ, සඳහා ශක්තිමත් වෙළඳපොළ තත්ත්වයක් පවත්නා මැද පෙරදිග මෙන්ම සාමාන්‍යයෙන් ගෝලීය වශයෙන් හා විශේෂයෙන්ම යුරෝපය තුළ පවත්නා මූල්‍යමය/ ආර්ථික ගැටලු හේතු කොට ගෙන ඇති වූ අවිනිශ්චිත බවයි. තේ සඳහා බලපාන ප්‍රධාන වෙළඳ විනිමය වර්ගය වන ඇමරිකානු ඩොලරය හා වෙනත් ප්‍රධාන විනිමය වර්ග වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ ඉහළ විනිමය අනුපාතයද මේ සම්බන්ධයෙන් යහපත් බලපෑමක් වූයේ නැත.

ගෝලීය ප්‍රවණතාවලට ගැළපෙන පරිදි හා එමගින් ඉහළ මට්ටමේ සාර්ථකත්වයක් හා තිරසාර බවක් ලබා ගැනීමේ අරමුණින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය එහි ප්‍රතිපත්ති හා රෙගුලාසි මෙන්ම තේ කර්මාන්තය සඳහා පිරිනමා ඇති මූල්‍ය සහයෝගීතා යෝජනා ක්‍රම පිළිබඳව අඛණ්ඩව සමාලෝචනය කරයි. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හා එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරනු ලබන මගපෙන්වීම හා ලබා දෙන උපදෙස් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ හා කාර්යය මණ්ඩලයේ සෑම තරාතිරමකම සේවක සේවිකාවන්ගේ දායකත්වය ඉහළින්ම අගය කරන අතර ඒ සම්බන්ධයෙන් මාගේ ස්තූතියද පිරිනමමි.

**ජානකී කුරුප්පු**
සභාපති
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# මූලික සංසන්දනාත්මක දර්ශක

## තේ නිෂ්පාදනය

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| සමස්ත තේ නිෂ්පාදනය (කිලෝග්‍රෑම් මිලියන) | 331.4 | 327.5 | 328.4 | 0.3 |

## බිම පිහිටීම අනුව වර්ග කිරීම

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| උඩරට | 79.1 | 78.2 | 73.6 | (5.9) |
| මැදරට | 56.1 | 52.6 | 52.6 | 0.0 |
| පහතරට | 196.2 | 196.7 | 202.1 | 2.7 |

## සැකසුම් ක්‍රමය අනුව වර්ග කිරීම(කිලෝග්‍රෑම් මිලියන)

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| සාම්ප්‍රදායික (කාබනික, ක්ෂණික හා පුනරුත්ථාපනය කළ තේ ඇතුළත්ව තේ) | 309.7 | 302.0 | 302.1 | 0.0 |
| සී.ටී.සී. | 18.4 | 22.6 | 23.3 | 3.1 |
| හරිත තේ අලෙවිය | 3.3 | 3.0 | 3.0 | 0.0 |

## තේ අලෙවිය

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| සමස්ත තේ අලෙවිය - ප්‍රමාණය (කිලෝග්‍රෑම් මිලියන) | 322.4 | 323.3 | 325.4 | 0.6 |
| සමස්ත තේ අලෙවිය - ඒකක මිල (රු./කි.ග්‍රෑ) | 370.58 | 360.53 | 392.03 | 8.7 |

## ඒකක මිල අනුව වර්ග කිරීම

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| උඩරට | 74.6 | 73.8 | 69.8 | (5.4) |
| මැදරට | 54.2 | 52.4 | 52.4 | 0.0 |
| පහතරට | 193.6 | 197.1 | 203.2 | 3.1 |

## අලෙවි ප්‍රමාණය වර්ග කිරීම (රු./කි.ග්‍රෑ)

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| උඩරට | 338.26 | 333.28 | 379.18 | 13.8 |
| මැදරට | 332.80 | 319.48 | 350.86 | 9.8 |
| පහතරට | 393.61 | 381.65 | 407.06 | 6.7 |

## තේ අපනයනය

| | 2010 | 2011 | 2012 | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| සමස්ත තේ අපනයන ප්‍රමාණය (කිලෝග්‍රෑම් මිලියන) | 305.7 | 303.2 | 306.0 | 0.9 |

ප්‍රභේද අනුව වර්ග කිරීම 2011 සිට වර්ගීකරණ පිළිවෙළ වෙනස් වී ඇති අතර, කළු, හරිත හා ක්ෂණික තේ වශයෙන් කාණ්ඩ තුනකට බෙදා ඇත.

| | 2010 | 2011* | 2012* | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| තොග තේ | 176.8 | කළු-298.8 | කළු -302.0 | 1.1 |
| තේ පැකට් | 89.8 | | | |
| තේ මලු | 25.7 | හරිත -2.5 | හරිත -2.4 | 4.0 |
| ක්ෂණික තේ | 1.8 | | | |
| හරිත තේ | 2.8 | ක්ෂණික -1.9 | ක්ෂණික -1.6 | 15.8 |
| වෙනත් තේ | 8.9 | | | |

| | 2010 | 2011* | 2012* | සැසඳීම 2011 Vs 2012 (%) |
|---|---|---|---|---|
| සමස්ත තේ අපනයන - අගය (රු බිලියන) | 151.2 | 151.8 | 169.0 | 11.3 |

# සංස්ථාපිත පසුබිම



# 1 සංස්ථාපිත පසුබිම



1975 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත මගින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාර් 01 වන දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය ස්ථාපිත කරන ලදී. මෙම පනත් යටතේ වන තේ මණ්ඩලයේ අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේහි සංවර්ධනය හා නියාමනය මෙන්ම ගෝලීය වශයෙන් ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ප්‍රවර්ධනය කිරීමයි. තේ මණ්ඩලය ස්ථාපිත කිරීමට පෙරාතුව, එය හඳුන්වනු ලැබුයේ තේ ප්‍රචාරණ මණ්ඩලය ලෙසින් වන අතර එය පෞද්ගලික අංශය මගින් මෙහෙයවන ලදී. 1976 වසරේදී, මෙම තේ ප්‍රචාරණ මණ්ඩලය පාර්ලිමේන්තුව විසින් අහෝසි කරන ලද අතර තේ කර්මාන්තය වෙත බලතල සහිතව දැනට හඳුන්වනු ලබන ශ්‍රී ලංකා තේ මණ්ඩලය බවට පරිවර්තනය කරන ලදී.

තේ කර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම් වන නිෂ්පාදනය, නව ප්‍රදේශවල වගා කිරීම හා තේ නැවත වගාව, පරණ තේ වතු ප්‍රතිසංස්කරණය කිරීම, තේ කර්මාන්තශාලා ස්ථාපිත කිරීම හා ඒවායේ මෙහෙයුම් කටයුතු ආදිය නියාමනය කිරීමේ වගකීම මෙම අධිකාරීය සතු වේ.

තේ විකුණුම් කරන අවස්ථාවේ තත්ත්ව ප්‍රමිතීන් නියාමනය කිරීම, තේ පූර්ව නැව්ගත කිරීම නියාමනය කිරීම, තේ තැරැව්කරුවන්ගේ, මිශ්‍රකරන්නන්ගේ හා අපනයනකරුවන්ගේ ගබඩා සංකීර්ණ පරීක්ෂාවට ලක්කිරීම හා සෞඛ්‍යාරක්ෂිත අකාරයෙන් තේ මිශ්‍ර කිරීම හා ගබඩා කිරීම පිළිබඳ උපදේශන සේවා ලබාදීම යන කටයුතු පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සැලසුම් සකස් කරමින් සිටිය. මීට අමතරව, තේ වතු කළමනාකරණය හා තේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයේ නිරත සියලුම ආයතන හා සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම හා මෙහෙයවීම තේ මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

ගෝලීය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වත්මන් නීති හා රෙගුලාසි වලට සමගාමීවන සේ කර්මාන්තයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. තේ කර්මාන්තයට සම්බන්ධ නියාමන කාර්යයන්, සංවර්ධන කාර්යයන් හා ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමට අදාළ සියලුම කාරණා සම්බන්ධයෙන් පාලන බලතල තේ මණ්ඩලය සතු වේ. විශේෂයෙන් ම, තේ නිෂ්පාදනය හා තත්ත්ව ආරක්ෂණය, දේශීය වශයෙන් බෙදාහැරීම හා තේ අපනයනය මෙන්ම විදේශීය ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් වන නියාමන කාර්යයන් තේ මණ්ඩලය විසින් අඛණ්ඩව සිදු කරනු ලබයි. සංවර්ධනාත්මක කාර්යයන් අතර, තේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම සඳහා සපයනු ලබන සහනාධාර සම්බන්ධයෙන් නියාමනය කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය හා තේ වල තත්ත්ව ආරක්ෂණය සම්බන්ධයෙන් අදාළ කාර්යයන් ක්‍රියාවට නැංවීම වේ. තේ අලෙවිකරණ කටයුතු හා ප්‍රවර්ධනාත්මක ක්‍රියාකාරකම් නියාමනය කිරිම, තේ පිළිබඳ සංඛ්‍යාලේඛන එකතු කිරීම සහ අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් වගකීම දැරීම ප්‍රවර්ධන කාර්යයන් අතර අන්තර්ගත වේ.

# 01 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ව්‍යුහය

සංස්ථාපිත පසුබිම

## 1.1. ප්‍රධාන ලේකම් කාර්යාලය

තේ මණ්ඩලයේ පරිපාලන හා මූල්‍ය කටයුතු හා තේ කර්මාන්තයේ නියාමනය, සංවර්ධනය හා ප්‍රවර්ධනය සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් සමස්ත අධීක්ෂණයට ලක් කිරීම ප්‍රධාන ලේකම් කාර්යාලයේ වගකීම වේ. සහය සේවාවන් ලෙස කළමනාකරණ කාර්යයන් වන පරිපාලන, මූල්‍ය, මෙහෙයුම්, නියාමන, ප්‍රවර්ධන, සංවර්ධන, සංඛ්‍යාන, අභ්‍යන්තර විගණන, ලේකම් කාර්යාලයීය, රස පිරික්සීමේ හා විශ්ලේෂණ රසායනාගාරය, තොරතුරු තාක්ෂණය හා පුස්තකාලය ආදී විවිධ අංශ වල කටයුතු මෙමගින් සිදු කරනු ලබයි

### 1.1.1. පරිපාලන අංශය

සහකාර අධ්‍යක්ෂක ජෙනරාල් (පාලන) යටතේ වන පරිපාලන අංශය සමස්ත මානව සම්පත් කළමනාකරණ හා සංවර්ධන, ප්‍රසම්පාදන හා ගබඩා, නඩත්තු කිරීම්, යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රවාහන යන කාර්යයන් සඳහා වගකීම් දරනු ලබයි.

### 1.1.2. මූල්‍ය අංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සමස්ත මූල්‍ය පාලනය හා කළමනාකරණය කෙරෙහි මූල්‍ය අංශය වගකිව යුතු වේ. මූල්‍ය අංශයේ අනෙකුත් ප්‍රධාන කාර්යයන් වනුයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා නිර්දේශ ලබාදීම, වාර්ෂික අය වැය, වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, මාසික ගිණුම් හා වාරික වාර්තා සකස් කිරීම, භාණ්ඩ ලේඛන නඩත්තු කිරීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම හා විගණකාධිපති වෙත වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම වේ.

## 1.2. තේ කොමසාරිස් අංශය

තේ වගා කිරීම, තේ නිෂ්පාදනය හා ගුණාත්මක සංවර්ධනය සම්බන්ධයෙන් වන නියාමන කටයුතුවලට අදාළ සියලුම කාර්යයන් මෙම අංශය මගින් සිදු කරනු ලබයි. ප්‍රාදේශීය කාර්යාල 7 කින් සමන්විත ජාලයක් ඔස්සේ මෙම අංශය ක්‍රියා කරනු ලබයි. තේ කොමසාරිස් අංශය යටතේ පවතින තේ අපනයන ශාඛාව සකසන ලද තේ අපහරණය කිරීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, තේ අපනයන හා ආනයනය කිරීම සම්බන්ධයෙන් වන සියලුම කාරණා පිළිබඳව වගකීම් දරයි.

# 1.3. තේ ප්‍රවර්ධන අංශය

ශ්‍රී ලංකා තේ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීමට සම්බන්ධ සියලුම කරුණු සඳහා විදේශීය කාර්යාල මගින් සහාය සලසනු ලබයි. එමගින් කලින් කලට වෙළඳපොළ බුද්ධි තොරතුරු සපයනු ලබන අතර එය කර්මාන්තයේ පවතින ඉල්ලුම මත පදනම් වේ. දේශීය මෙන්ම විදේශීය පාරිභෝගිකයින් සඳහා ඵලදායී වන තේ විකුණුම් කවුළුවක් ක්‍රියාත්මක වෙමින් පවතී.

තේ ප්‍රවර්ධන අංශය යටතේ පවතින තේ රස පිරික්සීමේ ඒකකය, ප්‍රවීන තේ රස පරීක්ෂකයින්ගෙන් සමන්විත ස්වාධීන මණ්ඩලයක් ඔස්සේ තේ වල අවම තත්ත්ව ප්‍රමිතීන්, සිංහ ලාංඡනය පිළිබඳ යොමුගත ප්‍රමිතීන් පරීක්ෂාවට ලක් කිරීම හා වෙනත් ප්‍රභවයන්ගෙන් යුත් තේ පරීක්ෂාවට ලක් කිරීම සඳහා වගකීම් දරනු ලබයි. එමෙන්ම, මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කිරීම, ආහාරපාන පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම, සන්නම් නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රම හා විදේශ රටවල ස්ථානගත ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට අනුයුක්ත විදේශ තේ ප්‍රවර්ධන නිලධාරීන්ගේ හා වාණිජ නිලධාරීන්ගේ සහාය ඇතිව පොදු ප්‍රචාරණ කටයුතු ද සිදු කරනු ලබයි. ජාත්‍යන්තර තේ මණ්ඩල හා තේ සංගම් සමගත්, **(FAO)**තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම ආදිය සමගත් මෙම ඒකකය සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරනු ලබයි.

# 1.4. විශ්ලේෂණ රසායනාගාරය

තේ වල ගුණාත්මක බව පවත්වාගෙන යාම සඳහා අධි තාක්ෂණ උපකරණ උපයෝගී කර ගනිමින් තේ පිළිබඳ රසායනික ක්ෂුද්‍ර ජීවී හා කෘමිනාශක තත්ත්ව පරාමිතීන් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම හා තත්ත්ව සහතික නිකුත් කිරීම මෙම අංශයේ වගකීම වේ. ඒ අනුව සෑම අංශයක් ම පාහේ තත්ත්ව සහතික කරණය කෙරෙහි දායකත්වය සපයා ඇති අතර එමගින් "සිලෝන් ටී" වල ප්‍රතිරූපය ආරක්ෂා කර ගැනීම සඳහා සහාය වී ඇත.

# කර්මාන්තයේ පැතිකඩ - 2012













# කර්මාන්තයේ පැතිකඩ - 2012




## 2. ශ්‍රී ලංකා තේ දර්ශනය

සතුටුදායක කාලගුණ තත්ත්වයට අමතරව නිදහස් යෙදවුම් හා ක්ෂේත්‍රයන්හි පවත්වාගෙන ගිය යහපත් කෘෂිකාර්මික භාවිතයන් හේතුකොට ගෙන වර්ෂය තුළ තේ නිෂ්පාදනය ඉහළ යන ලදී. පොහොර සහනාධාරය ලබාදීම අඛණ්ඩව පවත්වාගෙන යාම ද වර්ෂයේ මෙම ජයග්‍රහණය කෙරෙහි දායක විය. ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය කි.ග්‍රෑ.මි. 328.4 ක් බවට පත් වූයේ 2011 වර්ෂයේ නිෂ්පාදනය වන කි.ග්‍රෑ.මි. 327.5 ට සාපේක්ෂව 0.3% ක ඉහළ යාමක් පෙන්නුම් කරමිනි. මේ වන විට, පරිණත (අස්වනු නෙළීම, ඵල දැරීම) තේ ප්‍රමාණය හෙක්ටයාරවලින් 197,025 කි. 2012 වර්ෂය තුළ කන්නයක් සඳහා තේ නිෂ්පාදනය හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 1662 සිට හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 1667 දක්වා (පරිණත තේ ප්‍රමාණය මත පදනම්ව) ඉහළ ගොස් ඇත. පෙර වර්ෂය හා සසඳන විට රු. 31.50 ක ඉහළ යාමක් දක්වමින් වසර අවසානයේ රු. 392.03 ක කොළඹ තේ වෙන්දේසි මිල සාමාන්‍යයක් රඳවා ගනිමින් 2012 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා රුපියලේ ක්ෂයවීම තේ නිෂ්පාදකයින් හා අපනයනකරුවන් වෙත සහාය පළ කරන ලදී.

## 2.1. තේ ඉඩම්වල ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ වත්මන් ඇස්තමේන්තුගත ලියාපදිංචි කළ තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 221,969[*1] ක් ලෙස සංශෝධනය කර ඇත. තේ ඉඩම්වල කළමනාකරණ නිර්ණායකයන් සමඟ තේ ඉඩම්වල බෙදීයාම පෞද්ගලික (59) %, සංස්ථාපිත (37) % හා රාජ්‍ය අංශය (4) % යනුවෙනි. තේ වගාව දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක් පුරා විශේෂයෙන්ම තෙත් කලාපීය ප්‍රදේශයන් තුළ ව්‍යාප්තව ඇත. තේ වගාව සඳහා පවත්නා යෝග්‍ය දේශගුණික තත්ත්වය හේතුකොටගෙන මෙම ප්‍රදේශ වටා ව්‍යාප්තව ඇත. තේ වගා ප්‍රදේශවල පිහිටීම අනුව වර්ගීකරණය 2.1 වගුව මගින් දක්වා ඇත. තේ ඉඩම් වල පිහිටීම මත පදනම්ව, උඩරට, මැදරට හා පහතරට යනුවෙන් තේ වගා ප්‍රදේශ ඛාණ්ඩ තුනකට බෙදා දැක්වේ.

රූපසටහන 2.1: තේ ඉඩම්වල හිමිකාරීත්වය




2.1 වගුව : පිහිටීම අනුව ලියාපදිංචි කළ තේ වගා ප්‍රදේශ

| පිහිටීම් | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| උඩරට | 41137 | 18.5 |
| මැදරට | 71018 | 32.0 |
| පහතරට | 109814 | 49.5 |
| එකතුව | 221969 | 100.0 |

1. කුඩා තේ වතු හිමියන්ගේ සංගණනය - 2005 කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

02

කර්මාන්තයේ පැතිකඩ

# 2.2.ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය

2012 වර්ෂයේ පළමු භාගය තුළ තේ වගා කරන ප්‍රදේශවල පැවති යෝග්‍ය කාලගුණික තත්ත්වයන් හේතුකොට ගෙන, වර්ෂය සඳහා තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන 328.4 ක් දක්වා ඉහළ යන ලදී. 2011 වසරේ වාර්තාගත කි.ග්‍රෑ. මිලියන 327.5 ට සාපේක්ෂව 2012 වර්ෂය සඳහා වන නිෂ්පාදනය කැපී පෙනෙන ඉහළ යාමක් විය.

ශ්‍රී ලංකාව විවිධ පිහිටීම් අනුව තේ වගා කරනු ලබයි. ඒ අතුරින් වැඩි ප්‍රමාණයක් පහතරට වගා කරන ලද තේ වේ. මේවා මුහුදු මට්ටමේ සිට මීටර් 600 දක්වා පරාසය තුළ පිහිටීම්වල වගා කෙරෙන අතර අනිවාර්යයෙන්ම ප්‍රනීත රසයක් හා පැහැයකින් යුතු වේ.

ඒ ආකාරයට, ඉහළ ආදායම් මට්ටම් හා ඉල්ලුම හේතු කොට ගෙන ඇති වූ ඉහළ යාම මගින් පහතරට තේ ප්‍රමාණය මෑත කාලයේදී ඉහළ ගොස් ඇත. මේ අතර, උඩරට තේ මීටර් 1200 ට ඉහළ උස් ප්‍රදේශවල වගා කරනු ලැබේ. එමෙන්ම, ඒවාටම ආවේණික රසයකින් හා සුවඳකින් යුතු ඉහළ තත්ත්වයේ තේ ලෙස සැලකේ.

පහත් බිම් මට්ටම් වල වගා කෙරෙන තේ, ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (62%) ට අධික ප්‍රමාණයක් සඳහා දායකත්වය සපයන අතර උඩරට හා මැදරට තේ වල දායකත්වය පිළිවෙළින් 22% හා 16% වේ.


**2.2 වගුව : පිහිටීම අනුව සමස්ත තේ නිෂ්පාදනය**

| පිහිටීම | නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|
| උඩරට | 73,642,586.8 |
| මැදරට | 52,633,128.7 |
| පහතරට | 202,121,318.3 |
| එකතුව | 328,397,033.7 |

## 2.2.1.මාසික තේ නිෂ්පාදනය

ප්‍රස්ථාරය මගින් පෙන්නුම් කරනුයේ 2012 වසරේ සමස්ත මාසික තේ නිෂ්පාදනය වේ. 2012 වසරේ පෙබරවාරි සිට ජූලි දක්වා සමස්ත මාසික තේ නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව තරමක පහළ යාමක් පෙන්නුම් කර ඇත. එහෙත්, වසරේ අවසන් භාගය තුළ එය බොහෝ දුරට ආවරණය කරඇත. 2.2 වගුව මගින් පෙන්නුම් කරනුයේ අවසන් වර්ෂ දෙක සඳහා පිහිටීම අනුව මාසික තේ නිෂ්පාදනය වේ.

**වගුව 2.2: පිහිටීම අනුව මාසික තේ නිෂ්පාදනය**



# 2.2.2.කෘෂි දේශගුණික දිස්ත්‍රික් අනුව විශ්ලේෂණය



2.3 වගුව මගින් සමාලෝචනයට බඳුන්වන වර්ෂයේ විවිධ කෘෂි දේශගුණික දිස්ත්‍රික්කයන්හි නිෂ්පාදනය, පෙර වසරේ සංසන්දනාත්මක දත්ත සමග ඉදිරිපත් කෙරේ.

පිළිවෙලින් කි.ග්‍රෑ. 57 ක් සහ කි.ග්‍රෑ. 52.1 ක් නිෂ්පාදනය කරමින් රත්නපුර හා ගාල්ල කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අතර වැඩිම නිෂ්පාදනයක් ඇති දිස්ත්‍රික්ක වශයෙන් වාර්තා කර තිබේ. පෙර වර්ෂය හා සංසන්දනය කරන විට 2012 වර්ෂයේ දී බටහිර උප දිස්ත්‍රික්කයෙහි සියලුම කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක නැගීම් සහිත තේ නිෂ්පාදන ප්‍රවනතාවක් පෙන්නුම් කරන බව දැකිය හැකිය.

**වගුව 2.3: කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය**

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | | වෙනස | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | Qty. (MT) | % |
| A. නුවරඑළිය | 3,564 | 4,663 | (1,099) | -24% |
| B. බටහිර | | | | |
| 1. රඹොඩ | 3,139 | 2,466 | 673 | 27% |
| 2. පුණ්ඩළුඔය | 2,498 | 3,370 | (872) | -26% |
| 3. ආගරපතන | 6,834 | 8,118 | (1,284) | -16% |
| 4. නානුඔය/ලිඳුල/ තලවකැලේ | 1,820 | 10,445 | 1,375 | 13% |
| 5. පතන/ කොටගල | 6,232 | 5,621 | 611 | 11% |
| 6. හැටන්/ දික්ඔය | 8,595 | 9,115 | (520) | -6% |
| 7. බොගවන්තලාව | 5,410 | 8,158 | (2,748) | -34% |
| 8. අප්කොට්/ මස්කෙලිය | 8,541 | 8,205 | 336 | 4% |
| මුළු බටහිර | 53,069 | 55,497 | (2,428) | -4% |
| C. මධ්‍යම | | | | |
| 1. වටවල/ ගිනිගත්හේන/ නෝටන් බ්‍රිජ් | 2,837 | 2,133 | 704 | 33% |
| 2. පුස්සැල්ලාව/ හේවාහැට | 6,548 | 8,305 | (1,757) | -21% |
| 3. කොත්මලේ | 2,201 | 915 | 1,286 | 141% |
| 4. ගම්පොල/ නාවලපිටිය/ දොළොස්බාගෙ | 14,523 | 14,397 | 126 | 1% |
| 5. නිලම්බේ/ හන්තාන/ ගලහ | 1,255 | 1,798 | (543) | -30% |
| 6. කඩුගන්නාව | 7,796 | 6,027 | 1,769 | 29% |
| 7. මඩුල්කැලේ/ නකල්ස්/ රංගල | 5,458 | 4,348 | 1,110 | 26% |
| 8. හුන්නස්ගිරිය/ නකල්ස්/ යක්දෙස්ස | 994 | 2,781 | (1,787) | -64% |
| 9. බලන්ගොඩ/ රක්වාන | 3,569 | 9,534 | (5,965) | -63% |
| මුළු මධ්‍යම | 45,180 | 50,238 | (5,058) | -10% |
| D. උඩ පුස්සැල්ලාව | | | | |
| 1. උඩ පුස්සැල්ලාව/ හල්ගුන්ඔය | 4,870 | 4,797 | 73 | 2% |
| 2. මතුරට | 2,827 | 1,784 | 1,043 | 58% |
| මුළු උඩ පුස්සැල්ලාව | 7,698 | 6,581 | 1,117 | 17% |

02

කර්මාන්තයේ පැතිකඩ

**වගුව 2.3: කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය**

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | | වෙනස | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | Qty. (MT) | % |
| **E. ඌව** | | | | |
| 1. කොස්ලන්ද/ හල්දුම්මුල්ල | 314 | 616 | (302) | -49% |
| 2. හපුතලේ | 3,771 | 4,822 | (1,051) | -22% |
| 3. බන්ඩාරවෙල/ පූනගල්ල | 2,953 | 3,264 | (311) | -10% |
| 4. මල්වත්ත/ වැලිමඩ | 3,197 | 3,362 | (165) | -5% |
| 5. දෙමෝදර/ හාලි ඇල/ බදුල්ල | 7,767 | 8,979 | (1,212) | -14% |
| 6. ඇල්ල/ නමුණුකුල | 1,180 | 1,419 | (239) | -17% |
| 7. පස්සර/ ලුණුගල්ල | 4,004 | 3,696 | 308 | 8% |
| 8. මඩොල්සීම | 2,368 | 2,339 | 29 | 1% |
| මුළු ඌව | 25,554 | 28,497 | (2,943) | -10% |
| **F. පහත් බිම් වගාවන්** | | | | |
| 1. දෙනියාය | 16,545 | 16,525 | 20 | 0% |
| 2. ගාල්ල | 44,393 | 52,134 | (7,741) | -15% |
| 3. කළුතර | 21,553 | 18,086 | 3,467 | 19% |
| 4. කෑගල්ල | 10,817 | 4,848 | 5,969 | 123% |
| 5. කැළණි වැලි | 829 | 6,517 | (5,688) | -87% |
| 6. මහනුවර/ මාතලේ/ කුරුණෑගල | 3,572 | 2,456 | 1,116 | 45% |
| **F. පහත් බිම් වගාවන්** | | | | |
| 7. මාතර | 4,460 | 17,073 | (12,613) | -74% |
| 8. මොරවක | 25,488 | 7,922 | 17,566 | 222% |
| 9. රත්නපුර | 57,042 | 52,387 | 4,655 | 9% |
| 10. බලන්ගොඩ | 8,633 | 4,109 | 4,524 | 110% |
| මුළු පහත් බිම් වගාවන් | 193,333 | 182,056 | 11,277 | 6% |
| මුළු ගණන | 328,397 | 327,532 | 865 | 0.26% |

*Source : SLTB Production Reports*

## 2.2.3.දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ විවිධ පරිපාලන දිස්ත්‍රික්කවල තේ නිෂ්පාදනය හා සමාලෝචනයට බඳුන්වන වර්ෂය තුළ එහි පිහිටීම සවිස්තරාත්මක 2.4 වගුවෙන් නියෝජනය වේ. ප්‍රධාන උඩරට තේ නිෂ්පාදනය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති බවත්, පසුගිය වර්ෂය සඳහා ඉහළතම පහතරට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති බවක් දැකිය හැකිය.

2.4 වගුව : දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ. වලින්)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 14,043,682 | 12,785,277 | 0 | 26,828,959 |
| කොළඹ | 0 | 0 | 675,457 | 675,457 |
| ගාල්ල | 0 | 0 | 48,793,613 | 48,793,613 |
| හම්බන්තොට | 0 | 0 | 284,332 | 284,332 |
| කළුතර | 0 | 0 | 17,357,166 | 17,357,166 |
| නුවර | 909,246 | 21,865,441 | 10,297,619 | 33,072,306 |
| කෑගල්ල | 0 | 804,428 | 11,216,887 | 12,021,315 |
| මාතලේ | 0 | 1,437,987 | 522,932 | 1,960,919 |
| මාතර | 0 | 232,304 | 44,289,223 | 44,521,527 |
| නුවරඑළිය | 57,760,400 | 13,117,544 | 828,544 | 71,706,489 |
| රත්නපුර | 929,258 | 2,390,148 | 67,855,546 | 71,174,952 |
| එකතුව | 73,642,587 | 52,633,129 | 202,121,318 | 328,397,034 |

## 2.2.3.1. තේ දළු එකතු කිරීමේ ක්‍රමය අනුව නිෂ්පාදන විශ්ලේෂණය

කර්මාන්තශාලාවක සමස්ත තේ නිෂ්පාදනය තුළ සිය වතුවලින් හෝ වෙනත් වතු යායන්ගෙන් එකතු කරගනු ලබන තේ කොළ හෝ වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගන්නා තේ දළු අන්තර්ගත වේ. පරිපාලන දිස්ත්‍රික්ක තුළ ඒ ඒ තේ දළු එකතු කිරීමේ ක්‍රමය මගින් සකසනු ලබන තේ වල සමස්ත නිෂ්පාදනය පහත වගුව මගින් දැක්වේ.

2.5 වගුව : දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

| පරිපාලන දිස්ත්‍රික්කය | සිය වතුයායේ දළු | වෙනත් වතුයායන්ගේ දළු | මිලදී ගත් දළු | සමස්ත නිෂ්පාදනය |
|---|---|---|---|---|
| බදුල්ල | 11,200,555.20 | 6,489,694.50 | 9,138,709.50 | 26,828,959.20 |
| ගාල්ල | 1,083,375.00 | 479,487.50 | 49,955,044.00 | 51,517,906.50 |
| කොළඹ | - | - | 675,457.00 | 675,457.00 |
| හම්බන්තොට | - | - | 284,332.00 | 284,332.00 |
| කළුතර | 674,164.00 | 55,931.00 | 15,833,878.85 | 16,563,973.85 |
| නුවර | 5,875,218.50 | 2,090,804.00 | 24,782,280.30 | 32,748,302.80 |
| කෑගල්ල | 1,119,618.00 | 487,017.00 | 7,431,402.90 | 9,038,037.90 |
| මාතලේ | 646,261.00 | 195,014.00 | 1,877,323.00 | 2,718,598.00 |
| නුවර එළිය | 49,269,178.96 | 10,621,971.35 | 12,431,046.50 | 72,322,196.81 |
| රත්නපුර | 6,354,008.50 | 903,049.50 | 66,125,294.15 | 73,382,352.15 |
| සමස්ත නිෂ්පාදනය | 78,764,440.66 | 21,822,086.85 | 227,810,506.20 | 328,397,033.71 |

# 02

## 2.2.4. සැකසුම් ක්‍රමය අනුව නිෂ්පාදන විශ්ලේෂණය

කර්මාන්තයේ පැතිකඩ

### 2.2.4.1. කළු තේ හා හරිත තේ නිෂ්පාදනය

2012 වර්ෂයේ දී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය 0.03% ක (කි.ග්‍රෑ 101404) වර්ධනයක් අත්පත් කර ගෙන ඇති අතර 2011 වසර හා සසඳන විට සී.ටී.සී. තේ නිෂ්පාදනය 3.2% ක ඉහළයාමක් පෙන්නුම් කර ඇත. සමාලෝචනයට බඳුන්වන වර්ෂය තුළ පහත වගුවෙන් දැක්වෙන පරිදි කි.ග්‍රෑ. මිලියන 0.8 ක් (0.25% ක) කැපී පෙනෙන ඉහළ යාමක් කළු තේ නිෂ්පාදනයෙහි වාර්තා වී ඇති අතර හරිත තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. 43.858 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. එය පසුගිය වසර හා සසඳන විට 1.5% ක ඉහළ යාමකි.




2.6 වගුව: සැකසුම් ක්‍රමය අනුව තේ නිෂ්පාදනය

| සැකසුම් ක්‍රමය | 2011 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
| සාම්ප්‍රදායික | 301,959,681 | 302,061,086 | 101,404 | 0.03% |
| සී.ටී.සී. | 22,583,966 | 23,303,833 | 719,867 | 3.19% |
| හරිත | 2,988,256 | 3,032,115 | 43,858 | 1.47% |
| සමස්තය | 327,531,903 | 328,397,034 | 865,130 | 0.26% |

### 2.2.4.2. ක්ෂණික තේ හා කාබනික තේ නිෂ්පාදනය

2011 වර්ෂය හා සසඳන විට ක්ෂණික තේ හා කාබනික තේ දෙවර්ගයේම නිෂ්පාදනය පහත වැටීමක් පෙන්නුම් කරයි. 2012 වර්ෂය සඳහා ක්ෂණික තේ වල කි.ග්‍රෑ. මිලියන 0.29 ක පහළයාමක් පෙන්නුම් කළ අතර කාබනික තේ ප්‍රමාණය කි.ග්‍රෑ. මිලියන 0.08 ක බිඳ වැටීමක් පෙන්නුම් කර ඇත.

## 2.2.5. සැකසූ තේ නිෂ්පාදන පිරිවැය


02

කර්මාන්තයේ පැතිකඩ

ඵලදායීතාව හා නිෂ්පාදන පිරිවැය යන්න එකිනෙකට සම්බන්ධ කරුණු වේ. ඉහළ යන නිෂ්පාදන පිරිවැය වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව දක්නට ලැබෙන ගැටලුකාරී සංසිද්ධියකි. තේ නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා විශාල ශ්‍රම ප්‍රමාණයක් අවශ්‍යවීම හේතුවෙන් තේ වල ශ්‍රම ඵලදායීතාවය හා නිෂ්පාදන පිරිවැය අතර දැඩි සම්බන්ධයක් පවතී. තේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවල් අතර ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමකට ළඟා වී තිබේ. ගෝලීය තේ වෙළඳපළ තුළ අප රටේ තරඟකාරී තත්ත්වය කෙරෙහි මෙමගින් බලපෑම් එල්ල වී ඇත.

පසුගිය දශකය තුළ සැකසූ තේ කිලෝ ග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය වේගයෙන් ඉහළ ගොස් ඇත. විශේෂයෙන්ම ශ්‍රම පිරිවැය ඉහළ යාම හා යෙදවුම්වල ඉහළ මිල හේතුකොට ගෙන නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇත. 2011/ 12 වර්ෂය සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලද දත්තවලට අනුව වාර්ෂික තේ නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 340.89 කි. 2010/ 11 හා සසඳන විට එය 10% ක ඉහළ යාමකි.

2.3 වගුව : සැකසූ තේ කිලෝග්‍රෑමයක් සඳහා සමස්ත පිරිවැය



# 02

කර්මාන්තයේ පැතිකඩ

## 2.3.ශ්‍රී ලංකාවේ තේ අලෙවිය

2011 වර්ෂය හා සංසන්දනය කරන විට 2012 වසරේ ශ්‍රී ලංකා තේ කර්මාන්තය අති විශාල සාමාන්‍ය මිලක් වාර්තා කරන ලදී. 2012 වර්ෂයේ දී රාජ්‍ය, පෞද්ගලික හා සෘජු විකුණුම් ද අන්තර්ගතව කි.ග්‍රෑ. රුපියල් 392.03 ක අගයකට කි.ග්‍රෑ. මිලියන 325.4 ක තේ ප්‍රමාණයට එරෙහිව කි.ග්‍රෑ. රු. 360.53 ක සාමාන්‍ය අගයකට කි.ග්‍රෑ. මිලියන 323.3 ක තේ ප්‍රමාණයක් අලෙවි කරන ලදී. පසුගිය වසර හා සංසන්දනය කරන විට ඒකකයක ඉහළ යාම රු. 31.50 (8.7%) ක් පමණ වන අතර එය කි.ග්‍රෑමයක් සඳහා රු. 360.53 සිට රු. 392.03 දක්වා වූ ඉහළ යාමකි.

### 2.3.1.අලෙවිකරණ ක්‍රමය

කර්මාන්තශාලාවල නිෂ්පාදනය කරනු ලබන තේ අලෙවිකිරීමේ ප්‍රධානතම ක්‍රමය වන්නේ ප්‍රසිද්ධ වෙන්දේසියයි. 2012 වර්ෂයේ දී කොළඹ තේ වෙන්දේසිය යටතේ තේ කි.ග්‍රෑ. මිලියන 320.0 ක් අලෙවි කර ඇත. පෞද්ගලික විකුණුම් ප්‍රමාණය කි.ග්‍රෑ. මිලියන 3.7 ක් (1.1%) වන අතර ඉතිරිය වන 0.5% ක ප්‍රමාණය විකුණා ඇත්තේ සෘජු විකුණුම් ආකාරයෙනි.

### 2.3.2.කොළඹ තේ වෙන්දේසිය

2012 වර්ෂයේ දී, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මගින් පවත්වන ලද තේ වෙන්දේසි ගණන 50 ක් වන අතර ප්‍රසිද්ධ හා පෞද්ගලික විකුණුම් සඳහා කි.ග්‍රෑ. මිලියන 3.3 (1.0%) ක සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා කරන ලදී. කෙසේවෙතත්, 2012 වර්ෂය තුළ කොළඹ තේ වෙන්දේසිය මගින් උකහා ගන්නා ලද සාමාන්‍ය මිල සංසන්දනාත්මකව ඉතා ඉහළ අගයක් වාර්තා කරන අතර, කි.ග්‍රෑමයකට රු. 359.89 සිට රු. 391.64 දක්වා වාර්ෂික ඉහළ යාමක් කරා යෑමට එය හේතු සාදක වී ඇත.

### 2.3.3.වගාබිම් පිහිටීම අනුව අලෙවිය

තේ වගාබිම් පිහිටීම අනුව තේ විකුණුම් විශ්ලේෂණය 2.7 වගුවෙන් දැක්වේ. 2012 වර්ෂයේ දී ධනාත්මක පිරිවැටුමකට මග පාදමින් පසුගිය වසර හා සංසන්දනය කරන විට සියලුම වගාබිම් පිහිටීම්වල ඒකක මිල ගණන ඉහළ ගොස් ඇත.

**2.7 වගුව : වගාබිම් පිහිටීම අනුව තේ විකුණුම්**

| වගාබිම් පිහිටීම | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | | | | ඒකක මිල (කි.ග්‍රෑ./ රු.) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2011 | වෙනත් | % | 2012 | 2011 | වෙනත් | % |
| උඩරට | 69.8 | 73.8 | (4.00) | (5.42) | 379.18 | 333.28 | 45.90 | 13.77 |
| මැදරට | 52.4 | 52.4 | 0.00 | 0.00 | 350.86 | 319.48 | 31.38 | 9.82 |
| පහතරට | 203.2 | 197.1 | 6.10 | 3.09 | 407.06 | 381.65 | 25.41 | 6.66 |
| සමස්ත විකුණුම් | 325.4 | 323.3 | 2.10 | 0.65 | 392.03 | 360.53 | 31.50 | 8.74 |

ප්‍රභවය: ශ්‍රී ලංකා තේ මණ්ඩල විකුණුම් වාර්තා

02

කර්මාන්තයේ පැතිකඩ

# 2.4.තේ අපනයනය

2012 වසරේ ශ්‍රී ලංකාවේ තේ අපනයනය කි.ග්‍රෑ. මිලියන 319.9 ක් වූ අතර එමගින් රු. බිලියන 180.4 ක අපනයන ඉපයීම අත්පත් කරගත හැකි විය. කි.ග්‍රෑ. එකක් සඳහා නැව තෙක් නොමිලේ සාමාන්‍ය ඒකක මිල වූයේ රු. 563.94 කි. තේ අපනයන මගින් රු. බිලියන 150 කට වඩා වැඩි අපනයන ඉපයීම් අත්පත් කර ගැනීමට හැකි වූ තෙවන අනුගාමී වසර වූයේ මෙයයි.

අනර්ඝතම තත්ත්වයේ තේ නිෂ්පාදකයකු ලෙස තවදුරටත් සලකනු ලැබුවද, ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ දායකත්වය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. තේ වෙළඳපොළේ අනෙකුත් තරගකාරී රටවලින් එල්ලවන අතිශයින් තීරණාත්මක තරගය මගින් ශ්‍රී ලාංකිකයන් සතුව පැවති තරගකාරී ස්වභාවයට අයහපත් බලපෑම් සිදු වී තිබේ. තේ සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින ඉහළ නිෂ්පාදන පිරිවැය හා අඩු අස්වැන්න මගින් මෙම තත්ත්වය තවදුරටත් වැඩි දියුණු වී තිබෙන අතර ගෝලීය පාරිභෝගිකයන්ගේ ක්ෂණිකව වෙනස් වන රුචිකත්වය පිළිබඳව අවධානය යොමු නොකර අගය එකතු කළ තේ වලට සාපේක්ෂව සාම්ප්‍රදායික (ඕර්තොඩොක්ස්) තේ නිෂ්පාදන වැඩි දියුණු කිරීම පිළිබඳව පමණක් ශ්‍රී ලංකාව අඛණ්ඩව අවධානය යොමු කිරීම මගින් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ දායකත්වය තවදුරටත් අඩුවිය හැකිය.

නව්‍ය HS කේතවලට අනුව කාණ්ඩවලට වෙන් කරන ලද තේ අපනයන මෙම අංශය යටතේ ලැයිස්තුගත කර ඇත. තොග තේ, විවිධ පරාසවල තේ පැකට් සහ කළු තේ, හරිත තේ සහ ක්ෂණික තේ සකසන යන්ත්‍ර යටතේ වර්ගීකරණය කරන ලද තේ මළු ඇසුරුම්වලින් මෙය සමන්විත වේ.


## 2.4.1.ප්‍රභේදවලට අනුව තේ අපනයන විශ්ලේෂණය කිරීම

තේ පිළිබඳව පවතින රුචිකත්වය සාමාන්‍යයෙන් තේ පත්‍රවල සම්භවය සහ ගුණාත්මකභාවය මත රඳා පවතින අතර සැලකිය යුතු මට්ටමේ වෙනස්වීම්වලට ද එය භාජනය වේ. උදාහරණයක් වශයෙන් මැද පෙරදිග රටවල් හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඬුල්ලට (CIS) අයත් රටවල ජනතාව පහතරට වගා කරන, සාම්ප්‍රදායික, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන කහට රසය වැඩි තේ තෝරා ගැනීමට වැඩි කැමැත්තක් දක්වති. 2012 වසරේදී සමුච්චිත තේ අපනයනය (කළු, හරිත සහ ක්ෂණික තේ ඇසුරුම් පමණි) 0.7% ක් වූ අතර එම පරිමාව 2011 වසරට සාපේක්ෂව පහත වැටී තිබුණි. එමගින් උපයා ගන්නා ලද ආදායම 9.6% ක් වූ අතර එය 2011 වසරට සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි. තවද, නැව තෙක් වියදම් සහිත ඒකක මිල සාධනීය වෙනසකට භාජනය වෙමින් කි.ග්‍රෑ. එකක් සඳහා රු. 53.22 ක් බවට පත් වී තිබුණි. කෙසේ වුවද 2012 වසරේදී සමුච්චිත තේ අපනයන ඉපයීම ඇමරිකානු ඩොලර් මිලියන 1,414.0 ක් වූ අතර 2011 වසරේ වාර්තා වූ ඇමරිකානු ඩොලර් මිලියන 1,488.4 කට සාපේක්ෂව එය 5.0% ක අඩුවීමකි.

# 02

කර්මාන්තයේ පැතිකඩ

**වගුව 2.4: මාසික තේ අපනයන - පරිමාව හා ඒකක වටිනාකම**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දත්ත උපයෝගී කර ගනිමින් සම්පාදනය කරනු ලැබීය.

## 2.4.2. වාර්ෂික තේ අපනයන - 2012

2012 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ප්‍රවර්ගය අනුව තේ අපනයන 2.8 වගුවේ දක්වා ඇත.

**2.8 වගුව : වාර්ෂික තේ අපනයන - 2012**

| ප්‍රවර්ගය අපනයන | 2012 දෙසැම්බර් වන විට | | |
|---|---|---|---|
| **කළු තේ ඇසුරුම් කිරීම** | **ප්‍රමාණය (කි.ග්‍රෑ.)** | **වටිනාකම (රු.)** | **නැ.තෙ.නො. (රු.කි.ග්‍රෑ.) (කි.ග්‍රෑ.)** |
| තේ මළු | 20,602,905 | 22,333,698,412 | 1,084.01 |
| තේ තොග | 129,493,216 | 64,136,650,791 | 495.29 |
| තේ පැකට් (ග්‍රෑම් 4- කි.ග්‍රෑ. 1) | 94,027,545 | 50,616,750,569 | 538.32 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 1- කි.ග්‍රෑ. 3) | 865,140 | 519,428,202 | 600.40 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 3 - කි.ග්‍රෑ. 5) | 17,864,920 | 8,653,095,435 | 484.36 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 5- කි.ග්‍රෑ. 10) | 39,193,702 | 18,667,841,443 | 476.30 |
| කළු තේ - මුළු | 302,047,428 | 164,927,464,852 | 546.03 |
| **හරිත තේ ඇසුරුම් කිරීම** | | | |
| තේ මළු | 748,066.00 | 1,304,941,954 | 1,744.42 |
| තේ තොග | 758,679.00 | 381,510,319 | 502.86 |
| තේ පැකට් (ග්‍රෑම් 4- කි.ග්‍රෑ. 1) | 850,695.00 | 981,606,987 | 1,153.89 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 1- කි.ග්‍රෑ. 3) | 8,297.00 | 7,825,228 | 943.14 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 3 - කි.ග්‍රෑ. 5) | 59,487.00 | 22,702,206 | 381.63 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 5- කි.ග්‍රෑ. 10) | 15,352.00 | 16,466,088 | 1,072.57 |
| හරිත තේ - මුළු | 2,440,576 | 2,715,052,782 | 1,112.46 |
| | | | |
| ක්ෂණික තේ - මුළු | 1,551,562.00 | 1,372,361,880 | 884.50 |
| මුළු තේ අපනයන | 306,039,566.00 | 169,014,879,514 | 552.26 |

02

කර්මාන්තයේ පැතිකඩ

2.9 වගුව :වාර්ෂික ආනයනික තේ අපනයනය (ප්‍රති - අපනයන) 2012

| ප්‍රවර්ගය ප්‍රති - අපනයන | 2012 දෙසැම්බර් වන විට | | |
|---|---|---|---|
| **කළු තේ ඇසුරුම් කිරීම** | **ප්‍රමාණය (කි.ග්‍රෑ.)** | **වටිනාකම (රු.)** | **නැ.තෙ.නො. (රු.කි.ග්‍රෑ.) (කි.ග්‍රෑ.)** |
| තේ මළු | 3,389,691 | 3,530,046,886 | 1,041.41 |
| තේ තොග | 2,174,483 | 1,162,032,440 | 534.39 |
| තේ පැකට් (ග්‍රෑම් 4- කි.ග්‍රෑ. 1) | 5,506,922 | 3,356,503,281 | 609.51 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 1- කි.ග්‍රෑ. 3) | 139 | 297,987 | 2,143.79 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 3 - කි.ග්‍රෑ. 5) | 0 | 0 | 0.00 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 5- කි.ග්‍රෑ. 10) | 176,790 | 105,851,210 | 598.74 |
| කළු තේ - මුළු | 11,248,025 | 8,154,731,804 | 724.99 |
| **හරිත තේ ඇසුරුම් කිරීම** | | | |
| තේ මළු | 1,062,158.00 | 1,825,183,128 | 1,718.37 |
| තේ තොග | 100,697.00 | 79,551,486 | 790.01 |
| තේ පැකට් (ග්‍රෑම් 4- කි.ග්‍රෑ. 1) | 1,426,633.00 | 1,327,080,826 | 930.22 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 1- කි.ග්‍රෑ. 3) | 7,839.00 | 3,748,458 | 478.18 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 3 - කි.ග්‍රෑ. 5) | 3.00 | 3,521 | 1,173.67 |
| තේ පැකට් (කි.ග්‍රෑ. 5- කි.ග්‍රෑ. 10) | 60,977.00 | 24,298,753 | 398.49 |
| හරිත තේ - මුළු | 2,658,307.00 | 3,259,866,172 | 1,226.29 |
| ක්ෂණික තේ - මුළු | 674.00 | 809,574 | 1,201.15 |
| මුළු ආනයනික තේ අපනයන | 13,907,006.00 | 11,415,407,550 | 820.84 |
| මුළු එකතුව | 319,946,572.00 | 180,430,287,064 | 563.94 |

මුලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

## 2.4.3. අගය එකතු කළ තේ අපනයන

ගෝලීය තේ වෙළඳපොළේ ශ්‍රී ලාංකීය අනන්‍යතාව හා එහි සාම්ප්‍රදායික තත්ත්ව තවදුරටත් පවත්වා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, අගය එකතු කළ තේ ප්‍රවර්ගවලට වාසිදායක වන පරිදි ඉතා ඉක්මනින් වෙනස් වෙමින් පවතින වෙළඳපොළ ඉල්ලුමට සරිලන පරිදි කටයුතු කිරීමට ශ්‍රී ලංකාව වග බලා ගත යුතුය. අගය එකතු කළ තේ, තේ පැකට්, තේ මළු සහ ක්ෂණික තේ අපනයනය කිරීම මගින් මුළු අපනයන පරිමාවෙන් 57.4% ක කොටසක් වාර්තා කිරීමට ශ්‍රී ලංකාව සමත් විය.එමගින් මුළු අපනයන ආදායමෙන් 61.8% ක කොටසකට දායක වෙමින් අගය එකතු කළ තේ ප්‍රවර්ගවලින් උපයන ලද ආදායම ඉහළ දැමීමට මෙවර ශ්‍රී ලංකාවට හැකි වී ඇත.






02

කර්මාන්තයේ පැතිකඩ

## 2.4.4. ශ්‍රී ලංකා තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල්

ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ අපනයන ගමනාන්තය වන්නේ එක්සත් රාජධානියද ඇතුළත් වන යුරෝපයයි. කෙසේ වුවද තේ මළු භාවිතය ඉහළ යාම හේතුවෙන් වත්මන් ශ්‍රී ලංකාවේ තොග තේ අපනයනය මැදපෙරදිග රටවල් වෙතට යොමු වී තිබේ.

රුසියාව ලෝකයේ විශාලම තේ ආනයනික රට වීම හේතුකොට ගෙන සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ 15.4% ක අපනයන පරිමාවක් ද, 15.9% ක අපනයන ඉපයීම්ද සහිතව ශ්‍රී ලංකා තේ මිලදී ගන්නා විශාලම ආනයනික රට බවට රුසියාව පත් වී තිබේ. ලංකා තේ අපනයනය කරනු ලබන ප්‍රධාන ගමනාන්තය පිළිබඳ ලැයිස්තුවේ දෙවන ස්ථානයට ඉරානය පත්ව සිටින අතර 8.1% ක අපනයන පරිමාවක් සහිතව තෙවන ස්ථානය දක්වා ඉහළට යෑමට සිරියාව සමත් විය. කලාපීය වශයෙන් මැද පෙරදිග රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ අපනයන ගමනාන්ත ලෙස සැලකිය හැකි වේ. බණිජ තෙල් මිල ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාව හේතුවෙන් එම රටවල්වල තේ සඳහා පවතින ඉල්ලුම ස්ථාවර අන්දමින් පුළුල් වෙමින් පවතී.

පිරිසිදු ශ්‍රී ලංකා තේ අපනයනය කරනු ලබන ප්‍රමුඛතම ගමනාන්ත 10 සමස්ත අපනයනවලින් 70% ක් සඳහා දායක වී තිබේ. කෙසේවුවද, නැව තෙක් වියදම් සහිත සාමාන්‍ය ඒකක මිලට සාපේක්ෂව නැව තෙක් වියදම් සහිත මිල ගණන් කැපී පෙනෙන පරිදි ඉහළම මට්ටමින් පවත්වා ගැනීමට සමත් වූයේ ඉරානය හා ජපානය පමණි. තවද, ඇ.එ.ජ.යේ ආර්ථිකය පිළිබඳව පවතින අඳුරු අපේක්ෂාවන් හේතුවෙන් ද යුරෝපීය ආර්ථික ප්‍රජාවේ රන් පවුම පිළිබඳ ණය අර්බුදය හේතුවෙන් ද තේ අපනයනවලින් ලැබිය හැකි ආදායම අඩු විය හැකිය.

**2.10 වගුව : ශ්‍රී ලංකා තේ අපනයන කරනු ලබන ප්‍රධානතම ගමනාන්ත - 2012**

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු) | නැ.තෙ.තො. (රු./ කි.ග්‍රෑ.) | %දායකත්වය- පරිමාව | %දායකත්වය- වටිනාකම | *නැ.තෙ.තො. වෙනස (රු./ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| | 47,250,313 | 26,861,817,131 | 568.50 | 15.4 | 15.9 | 16.24 |
| ඉරානය | 38,125,937 | 22,359,546,157 | 586.47 | 12.5 | 13.2 | 34.20 |
| සිරියාව | 24,718,795 | 13,238,591,632 | 535.57 | 8.1 | 7.8 | (16.70) |
| ඉරාකය | 23,483,363 | 10,636,265,163 | 452.93 | 7.7 | 6.3 | (99.34) |
| තුර්කිය | 23,131,102 | 11,459,307,236 | 495.41 | 7.6 | 6.8 | (56.86) |
| ලිබියාව | 16,325,958 | 6,452,045,763 | 395.20 | 5.3 | 3.8 | (157.06) |
| එ.අ.එ. | 11,582,777 | 6,200,968,119 | 535.36 | 3.8 | 3.7 | (16.90) |
| අසර්බයිජාන් | 10,591,385 | 5,699,647,356 | 538.14 | 3.5 | 3.4 | (14.12) |
| ජපානය | 9,545,484 | 6,097,967,217 | 638.83 | 3.1 | 3.6 | 86.57 |
| ජෝර්දානය | 9,397,691 | 4,504,109,682 | 479.28 | 3.1 | 2.7 | (72.99) |
| එකතුව | 214,152,805 | 113,510,265,456 | 530.04 | 70.0 | 67.2 | (22.22) |

*නැව තෙක් නොමිලේ මිල ගණන්වල සෘණ වෙනස (පිරිසිදු ශ්‍රී ලංකා තේ අපනයන වල සාමාන්‍යයට අදාළව) වරහන් තුළ දක්වා ඇත.

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

02

කර්මාන්තයේ පැතිකඩ

## 2.4.4.1. කළු තේ අපනයනය

2012 වසරේදී කි.ග්‍රෑ.මිලියන 46.6 ක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවේ කළු තේ ආනයනික ප්‍රමුඛතම රට (15.4%) ලෙස තම ස්ථාවරය තවදුරටත් තහවුරු කර ගැනීමට රුසියාව සමත් විය. ඉරානය සහ සිරියාව පිළිවෙළින් කි.ග්‍රෑ. මිලියන 38.1 (12.6%) ක සහ කි.ග්‍රෑ. මිලියන 24.7 (8.2%) ක කළු තේ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනු ලැබීය.

**2.11 වගුව : ප්‍රමුඛතම කළු තේ අපනයන ගමනාන්ත පහ**

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු) | නැ.තෙ.තො. (රු./ කි.ග්‍රෑ.) | % දායකත්වය- පරිමාව | % දායකත්වය- පරිමාව | නැ.තෙ.තො. * වෙනස (රු./ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| රුසියාව | 46,649,873 | 26,201,573,850 | 561.66 | 15.4 | 15.9 | 15.63 |
| ඉරානය | 38,110,203 | 22,349,565,890 | 586.45 | 12.6 | 13.6 | 40.42 |
| සිරියාව | 24,712,130 | 13,232,151,936 | 535.45 | 8.2 | 8.0 | (10.58) |
| ඉරාකය | 23,464,603 | 10,625,109,028 | 452.81 | 7.8 | 6.4 | (93.22) |
| තුර්කිය | 23,129,068 | 11,457,014,848 | 495.35 | 7.7 | 6.9 | (50.68) |
| ප්‍රමුඛතම ගමනාන්ත පහේ එකතුව | 156,065,877 | 83,865,415,552 | 537.37 | 51.7 | 50.8 | (8.66) |

*ප්‍රතිශත වරහන් තුළ දක්වා ඇත.
මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

## 2.4.4.2. හරිත තේ අපනයන

හරිත තේ ආනයනය කරනු ලබන ප්‍රමුඛ පෙළේ රටවල් දහය අතරින් රුසියාව 2012 වසරේදී කි.ග්‍රෑ. මිලියන 0.6 ක සැලකිය යුතු පරිමාවක් වාර්තා කරන ලැබීය. මෙහි සුවිශේෂත්වය වන්නේ හරිත තේ මුළු අපනයන පරිමාවෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් අපනයනය කර ඇත්තේ ප්‍රමුඛතම ගමනාන්ත පහට වීමය.

**2.12 වගුව : ප්‍රමුඛතම හරිත තේ අපනයන ගමනාන්ත පහ**

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු) | නැ.තෙ.තො. (රු./ කි.ග්‍රෑ.) | %දායකත්වය- පරිමාව | %දායකත්වය- වටිනාකම | නැ.තෙ.තො. * වෙනස (රු./ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| රුසියාව | 600,440 | 660,243,281 | 1,099.60 | 24.6 | 24.3 | (12.86) |
| එ.අ.එ. | 343,802 | 167,335,628 | 486.72 | 14.1 | 6.2 | (625.74) |
| යුක්රේනය | 238,157 | 268,536,120 | 1,127.56 | 9.8 | 9.9 | 15.10 |
| තායිවානය | 86,193 | 95,183,122 | 1,104.30 | 3.5 | 3.5 | (8.16) |
| ඉතාලිය | 84,502 | 138,701,912 | 1,641.40 | 3.5 | 5.1 | 528.94 |
| ප්‍රමුඛතම ගමනාන්ත පහේ එකතුව | 1,353,094 | 1,330,000,063 | 982.93 | 55.4 | 49.0 | (129.53) |

*ප්‍රතිශත වරහන් තුළ දක්වා ඇත.
මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව


02

කර්මාන්තයේ පැතිකඩ

### 2.4.4.3. ක්ෂණික තේ අපනයන

ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ ආනයනය කරනු ලබන ප්‍රමුඛ පෙළේ රටවල් අතරින් ප්‍රථම ස්ථානය අයර්ලන්තයට හිමි වූ අතර පසුගිය වසරට සාපේක්ෂව කි.ග්‍රෑ.මිලියන 1.46 (94.3%) ක පරිමාවක් ආනයනය කිරීමට එය සමත් විය. ක්ෂණික තේ ආනයනය කරනු ලබන ප්‍රධාන ගමනාන්ත පිළිබඳ ලැයිස්තුවේ දෙවන හා තෙවන ස්ථානවල රැඳී සිටීමට ජපානය හා ඇ.එ.ජ. සමත් විය.

2.5 රූපය : ක්ෂණික තේ අපනයනය කරනු ලබන ප්‍රමුඛ පෙළේ රාජ්‍යයන්




මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දත්ත උපයෝගී කරගනිමින් සම්පාදනය කරනු ලැබීය

### 2.4.4.4. ආර්ටීඞී (පානය සඳහා සූදානම්) තේ අපනයන

2012 වසරේදී ගමනාන්ත 11 ක් සඳහා ආර්ටීඞී තේ ශ්‍රී ලංකාවෙන් නැව් ගත කරනු ලැබීය. ලීටර් 43.7 දාහක (80.8%) ශ්‍රී ලංකා ආර්ටීඞී තේ මිලදී ගන්නා ප්‍රධානතම ආනයනික රට වන්නේ ඉතාලියයි. ආනයනික තේ අපනයන පිළිබඳව සැලකීමේදී (උදා: ලෙස ප්‍රති අපනයන), ඉරානය, රුසියාව, යුක්රේනය හා උස්බෙකිස්තානය යන රටවල් කි.ග්‍රෑ. මිලියනයකට වඩා ප්‍රමාණයක් 2012 වසර සඳහාද ආනයනය කිරීමට සමත් විය. ශ්‍රී ලංකාවේ මුළු ආනයනික තේ ප්‍රති අපනයන පරිමාවෙන් 55% කට වඩා ආනයන කිරීමට ඔවුහු දායක වූහ.

## 2.5. ගෝලීය තේ කර්මාන්ත භූමිකාව

තේ යනු ලොව පුරා රටවල්වල ජනප්‍රියතම එමෙන්ම පුළුල් ලෙස පරිභෝජනය කරනු ලබන උණුසුම් පාන අතරින් එකකි. ශ්‍රී ලංකා අපනයන වලින් විශේෂයෙන්ම තේ අපනයනය කිරීම මගින් එහි කීර්තිමත් ඉතිහාසයේ සමාරම්භයේ සිටම ජාතික ආර්ථිකයට හා සමාජීය සංවර්ධනයට අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටු වේ. ශ්‍රී ලංකාවේ අපනනයන ඉපයීම් සම්බන්ධයෙන්ද වෙළඳ භාණ්ඩ මත පදනම් වූ අපනයන මගින් වැදගත් දායකත්වයක් ලබා දී තිබේ. එමෙන්ම රටේ විශාලතම සේවා යෝජකයන් අතරට ද මෙම අංශය ඇතුළත් කළ හැකි වේ.

තේ නිෂ්පාදනය කරන රටවල් අතුරින් ප්‍රධාන නිෂ්පාදකයන් වන්නේ ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව, කෙන්යාව සහ ඉන්දුනීසියාවයි. මෙම රටවල් පහ ලෝක නිෂ්පාදනයෙන් 77% ක්ද ලෝක අපනයන වලින් 80% ක්ද සඳහා දායක වේ. විශේෂයෙන්ම කෙන්යාවද ඇතුළුව අප්‍රිකානු මහාද්වීපය සුවිශාල අස්වැන්නක් සනිටුහන් කරන ලදී. ගෝලීය තේ කර්මාන්තයෙහි ශ්‍රී ලාංකේය ස්ථාවරය සලකා බැලීමේදී, 2012 වර්ෂයේ අනෙකුත් තේ නිෂ්පාදනය කරන සාමාජිකයන් සමග සංසන්දනය කිරීමේදී සාමාන්‍ය ඒකක මිල (වෙන්දේසි) සහ ආදායම් කාර්යසාධනය (අපනයන) වර්ධනය වෙමින් අඛණ්ඩව ඉදිරියට යන ලදී.

## 2.5.1. ගෝලීය තේ ප්‍රදේශය

2012 වර්ෂය අවසානයේදී ලෝකයේ මුළු තේ වගා ප්‍රමාණය හෙක්ටයාර් මිලියන තුනකට වඩා වැඩි ප්‍රමාණයක පැතිර තිබු බවට ඇස්තමේන්තු කර තිබිණි.

2.13 **වගුව : ඉහලම තේ වගා ප්‍රමාණ වාර්තා**

| රට | 2010 (හෙක්.) | 2011 (හෙක්.) | 2012 (හෙක්.) |
|---|---|---|---|
| චීනය | 1,970,200 | 2,112,510 | 2,279,940 |
| ඉන්දියාව | 579,400 | 578,000 | 580,000 |
| ශ්‍රී ලංකාව * | 171,916 | 187,855 | 190,717 |
| කෙන්යාව | 188,007 | 187,860 | 187,000 |
| වියට්නාමය | 129,000 | 127,000 | 124,027 |
| ඉන්දුනීසියාව | 122,796 | 122,764 | 121,076 |
| මියන්මාරය | 78,400 | 78,500 | 78,500 |
| තුර්කිය | 77,500 | 77,700 | 77,800 |
| බංගලාදේශය | 54,900 | 54,400 | 54,500 |
| ජපානය | 46,800 | 46,200 | 45,900 |

* වගා කළ බවට ලියාපදිංචි ඇස්තමේන්තුගත ප්‍රදේශය

මූලාශ්‍රය : වාර්ෂික ජාත්‍යන්තර තේ කමිටු (ITC) සංඛ්‍යා ලේඛන සංක්ෂේපය - 2012

ජාත්‍යන්තර තේ කමිටුවට (ITC) අනුව, වැඩිම තේ බිම් ප්‍රමාණය චීනයෙන් හමුවන අතර එය පසුගිය දශකයේදී කැපී පෙනෙන ලෙස වැඩි විය. තවද කෙන්යාවෙහි තේ වපසරියද 2012 වර්ෂයේදී ඉහළ අගයකින් වැඩි වී ඇත්තේ ශ්‍රී ලංකා තේ බිම් ප්‍රමාණය අභිබවමිනි. 2010 - 2012 වර්ෂයන් සඳහා රටවල් අනුව ඉහළම තේ බිම් ප්‍රමාණය සහිත රටවල් දහය 2.13 වගුවෙන් ගෙනහැර දැක්වේ.

## 2.5.2. ගෝලීය තේ පරිභෝජන

2009 - 2011 කාලය යටතට ගැනෙන වර්ෂ තුනක කාලය තුළ වාර්ෂික තේ පරිභෝජනය සහ තෙවසරකට වරක් සාමාන්‍ය තේ පරිභෝජනය මගින් අනාවරණ වන කරුණුවලට අනුව කි.ග්‍රෑ. මිලියන 1,279.03 ක වාර්තාගත ප්‍රමාණයකින් චීනය ඉහළම ස්ථානයේ රැඳෙන බව පෙනී යයි. එක පුද්ගල තේ පරිභෝජනය ක.ග්‍රෑ. 0.95 ක් වැනි පහළ තත්ත්වයක පැවතියද එය ඉන්දියාව සම්බන්ධයෙන් ගත් කළ කි.ග්‍රෑ. මිලියන 871.67 ක් වන එමෙන්ම එක් පුද්ගලයකුට කි.ග්‍රෑ. 0.73 ක් වන ප්‍රමාණයක.

ජාත්‍යන්තර තේ කමිටුව මගින් ප්‍රකාශයට පත් කළ 2008 - 10 සහ 2010 - 12 යන කාල පරිච්ඡේදයන්ට අදාළ එක් එක් රාජ්‍යයන්හි එක පුද්ගල තේ පරිභෝජන සංඛ්‍යාලේඛනයන්ට අනුව, අවසන් සමාලෝචිත කාල පරිච්ඡේදයෙහි වාර්ෂික එක පුද්ගල පරිභෝජනය මොරොක්කෝ, චීනය, ඉන්දුනීසියාව සහ ජර්මනිය තේ පරිබෝජකයන්ට අදාළව කි.ග්‍රෑ. 0.67, 0.08, 0.06 සහ 0.05 වශයෙන් පිළිවෙලින් වැඩි වී ඇත. අනෙක් අතට කුවේටය හා සිරියාව යන රාජ්‍යයන් කි.ග්‍රෑ. 0.29 ක් සහ 0.17 ක් ලෙස වේගවත් පහළ යාමක් පෙන්වයි.

02

කර්මාන්තයේ පැතිකඩ

කෙසේ නමුද, වාර්ෂික ඒක පුද්ගල තේ පරිභෝජනය කුවේට්, ලිබියාව සහ තුර්කිය යන රටවල ඉහළම අගයක් ගන්නා අතර එය පිළිවෙළින් කි.ග්‍රෑ. 3.25, ග්‍රෑම් 2.39 සහ කි.ග්‍රෑ. 2.04 වශයෙන් පවතී. 2.14 වගුවෙන් පෙන්වා දෙනුයේ ඒක පුද්ගල පරිබෝජනය කි.ග්‍රෑ. 1.00 කට වැඩි ප්‍රමාණයක පවත්නා රටවල්වල ලැයිස්තුවකි.

2.14 **වගුව : රටවල් අනුව තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන**


| රට | 2009 - 11 | | 2010 - 12 | |
|---|---|---|---|---|
| | එකතුව (කි.ග්‍රෑ. මිලියන) | ඒක පුද්ගල (කි.ග්‍රෑ.) | එකතුව (කි.ග්‍රෑ. මිලියන) | ඒක පුද්ගල (කි.ග්‍රෑ.) |
| කුවේට් | 9.47 | 3.54 | 8.68 | 3.25 |
| ලිබියාව | 10.23 | 1.72 | 13.60 | 2.39 |
| තුර්කිය | 150.10 | 2.06 | 151.57 | 2.04 |
| එක්සත් රාජධානිය | 122.46 | 1.92 | 123.51 | 1.97 |
| ඇෆ්ගනිස්ථානය | 50.37 | 2.06 | 49.27 | 1.97 |
| අයර්ලන්තය | 9.85 | 2.18 | 8.51 | 1.90 |
| මොරොක්කෝව | 56.17 | 1.76 | 56.17 | 1.74 |
| තායිවානය | 44.18 | 1.65 | 44.00 | 1.64 |
| කටාර් | 2.43 | 1.42 | 2.53 | 1.46 |
| හොං කොං | 9.64 | 1.36 | 9.48 | 1.34 |
| ශ්‍රී ලංකාව | 28.03 | 1.36 | 27.79 | 1.33 |
| සිරියාව | 28.54 | 1.42 | 26.50 | 1.25 |
| චිලී | 20.45 | 1.20 | 21.40 | 1.24 |
| ඉරාකය | 42.00 | 1.31 | 40.35 | 1.21 |
| කෙන්යාව | 85.03 | 1.08 | 91.63 | 1.14 |

මූලාශ්‍රය : වාර්ෂික ජාත්‍යන්තර තේ කමිටු (ITC) සංඛ්‍යාලේඛන සංක්ෂේපය - 2012

## 2.5.3. ගෝලීය තේ නිෂ්පාදන

ලෝක තේ නිෂ්පාදන මූලික වශයෙන් රටවල් 4කට එනම්-ඉන්දියාව, චීනය, කෙන්යාව සහ ශ්‍රී ලංකාව යන රටවල සීමා වී ඇති අතර 2012 වර්ෂය (2.6 රූප සටහන බලන්න) වන විට ලෝක නිෂ්පාදිතයෙන් 75% කට ආසන්න ප්‍රමාණයක් සඳහා එම රටවලින් දායකත්වය ලබා දෙන ලදී. 2012 වර්ෂයේදී ලෝක තේ නිෂ්පාදිතය ලෙස කි.ග්‍රෑ. බිලියන 4.7 ක සර්ව කාලීන වාර්තාවක් පිහිටුවා ඇත. 2010 - 2012 වර්ෂයේ ගෝලීය තේ නිෂ්පාදිතයට ප්‍රධාන තේ නිෂ්පාදකයන්ගෙන් ලද දායකත්වය (කි.ග්‍රෑ. මිලියන 100 ඉක්මවන්නන්ගෙන්) 2.6 රූප සටහනින් නියෝජනය කෙරේ. ඉන්දියාව සහ චීනය තවමත් විශාලතම තේ නිෂ්පාදකයන් ලෙස සිය ස්ථානවල රැඳී සිටිය ද, මෙම ජාතීන් ද්විත්වයේ සැලකිය යුතු දේශීය පරිබෝජනය මගින් මෙම පාරිබෝගික ද්‍රව්‍යය විශාලතම වශයෙන් අපනයනය කරනු ලබන ගෝලීය අපනයනකරුවන් බවට කෙන්යාව හා ශ්‍රී ලංකාව පත් කර ඇත. චීනය විසින් කි.ග්‍රෑ. මිලියන 1,915 ක් වන ඉහළම ස්ථානයේ සිටින අතර 2012 වර්ෂයේදී කි.ග්‍රෑ. මිලියන 1,111.8 ක වාර්ෂික නිෂ්පාදිතයකට හිමිකම් කියමින් ඉන්දියාව දෙවන ස්ථානයේ රැඳී සිටී. 2012 වර්ෂයේදී ද ශ්‍රී ලාංකේය වාර්ෂික අස්වැන්න අභිබවමින් කෙන්යාව තෙවන ස්ථානයේ රැඳෙමින් කි.ග්‍රෑ. මිලියන 369.6 ක නිෂ්පාදන මට්ටමක් පවත්වා ගන්නා ලදී.

රූප සටහන 2.6: ලෝක තේ නිෂ්පාදන සංඛ්‍යාලේඛන




මූලාශ්‍රය : අතිරේකය : වාර්ෂික ජාත්‍යන්තර තේ කමිටු (ITC) සංඛ්‍යාලේඛන සංක්ෂේපය - 2012

## 2.5.4. ගෝලීය තේ විකුණුම්

කොළඹ තේ වෙන්දේසිය 2012 වර්ෂයේදී ඉහළම විකුණුම් පරිමාව හසුරුවමින් ප්‍රමුඛතම වෙන්දේසි මධ්‍යස්ථානය ලෙස එහි තත්ත්වය ඉහළ නංවාගන්නා ලදී. කෙසේ නමුදු, කි.ග්‍රෑ. මිලියන 320 කට අධික ප්‍රමාණයක් විකුණුම් පවත්වා ගැනීමට මොම්බාසා වෙන්දේසියද සමත් වූ අතර 2012 වර්ෂයේදී සිය විකුණුම් පරිමාවෙහි කැපී පෙනෙන අවපාතයකට ලක්වීම කල්කටා වෙන්දේසි මධ්‍යස්ථානයෙහි දැකිය හැකි විය.

2.15: **වගුව : ප්‍රධාන තේ වෙන්දේසි පිළිබඳ සංඛ්‍යාලේඛන (ප්‍රමිතිය, කි.ග්‍රෑ. මිලියන වලින්, සාමාන්‍ය ඒකක මිල - ඇමරිකානු ඩොලර්/ කි.ග්‍රෑ. වලින්)**

| **වෙන්දේසි මධ්‍යස්ථානය** | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|
| | **ප්‍රමාණය** | **මිල** | **ප්‍රමාණය** | **මිල** | **ප්‍රමාණය** | **මිල** |
| චිතගොං | 56.8 | 2.61 | 53.9 | 2.14 | 58.1 | 2.41 |
| කොචින් | 61.0 | 1.71 | 58.8 | 1.73 | 57.4 | 1.80 |
| **කොළඹ** | **322.4** | **3.28** | **323.3** | **3.26** | **325.4** | **3.07** |
| ගුවහාටි | 121.5 | 2.43 | 125.8 | 2.33 | 119.3 | 2.47 |
| ජාකර්තා | 38.5 | 1.82 | 32.8 | 1.97 | 32.0 | 1.97 |
| කල්කටා | 154.9 | 2.86 | 165.9 | 2.78 | 151.0 | 2.81 |
| ලිම්බේ | 15.8 | 1.58 | 13.3 | 1.61 | 12.5 | 1.70 |
| මොම්බාසා | 348.1 | 2.54 | 333.9 | 2.72 | 321.5 | 2.88 |


මූලාශ්‍රය : ජාත්‍යන්තර තේ කමිටු (ITC) වෙබ් අඩවියෙන් ගණනය කරන ලදී.

පසුගිය වසර තුන පුරාම ඉහළම සාමාන්‍ය වෙන්දේසි මිල පවත්වා ගනිමින් කොළඹ තේ වෙන්දේසිය විසින් වාර්තා තබාගෙන ඇත. තවද, අදාල කාලච්ඡේදය තුළ කිලෝ ග්‍රෑමයකට ඇ.ඩො. 300 ක් ඉක්මවන ලද එකම වෙන්දේසි මධ්‍යස්ථානය එය විය. මොම්බසා, කිලෝ ග්‍රෑමයකට ඇ.ඩො.2.88 ක විශාලතම සාමාන්‍ය වෙන්දේසි මිලක් අත්කර ගන්නා අතර 2012 වර්ෂයේදී තෙවන ස්ථානයේ රැඳී සිටින ලද්දේ කල්කටාවයි.

## 2.5.5. ගෝලීය තේ අපනයන

2012 වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව කි.ග්‍රෑ.මිලියන 9.0 ක (0.5%) අඩුවීමක් ගෝලීය තේ අපනයනයන් හි දක්නට ලැබිණ. කෙන්යාව සහ ශ්‍රී ලංකාව විසින් සිය අපනයන ප්‍රමාණ ඉහළ නංවා පිළිවෙළින් වෙන වෙනම 2.1% ක සහ 0.9% ක වර්ධනයක් අත්පත් කර ගන්නා ලද අතර එය 2012 වර්ෂයේදී අනෙකුත් ප්‍රධාන තේ අපනයන කරන රටවල් සමඟ සංසන්දනය කිරීමේදී පෙනී යයි. තේ අපනයනය කරන විශාලතම රටවල් වන, කෙන්යාව,චීනය සහ ශ්‍රී ලංකාව යන රටවල් 60% කට වඩා වැඩි ගෝලීය අපනයන ප්‍රමාණයක් අත්පත් කරගන්නා ලදී

රූප සටහන 2.7: ප්‍රධාන තේ අපනයනකරුවෝ




මූලාශ්‍රය : අතිරේකය : වාර්ෂික ජාත්‍යන්තර තේ කමිටු (ITC) සංඛ්‍යාලේඛන සංක්ෂේපය - 2012

සටහන : ප්‍රති - අපනයන නොසලකා හරිමින් ශ්‍රී ලාංකේය ගණනය කිරීම


2011 වර්ෂයේදී අපනයන ආදායම් අතරින් ප්‍රමුඛත්වයක් දරණ ලද තේ අපනයනය කරන රටවල් පහත ලැයිස්තුවෙහි දැක්වේ. එයින් හෙළිවූ පරිදි කෙන්යාව තේ අපනයනයන්ගෙන් විශාලතම ආදායම් උපයන ලදී. කෙසේ වෙතත්, 2011 වර්ෂය වනතෙක් ප්‍රධානතම අපනයන ඉපැයීම් රට වූයේ ශ්‍රී ලංකාවයි.

**2.16 වගුව : ඉහළම අපනයන ආදායම් (2012)**

| රට | අපනයන ආදායම (ඇ.ඩො. මිලියන) |
|---|---|
| කෙන්යාව | 1,328.0 |
| ශ්‍රී ලංකාව | 1,324.7 |
| චීනය | 1,115.7 |
| ඉන්දියාව | 686.8 |
| වියට්නාම | 227.0 |
| ඉන්දුනීසියාව | 156.7 |

මූලාශ්‍රය : වාර්ෂික ජාත්‍යන්තර තේ කමිටු (ITC) සංඛ්‍යාලේඛන සංක්ෂේපය - 2013

# ලංකා තේ අපනයන වෙළඳපොළවල්



02

කර්මාන්තයේ පැතිකඩ

# 2.6.ලංකා තේ පිළිබඳව අපනයන වෙළඳපොළ සමාලෝචනය

මුළු ලංකා තේ අපනයන වලින් 15.2% ක කොටසක් 'ලංකා තේ" (Ceylon Tea) ප්‍රධාන ගැනුම්කරු වශයෙන් පවත්වා ගෙන යනු ලබන රුසියානු සමූහාණ්ඩුව විසින් මිලදී ගන්නා අතර පිළිවෙළින් ස්ථාවරය 12% සහ 8% යන කොටස් වලින් යුතුව 2012 වර්ෂය තුළ ලංකා තේ මිලදී ගන්නා දෙවන හා තෙවන විශාලතම ගැණුම්කරුවන්ගේ තත්ත්වයන් ඉරානය සහ සිරියාව හිමිකර ගනී. ඉරානයට ළඟාවන සෘජු අපනයන පිළිබඳව සැලකිල්ලට භාජනය කළහොත්, ඉරානය විසින් මිලදී ගනු ලබන දායකත්වය 14% ක පමණ ඉහළ අගයකැයි සැළකිය හැකිය. ඇත්ත වශයෙන්ම, ඉරාකයට සහ ඉරානයට ලංකා තේ තොග අපනයනය කිරීම 2011 ටත් වඩා යහපත් තත්ත්වයක පැවති අතරවාරයේ මිලදී ගැණුම් ප්‍රමාණය කිලෝ මිලියන 30.93 ක සිට කිලෝ මිලියන 38.12 ක් ඉරානයටත්, කිලෝ මිලියන 22.62 සිට කිලෝ මිලියන 23.48 දක්වා ඉරාකයටත්, කිලෝ මිලියන 19.17 සිට කිලෝ මිලියන 23.13 දක්වා තුර්කියටත් යන පරිද්දෙන් මිලදී ගැනීම් ඉහළ යන ලදී. ඉරානයට ඇමරිකා එක්සත් ජනපදයෙන් සහ බටහිර ලෝකය විසින් වෙළඳ සම්බාධක පනවමින් දැඩි පීඩනයක් එල්ල කළ අතර සිවිල් ගැටුම් සහ අභ්‍යන්තර අර්බුද ඇති වීම වැනි තත්ත්වයන්ට අඛණ්ඩව මුහුණ දීමට ඉරාකයට සිදු වූ නිසාත් මෙය විශාල ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. සාමාන්‍ය තත්ත්වයන් යටතේ ලංකා තේ වල කාර්ය සාධනය මීටත් වඩා යහපත් වනු ඇතැයි මෙයින් ප්‍රතිබිම්භනය වේ. ඉරාකය සිව්වන විශාලතම ගැණුම්කරුගේ තත්ත්වයේ රැඳී සිටිමින් සෘජු අපනයන කිලෝ මිලියන 23.5 ක් 2010 වර්ෂයේ කිලෝ මිලියන 13 ට සාපේක්ෂව සාක්ෂාත් කර ගනිමින් 81% ක සුවිශේෂී ඉහළ යාමක් අත්කර ගන්නා ලදී.

2012 වර්ෂයේදී වඩාත් අඩු පැතිකඩ භූමිකාවක් ඩුබායි ප්‍රති - නැව්ගත කිරීමේ පර්යන්තය විසින් ඉටු කරන ලද අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අන්තර්වාර - මිලදී ගැනුම් කිලෝ මිලියන 21.76 සිට කිලෝ මිලියන 11.58 කින් පහළ යන ලදී. (50% ක අඩුවීමකි) කලාපයක් වශයෙන් ගත් කළ මැද පෙරදිග ගල්ෆ් සහ උතුරු අප්‍රිකාව විසින් මුලු ලංකා තේ නැව් ගත කිරීම් වලින් 55% කට ආසන්න ප්‍රමාණයක් 2012 වර්ෂයේදී ලබා ගන්නා ලදී. ලාංකේය තේ සඳහා පවත්නා එකම සංවර්ධිත වෙළඳ පොළ වන ජපානය විසින් විශාලතම පළමු ගැණුම්කරුවන් දස දෙනා අතර සිට ගෞරවය රැක ගනිමින් 2011 දී මිලට ගත් කිලෝ මිලියන 11.65 ට සාපේක්ෂව 2012 දී කිලෝ මිලියන 9.54 ක් මිලට ගන්නා ලදී. (මුළු අපනයනය කොටසින් 4% ක්) 2012 වර්ෂයේදී ඉමහත් ව්‍යසනකාරී ස්වභාවික විපතකට ජපානය මුහුණ දුන් බැවින් මෙයද කැපී පෙනෙන අඩු වීමකි.

රටෙහි අස්ථාවර මධ්‍යයේ වුවද ලිබියාවෙහි ආනයන තත්ත්වය කිලෝ මිලියන 7.40 සිට 16.32 දක්වා වර්ධනය විය. ලංකා තේ මිලදී ගත හැකි තවත් වැදගත් ස්ථානයක් ලෙස නම් දරා සිටි ජෝර්දානයේද මිලදී ගැනීම් ප්‍රමාණය අඩුවීමට හේතු වූයේ ඉරාකය වැඩි ප්‍රමාණයක් සෘජුව මිලට ගන්නා බැවිනි. රුසියාව හා අනෙකුත් CIS රාජ්‍යයන් විසින් ලබා ගන්නා ප්‍රමාණය සම්පූර්ණ ලංකා තේ අපනයන වලින් 25% ක තත්ත්වයේ පවතී. බටහිර, මධ්‍යම සහ නැගෙනහිර යුරෝපීය රටවල් විසින් 7% සිට 8% දක්වා ඒකාබද්ධ ප්‍රමාණයක් තේ ලබා ගන්නා බව පෙනී යද්දී නැගෙනහිර/ ආසියාන් සහ ඕෂනියා රාජ්‍යයන් 7% සිට 8% දක්වා ප්‍රමාණයක් ලබා ගනී. ලංකා තේ වලින් ඉතිරි 5% ක ප්‍රමාණය ආනයනය කරනු ලබන්නේ ඉහතින් සඳහන් කරන ලද කලාප කාණ්ඩවලට අයත් නොවන ඇමරිකානු මහද්වීපය හා අනෙකුත් කලාපවල එකතුවයි.

# 2.6.1 රුසියාව හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුල්ලට අයත් කලාප

**2.17 : වගුව රුසියාව හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුල්ලට අයත් රටවල ලංකා තේ සඳහා වන වෙළඳපොළ කොටස**

| අංකය | රට | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| වෙළඳපොළ කොටස % | | | | | |
| 1 | රුසියාව | 23 | 25 | 26 | 33 |
| 2 | යුක්රේනය | 32 | 32 | 34 | 36 |
| 3 | අසර්බයිජානය | 61 | 68 | 98 | 98 |
| 4 | කසකස්ථානය | 5 | 5 | 2 | 2 |
| 5 | උස්බෙකිස්ථානය | 41 | 48 | 42 | 31 |
| 6 | කිර්ගිස්ථානය | 35 | 33 | 28 | 20 |
| 7 | වෙනත් (ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුල්ලට අයත් රටවල්) | 30 | 49 | 32 | 34 |

දත්ත මූලාශ්‍රය : අන්තර්ජාතික තේ කමිටුව : සංඛ්‍යාලේඛන තොරතුරු ප්‍රකාශය 2013

රුසියාව හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුල්ලට අයත් කලාපය සාම්ප්‍රදායිකව තේ පානය කරන කලාපයක් වන අතර උණුසුම් ආගන්තුක සත්කාරයේ සංකේතයක් ලෙස තේ සලකනු ලබයි. මෙම කලාපය තුළ වඩාත් ප්‍රිය කරන පාන වර්ග අතර අපිරිමැසුම්දායක හා සෞඛ්‍යයට අතිශය හිතකර පානයක් ලෙස තේ සැලකේ. ඉහත 2.17 වගුවට අනුව, පහත දක්වා ඇති වෙළඳපොළ තත්ත්වයන් රුසියාව හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුල්ලට අයත් වන කලාපයේ දක්නට ලැබේ.



## 2.6.1.1 රුසියාව

ලංකා තේ මිලදී ගන්නා විශාලතම ඒකල ගැණුම්කරු වන්නේ රුසියාවයි. 33% ක වෙළඳපොළ කොටසක් සහිතව 2012 වසරේදී ශ්‍රී ලංකාව වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් විය. 2012 වර්ෂයේදී රුසියාව තේ කි.ග්‍රෑ 180,129,924 ක් ආනයනය කරනු ලැබූ අතර එයින් කි. ග්‍රෑ 59,072,933 ක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබීය.

ශ්‍රී ලංකාවෙන් රුසියාවට ප්‍රධාන වශයෙන්ම තොග තේ ආනයනය කරනු ලබයි. තොග තේ සඳහා ශූන්‍ය බදු හා පූර්ව ඇසුරුම් කළ තේ සඳහා 20% ක බදු පැනවීමක් සිදු වීම මෙයට හේතු විය හැකිය. අගය එකතු කළ අපනයනය වලින්ද, තේ පැකට් හා තේ මළු නැව් භාණ්ඩ ප්‍රමාණය පිළිවෙළින් 15% කින් හා 24% කින් අඩු වී ඇත. "රිස්ටන්" (එක්සත් රාජධානියේ පාන වර්ග) වැනි සමහර ලංකා තේ වර්ග හා සම්බන්ධ වන ඇසුරුම් කම්හල් රුසියාවේ ක්‍රියාත්මක වන අතර "අක්බාර්" ඇසුරුම් වසර කිහිපයකට පෙර රුසියාවේදී ඇසුරුම් කිරීම ආරම්භ කරන ලද ලංකා තේ වර්ගයකි. ශ්‍රී ලංකාවේ ඇසුරුම් කිරීම පිළිබඳව කොන්ත්‍රාත්තු ලබා ගෙන ඇති ප්‍රධාන තේ සමාගම් බෙහොමයක් (අහමඩ්, ලිප්ටන්, ඔරිම් ආදිය) රුසියාවේදී ඔවුන්ගේ ඇසුරුම් කරන ධාරිතාව වැඩි කර තිබේ.

රුසියානු සමූහාණ්ඩුවේ ජනප්‍රිය තේ අතරින් ඔරිම් ට්‍රේඩ්, එල්එල්සී, (හරිත ෆීල්ඩ්, ටෙස්, ප්‍රින්සස් ගිටා, ප්‍රින්සස් නූරි සහ ප්‍රින්සස් ජාවා) ප්‍රථම ස්ථානයේ රැඳී සිටින අතර මේ සමාග මේ "මයිස්කි සහ ලිස්මා" යන තේ වර්ගද යුනිලීවර් සමාගමේ "ලිප්ටන්", බෲක් බොන්ඩ් සහ බෙසෙඩා ද අහමඩ් සමාගමේ අහමඩ් යන තේ වර්ගය ද අනෙකුත් ජනප්‍රිය තේ වර්ග බවට පත් වී තිබේ.

## 2.6.1.2 යුක්රේනය



රුසියාවට පසුව කලාපයේ දෙවන විශාලතම තේ වෙළඳපොළ වන්නේ යුක්රේනය වන අතර එය 36% ක වෙළඳපොළ කොටසක් සහිතව ප්‍රමුඛයා බවට පත් වෙමින් සිටියි. යුක්රේන වැසියන් ප්‍රධාන වශයෙන්ම කළු තේ පානය කරන්නන් වන අතර තේ ආනයන වල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. සාම්ප්‍රදායික තේ කොළ වඩාත් ජනප්‍රියම තේ වර්ගය වේ. සියලුම යුක්රේන වැසියන් උණුසුම් තේ පානය කරන්නන් වන අතර ශීත සෘතුවේදී පාරිභෝගික ඉල්ලුම උපරිම වේ. තේ පරිබෝජනය සෘතු අනුව වෙනස්වන ස්වභාවයෙන් යුක්ත වේ. මෙම රටවල ආර්ථිකය මත හා ස්ථාවරත්වය මත තේ මිල රඳා පවතී. මේ ටී, ඔරිට්, අහමඩ් තේ, සොලෝට්යා ආදිය ජනප්‍රිය ලංකා තේ වර්ග වේ. සෞඛ්‍යයට හිතකර පානයක් ලෙස හරිත තේ වල විභවය පිළිබඳ පාරිභෝගිකයින් වැඩි වැඩියෙන් දැනුවත් විම නිසා විශාල නගර වල හරිත තේ සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතී.

තේ තොග ආනයනය හා අගය එකතු කළ තේ ආනයනය අතර ආනයන අපනයන බදු පරතරය (අගය එකතු කළ තේ සඳහා 10% ක් සහ තොග තේ සඳහා ශූන්‍ය බදු) රුසියාවේ තරම් විශාල නොවුවද ආනයන සහ අපනයන බදු වල වෙනස, ලංකා තේ මිල ගණන් ඉහළ යාම හා ඉහළ ප්‍රවාහන ගාස්තු (පෙර ඇසුරුම් තේ තොග වලට සාපේක්ෂව තේ තොග බහාලුමක පරිමාව) ශ්‍රී ලංකාවෙන් එතරදී තේ ඇසුරුම්කරණය දිරිගැන්වීමේ ප්‍රධාන හේතු වේ. ආර්ථික අර්බුදය හා විනිමය අවප්‍රමාණය වීම මඟින් ආර්ථිකයට බලපෑමක් සිදු වී ඇති අතර පෙර ඇසුරුම් තේ ඇනවුම් කිරීම අඩුකර දේශීය වශයෙන් ඇසුරුම් කිරීම සඳහා තොග නැව් භාණ්ඩ ඇනවුම් කිරීම වැඩි කිරීමට ආනයනකරුවන් පෙළඹීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේද ආර්ථිකයට සිදු වී ඇති බලපෑමයි. විදේශීය රට වලදී ඇසුරුම් කිරීමේදී, වෙනත් සම්භවයක් සහිත වඩාත් ලාබදායී තේ වැඩි ප්‍රතිශතයක් ඔවුන්ගේ මිශ්‍රණ සඳහා භාවිත කරමින් වඩාත් පිරිමැසුම් දායක ලෙස කටයුතු කිරීමට හැකි වේ.

## 2.6.1.3 අසර්බයිජානය



2009 වසරේ සිට 2012 වසර දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ ප්‍රමාණය වූයේ මෙ. ටො. 4698 සිට මෙ. ටො. 7500 කි. 2011 වර්ෂයේදී, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 7385 ක් වූ අතර එය මුළු ආනයන වලින් 80% ක් පමණ වේ. 2010 වසරට සාපේක්ෂව එය 11.6% කට වඩා වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි. මුළු අපනයන ප්‍රමාණය මෙ.ටො. 1.540 කින් අඩුවීම නිසා 2012 වසරේදී එය මුළු අපනයන පරිමාවෙන් 98% ක් විය. අසර්බයිජාන සංඛ්‍යාලේඛන නියෝජිතායතනයෙන් ලබාගත් නිල තොරතුරු වලට අනුව ආනයනය කරනු ලබන තේ ප්‍රමාණයට අනුව ශ්‍රී ලංකාව ඉන්දියාවට වඩා ඉදිරියෙන් සිටින අතර ජෝර්ජියාව, රුසියාව හා තුර්කිය වෙනත් සැපයුම්කරුවන් වේ.

ශ්‍රී ලංකා රේගු සංඛ්‍යාලේඛන වලට අනුව 2011 වසර තුළ තේ මෙ.ටො. 11970 ක් පමණ ප්‍රමාණයක් ආනයනය කරන ලදී. මෙම ප්‍රමාණයෙන්, 92% ක් තොග වශයෙන් වූ අතර 5.6% ක් පැකට්ය. එසේම 0.08% තේ මළු සහ 0.14% ක් හරිත තේ ය. 2.06% ක් සෙසු ඒවා මෙන් වර්ග කරන ලද ඒවාය. 2012 වසර තුළ මෙ.ටො. 10.614 ක ප්‍රමාණයක් ආනයනය කරන ලද අතර 94% ක් තොග වශයෙන්ද 5.72% ක් පැකට් කරන ලද තේය. 2012 වසරේ අපනයන 11.33% කින් අඩු වී ඇත. මෙමගින් මෙම වරෂයේදී කි.ග්‍රෑ. මිලියන 7.5 කින් (4% කින්) ශ්‍රී ලංකාවේ

තේ නිෂ්පාදනය පහළ යාමට හේතු විය හැකිය. කෙසේ හෝ වසර මුල් භාගය තුළ ලෝක කළු තේ අස්වනු කි.මිලියන 60 කින් පමණ සෘණාත්මක වර්ධනයක් පිළිඹිඹු කර ඇත. දේශීය නිෂ්පාදනය ඇතුළුව, සමස්ත තේ අලෙවි ධාරිතාව, M/S Azersun Holdings, Baku සහ Beta තේ සමාගම විසින් පාලනය කෙරේ. අලෙවි ප්‍රමුඛයා වන Azersun Holding වෙළඳපොළෙහි 50% කට වඩා දායකත්වයක් හිමිකර ගෙන ඇත. Final, Philosofar, Blendo, Azercay සහ Maryam ඔවුන්ගේ ප්‍රචලිත තේ වර්ග වේ. Beta තේ සමාගමට අලෙවියෙන් 35% කට ආසන්න ප්‍රමාණයක් සතුව ඇත. ඔවුන්ගේ වර්ග වනුයේ Beta, Champion සහ Bayce සහ Impra, Ahmad, Lipton සහ Hyleys මෙන්ම ඉතිරි වර්ග සඳහා 15% වඩා අඩු දායකත්වයක් පවතී.

## 2.6.1.4 කසකස්ථානය



රුසියාව සහ උස්බෙකිස්ථානය යන රටවලට පසුව CIS හි තුන්වන විශාලතම තේ පාරිභෝගිකයා වේ. කසකස්ථානයේ සමස්ත තේ අලෙවි ධාරිතාවය මෙ.ටො. 26,000 - 29,000 දක්වා පරාසයක විය හැකි බව ඇස්තමේන්තු ගත කෙරේ. සෙසු CIS රටවලට සාපේක්ෂව, කසකස්ථානයෙහි තේ පරිභෝජනය කරනුයේ කිරි සමඟය. එසේම වියළි පළතුරු, ජෑම්, මී පැණි, කජු විස්කෝතු, බ්‍රෑන්ඩිස්, සහ චොකලට්ස් වැනි විවිධ වර්ග පෞද්ගලිකව භාවිතා කරයි. කසකස්ථානයේ එක පුද්ගල තේ පරිබෝජනය කි.ග්‍රෑ. 1.8 කට ආසන්න අගයක් ගනී. කසකස්ථානයේ උණුසුම් පාන අලෙවිය විශාල වශයෙන් තේ මත රඳා පවතින අතර රටෙහි පවතින සංස්කෘතිය සහ සම්ප්‍රදායය ඉතා ලෙහෙසියෙන් වෙනස් නොවන බැවින් ඉතා දීර්ඝ කාලයක් පුරා ඉල්ලුම පවත්වාගෙන යාමට හැකි වනු ඇත. Tealand Too සහ Tea House Too යන ප්‍රමුඛයෝ සිල්ලර මිලට විකුණුම්වලින් 29% ක් ලෙස පවත්වාගෙන යති. 1998 වසරේ පටන්, කසකස්ථානයට තේ සපයන දෙවන විශාලතම සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාව නැගී සිටින අතර මෙම තත්ත්වය 2003 වසර වනතුරු පැවතිණි. එය 2012 වසරේදී වෙළඳපොළ දායකත්වය 2% ක් විය.

වෙළඳපොළ කොටස ක්‍රමයෙන් අඩුවීමට හේතු වූයේ ප්‍රධාන වශයෙන්ම සී.ටී.සී. තේ ආනයනය වූ අතර කසකස්ථානයේ තේ වෙළඳපොළ ප්‍රධාන වශයෙන්ම ආනයනය කරනු ලබනුයේ සී.ටී.සී. තේ වන බව ප්‍රචලිතය. එබැවින් සංඛ්‍යා ලේඛන වලට අනුව කෙන්යාවට ඉහළ වෙළඳපොළ දායකත්වයක් පවති. අසර්බයිජානය, එ.අ.එ. හා තුර්කිය වැනි සෙසු තේ නිෂ්පාදන රටවල වෙළඳපොළ දායකත්වය ක්‍රමිකව අඩුවන බවද නිරීක්ෂණය විය.

ක්ලැසික් තේ (15%) සහ ඉම්පීරියල් තේ (පුද්) සමාගම (9.3%) විසින් යවන ලද තේ වලට වඩා 2012 වසරේ කසකස්ථානයට තේ සැපයූ ප්‍රධානතම සැපයුම්කරු වූයේ Ranfer තේ සමාගමයි. තොග සඳහා ක්‍රියාත්මක වූ ශුන්‍ය බදු අක්වෙරළ පැකට් කිරීමෙහිලා දිරිගන්වන ලදී.

## 2.6.1.5 උස්බෙකිස්ථානය



උස්බෙකිස්ථානය ප්‍රධාන වශයෙන්ම හරිත තේ වෙළඳපොළක් වන අතර චීනය ප්‍රධානතම සැපයුම්කරු වේ. එම නිසා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ දායකත්වය අඩුවෙමින් පවතී. තේ අමුද්‍රව්‍ය උස්බෙකිස්ථානයට සපයනු ලබන මූලික සැපයුම්කරුවන් අතරින් එක් සැපයුම්කරුවකු වන්නේ 31% ක වෙළඳපොළ කොටසක්ද හිමි ශ්‍රී ලංකාවයි.

තේ එ.ඇ.එ., ජෝර්ජියාව, ටර්ක්මෙනිස්ථානය හා රුසියාව හරහා උස්බෙකිස්ථානයට තේ ආනයනය කෙරේ. ප්‍රමුඛ තේ සමාගම් (නාමයන්) වනුයේ Ahmad (එක්සත් රාජධානිය), Alokozay tea (එ.ඇ.එ.), Bet (තුර්කිය), Jambo (කෙන්යාව), Impra ශ්‍රී ලංකාව Weston, SAM (Samarqand Tea) සහ Tashkent වේ. මූලාශ්‍රවලට අනුව Beta, Bayce, Tashkent Tea , Impra , Ahmad හා Jaf වඩාත් ප්‍රචලිත තේ නාමයන් ලෙස සලකනු ලැබේ.

02

කර්මාන්තයේ පැතිකඩ

## 2.6.1.6 කිර්ගිස්ථානය



මෙම රට විශේෂයෙන්ම කළු තේ පරිභෝජනය කරන රටකි. සෑබෑ තේ පරිභෝජන ප්‍රමාණය වර්ෂයකට මෙ.ටො.4000 ක් පමණ වෙතැයි ඇස්තමේන්තුගතව පවත්නා බවට වෙළඳපොල මූලාශ්‍ර පෙන්වා දෙයි. ජනගහනය මිලියන 5.5 ක් පමණ වන එරට ඒක පුද්ගල පරිභෝජනය වර්ෂයකට තේ ග්‍රෑම් 700 ක් පමණ වේ. හරිත තේ ග්‍රීෂ්ම සෘතුවේදී පානය කරන බවටත් කළු තේ පොදුවේ සෑම කාලයකම පානය කරන බවටත් සැලකේ. ආයතනික ආහාර අංශයේ හැර තේ මලු පරිභෝජනය සුවිශේෂී වේ. රජයේ මූලාශ්‍ර වලට අනුව, රජය විසින් නිල මාර්ග ඔස්සේ තේ මෙ.ටො. 3500 - 4000 ක් පමණ රටට ආනයනය කරයි. මෙයට අතිරේක වශයෙන් චීනය, කසකස්ථානය, ටර්මෙනිස්ටානය සහ උස්බෙකිස්ථානය යන රටවලින් දේශසීමා හරහා කෙරෙන වෙළඳාම තුළින් ආසන්න වශයෙන් මෙ.ටො.500 ක තේ රටට ගලා යයි.

CIS අන්තර් රාජ්‍ය සංඛ්‍යාලේඛන කමිටුව මගින් නිකුත් කරන ලද සංඛ්‍යා දත්තවලට අනුව 2012 වර්ෂයේදී 20% ක වෙළඳපොළ කොටසක් සහිතව ඒකාබද්ධ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වූ අතර චීනය දෙවන ස්ථානය හිමි කර ගෙන ඇත. පැකට් වශයෙන් පවත්නා තේ සඳහා සුවිශාල ඉල්ලුමක් පවතී. එයින් තොග තේ 5% ක් සහ තේ මලු 2% ක් ලෙස පවත්නා ස්ථානය අභිබවමින් සමස්ථ තේ ප්‍රමාණය 93% ක් ලෙස වෙළෙඳ ධාරිතාවයක් ඇති බවට වෙළඳපොළ මූලාශ්‍ර මගින් සනාථ කෙරේ. තොග තේ ග්‍රාමීය ප්‍රදේශවල පමණක් අලෙවිය සඳහා තබා ඇති අතර තේ මලු සහ රස ගන්වන ලද තේ පරිභෝජනය ඉහළ මට්ටමක පවත්නා බවට වාර්තා නොවේ. හරිත තේ සඳහා පවතින ඉල්ලුම වර්ධනය වෙමින් පවතී.

## 2.6.1.7 ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඩුල්ලට අයත් වෙනත් රටවල්

### බෙලරුස්



මිලියන 9.48 ක පමණ ජනගහනයකින් සමන්විත, බෙලරුස් හි සමස්ත තේ අලෙවිය වාර්ෂිකව මෙ.ටො. 8000 ක් ලෙස ඇස්තමේන්තුගත කොට ඇති අතර එයින් 50% ක් රුසියානු සහ යුක්රේන සීමාව හරහා පැමිණේ. CIS අන්තර් රාජ්‍ය සංඛ්‍යා ලේඛන කමිටුවෙන් ලද තොරතුරු වලට අනුව, ශ්‍රී ලංකාවේ වෙළඳපොළ දායකත්වය 23.5% කි.

ශ්‍රී ලංකා රේගු සංඛ්‍යා ලේඛන වලට අනුව ශ්‍රී ලංකාව බෙලරුස් වෙත සෘජුව තේ අපනයනය කර ඇත. මෙම වෙළඳපොළට අපනයනය කරනු ලබන ශ්‍රී ලංකා තේ වලින් 70% කට වඩා අගය එකතු කරන ලද ස්වරූපයෙන්ය. බෙලරුසියානු වෙළඳපොළට අඛණ්ඩව තේ සපයනු ලබන සමාගම් ලෙස Orimi Trade (Princes Series, Green field & TESS), Ahamed Tea (Ahamed), Lipton, May Tea Company (Maisky Chai) Riston, Dilmah, Jaf, Sunleaf, Olinda, Mabroc, Tea Tang සහ Basilur වෙළඳපොළ මූලාශ්‍ර තුළ වාර්තා වේ.

### මෝල්ඩෝවා



මෝල්ඩෝවාහි සුළු ආර්ථික පදනමින් මෑත කාලයේදී අත්කර ගන්නා වූ ප්‍රගතියක් දැක ගත හැකි වුවද එය යුරෝපයේ දිළිඳුතම රටක් සේ තවදුරටත් පවතී. ඒක පුද්ගල තේ ග්‍රෑම් 500 ක පරිභෝජනයක් සහිතව තථ්‍ය විකුණුම් මත පදනම්ව වාර්ෂිකව මෙ.ටො.2500 ක්- 3500 කට ආසන්න අගයකට තේ

02

කර්මාන්තයේ පැතිකඩ

සඳහා පවතින සමස්ත වෙළඳපොළ ඇස්තමේන්තු ගත කෙරේ. කළු සහ හරිත තේ පරිභෝජන අනුපාතිකය 95.5 ක පවතින බව ප්‍රකාශිතය.රස ගැන්වූ තේ සුලු ප්‍රමාණයන්ගෙන් පරිභෝජනය කරනු ලැබේ. තේ මළු සඳහා පවතින ඉල්ලුම නාගරික ප්‍රදේශ වල ක්‍රමිකව වැඩිවෙමින් පවතී. තේ වලින් බොහොමයක් යුක්රේනියන් දේශ සීමාව හරහා මෝල්ඩෝවාවට ප්‍රවිෂ්ට වේ.

2012 වසරේදී ශ්‍රී ලංකාව 40% ක දායකත්වයක් සහිතව වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්ව ඇත. රුසියාවෙන් සහ යුක්රේනයෙන් ආනයනය කරන තේ මෝල්ඩෝව වෙත 'ලංකා තේ. ප්‍රති අපනයනය කිරීමකි. ලංකා තේ ඉතා ප්‍රසිද්ධ වන්නා සේම සියලු අලෙවි සැල් වලට වැඩි වශයෙන් පවතී.

### ටර්ක්මෙනිස්ථානය



මෙම රටෙහි සමස්ත තේ වෙළඳ ධාරිතාවය වාර්ෂික කි.ග්‍රෑ. 1.5 ක ඒක පුද්ගල පරිභෝජනයක් සහිතව මෙ.ටො.8000 ට ආසන්න ප්‍රමාණයක් වනු ඇතැයි ඇස්තමේන්තු කෙරේ. එසේම මෙම රට හරිත තේ වෙළඳපොළකි. ඒවා චීනයෙන් ලැබෙන අතර කළු තේ එ.අ.එ., ඉරානය, ජෝර්ජියාව සහ ශ්‍රී ලංකාවෙන් ගෙන්වනු ලැබේ. ඉරාන කළු තේ වඩාත් ලාභදායී වෙමින් රටේ වඩාත් ජනප්‍රියතම වී ඇත. හරිත තේ ග්‍රාමීය ප්‍රදේශ වලද කළු තේ නාගරික ප්‍රදේශ වලද වැඩි වශයෙන් භාවිත කෙරේ.

ශ්‍රී ලංකා රේගුවේ පවත්නා දත්තවලට අනුව Imperial තේ 35% Akbar Brothers 17% සහ Union Commodities 4.5% අභිබවමින් 2012 වසරේ දී සමස්ත අපනයනයන්ගෙන් 42% ක දායකත්වයක් සහිතව J CEY තේ ප්‍රමුඛත්වය ගෙන ඇත.

### තජිකිස්ථානය



තජිකිස්ථානයේ වෙළඳපොළ වාර්ෂිකව මෙ.ටො. 6000 - 7000 දක්වා පරාසයක ඇතැයි සැලකේ. වෙළඳපොළ මූලාශ්‍ර අනුව, මිලදී ගැනීමේ ශක්තිය ඉතා දුර්වල වන නිසා ඉල්ලුම් වන්නේ ප්‍රධාන වශයෙන් ම ලාභදායී තේ සඳහාය. ශ්‍රී ලංකා රේගු දත්ත වලට අනුව, ශ්‍රී ලංකාවෙන් සෘජු අපනයන 2011 සහ 2012 වසරවල පිළිවෙළින් මෙ.ටො. 37.6 ක් සහ මෙ.ටො. 27.7 ක් වන අතර එය වෙළඳපොළ දායකත්වයෙන් 3% ක් විය. එසේම තොග නැවගත කිරීම් 2012 වසරේ සිදු නොකරන ලද අතර 2011 වසර තුළ පැකට් නැව්ගත කිරීම් 55% දක්වා අඩුවිය. 2012 වසරේදී පැකට් නැවගත කිරීම් සමස්තයෙන් 32% ක් වූ නමුදු 2011 වසරේදී එම වසර සඳහා සමස්ත අපනයනයන්ගෙන් 52% ක් විය. මෙය කැපී පෙනෙන ලෙස වූ 26% ක අඩුවීමකි. ඒ අනුව සෘණාත්මක වර්ධනයක් මෙම සංඛ්‍යා දත්ත තුළින් විද්‍යමාන වේ.

## 2.6.2 මැද පෙරදිග හා ගල්ෆ් කලාපය

කලාපයේ පිහිටි ඩුබායි රාජ්‍යයේ ප්‍රති අපනයන හැකියාව හා ජාබිල් අලි නිදහස් වෙළඳ කලාපය (JAFZA) කළු තේ මිශ්‍ර කිරීම් හා ඇසුරුම්කරණය සඳහා පහසුකම් සපයා තිබීම හේතු කොට ගෙන එක්සත් අරාබි එමිර් රාජ්‍යය ප්‍රමුඛ පෙළේ තේ ආනයනික රටක් බවට පත්වී ඇත. කලාපීය වෙළඳපොළේ දේශපාලන අස්ථාවරභාවය හා තීරුබදු නොවන ගැටළු යනාදිය මගින් ඩුබායි රටේ ප්‍රති අපනයන වෙළඳාමට වසර ගණනාවක මුළුල්ලේ සිටම වාසිදායක පරිසරයක් නිර්මාණය කර දී තිබේ. ඉරානය එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ ඩුබායි රටෙන් තේ මිලදී ගන්නා විශාලතම ගැණුම්කරුවන් අතර සෞදි අරාබිය, රුසියාව, ඉරාකය, ස්වාධීන රාජ්‍යන්ගේ පොදු මඩුල්ලට (CIS) අයත් රටවල් සහ අනෙකුත් මැද පෙරදිග රටවල්ද ප්‍රති අපනයන වෙළඳාමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

**2.18 වගුව මැද පෙරදිග හා ගල්ෆ් කලාපයට අයත් රටවල ලංකා තේ සඳහා වන වෙළඳපොළ කොටස**

| අංකය | රට | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| | | වෙළඳපොළ කොටස - % | | | |
| 1 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 42 | 34 | 29 | 18 |
| 2 | ඉරානය | 55 | 50 | 47 | 57 |
| 3 | සිරියාව | 94 | 92 | N/A | N/A |
| 4 | ඉරාකය | 22 | 33 | 55 | 60 |
| 5 | සෞදි අරාබිය | 34 | 30 | 28 | 30 |
| 6 | ජෝර්දානය | N/A | N/A | N/A | N/A |
| 7 | තුර්කිය | N/A | N/A | N/A | N/A |
| 8 | කුවේටය | 97 | 91 | 89 | 86 |
| 9 | ලෙබනනය | N/A | 92 | N/A | 96 |

දත්ත මූලාශ්‍රය : අන්තර්ජාතික තේ කමිටුව : වාර්ෂික සංඛ්‍යාලේඛන තොරතුරු ප්‍රකාශය 2013

## 2.6.2.1 එක්සත් අරාබි එමීර් රාජ්‍යය



ඩුබායි රේගු දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව 2008/2009 කාල පරිච්ඡේදයේ පැවති මූල්‍ය අර්බුදයේ බලපෑම් වලින් තේ ආනයන 2010 වසරේදී යළි ප්‍රකෘතිමත් තත්ත්වයට පත් වූ අතර තේ ආනයනය මෙ. ටො. 84,804 ක් විය. කෙසේ වුවද, මෙම ප්‍රකෘතිමත් වීම ඉදිරි වසර දෙක සඳහා තවදුරටත් පවත්වා ගැනීමට ඩුබායි රාජ්‍යය අසමත් වූ අතර 2011 වසරේදී ආනයන පරිමාව මෙ.ටො. 73,469 දක්වාද 2012 වසර සඳහා ආනයන පරිමාව මෙ.ටො. 63,600 දක්වාද පහත වැටී තිබුණි. ඩුබායි රාජ්‍යයේ තේ ප්‍රති අපනයන අංශයට බාහිර සාධක හේතු කොට ගෙන කැපී පෙනෙන බලපෑමක් පසුගිය වසරේදී සිදු වූ අතර මුළු තේ ආනයන පරිමාව සම්බන්ධයෙන්ද අහිතකර ප්‍රතිවිපාක වලට මුහුණ දීමට එම රටට සිදු විය. ඩුබායි රටේ තේ ආනයනවල පහත බැසීම් සහ ශ්‍රී ලංකාවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට තේ අපනයනය කිරීම් අතර ප්‍රබල සහ සම්බන්ධයක් පවතී. ඩුබායි රටේ සිට ඉරානය වෙත සිදු වූ ප්‍රති අපනයන පහත වැටීම හේතුවෙන් 2011 හා 2012 වසරවලදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කිරීම් ඉතා සීඝ්‍රයෙන් අඩු විය. ශ්‍රී ලංකාවෙන් ඩුබායි රටට අපනයනය කරනු ලබන තේ පරිමාව අඩු වූ අවස්ථාවන්වල ඩුබායි රටේ මුළු තේ අපනයන පරිමාවද අඩු වේ. එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ආනයනය කරනු ලබන ලංකා තේ වැඩි ප්‍රමාණයක් ප්‍රධාන වශයෙන්ම ප්‍රති අපනයන කටයුතු සඳහා වන බව මෙමගින් නැවත වතාවක් අවධාරණය කෙරේ. නිදහස් කලාපය තුළට තේ ආනයනය කරනු ලබන ප්‍රධාන ආනයනකරු වන්නේ දළ වශයෙන් මෙ.ටො. 25,000 ක වාර්ෂික ධාරිතාවක් ඇති යුනිලීවර් තේ ඇසුරුම්කරණ කම්හලයි.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා ඉරානය අතර සිදු වූ ප්‍රති අපනයන වෙළඳාම් හා ඉරානය මත පනවන ලද අන්තර්ජාතික සම්බාධකවල බලපෑම හේතුවෙන් 2012 වසරේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කිරීම් තවදුරටත් අඩුවිය. 2012 වසරේදී තේ ප්‍රති අපනයන වෙළඳාම් අහිතකර ලෙස බිඳ වැටීමට බලපෑ ප්‍රධාන හේතු වූයේ ඩුබායි රටේ බැංකු පද්ධතියට බලපෑමක් එල්ල කරමින් ඇ.එ.ජ. මගින් ඉරානය මත මූල්‍ය සම්බාධක පැනවීම සහ ඉරානයේ විනිමය අනුපාත නිරන්තරයෙන් උච්චාවචනය වීමයි.

## 2.6.2.2 ඉරානය





සමස්තයක් ලෙස ආර්ථික තත්ත්වයේ පහළ බැසීමක් සිදුවීම හේතුවෙන් හා විනිමය ගැටලු හේතුවෙන් ආර්ථික අවපාතයකට මුහුණ දීමට ඉරානයට සිදුවිය හැකි බව අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් අනාවැකි පළ කර තිබුණි. උද්දමනය හා රැකියා වියුක්ති අනුපාතය නිල වශයෙන් 25% ක් පමණ වන අතර සත්‍ය තත්ත්වය මෙයට වඩා වැඩි විය හැකිය. ඇ.එ.ජ. සමඟ යුද ගැටුම් ඇති වීමේ අවදානමට ඉරානය මුහුණ පා සිටියි. අන්තර්ජාතික සම්බාධකවල බලපෑම් රටට ඉතා අයහපත් ලෙස බලපා ඇති බව ඊශ්‍රායල විවෘත ම පිළිගෙන ඇත.

මිලියන 79 ක ජනගහනයක් සහිත ඉරානයේ දේශීය වාර්ෂික තේ පරිබෝජනය මෙ.ටො. 110,000 කට වඩා වැඩි වීම හේතුවෙන් දළ වශයෙන් මෙ.ටො.100,000 ක පමණ තේ ප්‍රමාණයක් ඉරානය මගින් ආනයනය කරයි. පෙර ඇසුරුම් තේ ආනයන මත සම්බාධක පනවා තිබීම හේතුවෙන් හා තොග තේ මත 30% ක් වන සාපේක්ෂව ඉහළ රේගු බදු අනුපාත පනවා තිබීම හේතුවෙන් මෙ.ටො. 40,000 කට වඩා වැඩි තේ පරිමාවක් ඉරානය තුළට නිල නොවන ආකාරවලින් ඇතුළු වේ. නීත්‍යානුකූලව ආනයනය කරනු ලබන තේ පරිමාව වර්ෂයකට මෙ.ටො. 60,000 - මෙ.ටො. 65,000 ක් අතර ප්‍රමාණයක් වේ. ඍජු හා වක්‍ර අපනයන සිදු කරනු ලබන ශ්‍රී ලංකාව ඉරාන තේ වෙළඳපොළේ ප්‍රමුඛස්ථානය හොබවන අතර ඉරානයට තේ අපනයනය කරන අනෙකුත් රටවල් වන්නේ ඉන්දියාව, කෙන්යාව හා චීනයයි.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන වලට අනුව, 2012 වර්ෂය තුළ මෙ.ටො. 38,125 ක තේ ශ්‍රී ලංකාවෙන් ඉරානයට අපනයනය කර තිබේ. 2011 වසරේ අදාළ කාල සීමාව හා සැසැඳීමේදී මෙ.ටො. 7,186 ක හෝ 23% ක වැඩිවීමක් මෙමගින් පෙන්නුම් කරයි. ඉරානය මත පනවන ලද මූල්‍ය සම්බාධක හේතුවෙන් ප්‍රති අපනයන කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන තේ පරිමාවේ 50% ක පමණ අඩු වීමක් වාර්තා කරනු ලැබූ එ.අ.එ. රාජ්‍යය වෙත ශ්‍රී ලංකා තේ අපනයන කිරීම්වලට අවාසිදායක වන අන්දමින් ශ්‍රී ලංකාව විසින් ඉරානයට වැඩිපුර තේ අපනයනය කර ඇත. එ.අ.එ. රාජ්‍යයේ නියෝජිතයන්ගෙන් තේ මිලදී ගන්නා බොහෝ ඉරාන තේ ආනයනකරුවෝ ශ්‍රී ලංකාවෙන් ඍජුව තේ ආනයනය කිරීම ආරම්භ කිරීම ඉරානයට අපනයනය කරනු ලබන තේ පරිමාවේ වර්ධනයට ප්‍රධාන හේතුව විය.

ඉරානයේ මහ බැංකුව මත පනවනු ලැබූ අන්තර්ජාතික මූල්‍ය සම්බාධක හේතුවෙන් ඉරානයේ සමන් බැංකුව සමඟ ණයවර ලිපි සම්බන්ධතා නවතා දැමීමට ලංකා බැංකුව කටයුතු කිරීම නිසා, 2012 ජුනි මාසයෙන් පසුව ඉරානයට තේ අපනයනය කිරීමේදී දුෂ්කරතාවලට මුහුණපෑමට ශ්‍රී ලංකා තේ වෙළඳ ප්‍රජාවට සිදු විය. ඉරාන විනිමය අනුපාත වල සිදු වූ නිරන්තර උච්චාවචනයන් හේතු කොට ගෙන විශාල ඇණවුම් ලබා දීමට ගැනුම්කරුවන් අකමැති වීම නිසා තේ වෙළඳාමට ඉතා අයහපත් බලපෑම් සිදු විය. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවෙන් තේ ඉවත් කිරීමට ඉරාන රජය තීරණය කිරීමත් සමඟ තේ අපනයනය කිරීම සඳහා ඉරාන් රියාල් 12,260 ක නිල අනුපාතයෙන් විදේශ විනිමය ලබා ගැනීමේ අවස්ථාව ඉරාන වෙළඳ ප්‍රජාවට අහිමි කරනු ලැබීය. අළුතින් මතු වූ මෙම තත්ත්වය සමඟ ඉරාන ජනතාව සඳහා තේ මිල අධික වෙළඳ භාණ්ඩයක් බවට පත් විය. කෙසේ වෙතත්, ලංකා තේ වෙළඳාමේ නියුතු සාමාජිකයින් විසින් පවතින වෙළඳපොල අනුපාතවලින් ගෙවීම සිදු කරමින් ශ්‍රී ලංකාවෙන් තේ ආනයනය කිරීම අඛණ්ඩව සිදු කරනු කරනු ලැබුහ.

## 2.6.2.3 සිරියාව



2011 මාර්තු මාසයේ ඇතැම් ප්‍රදේශවල ආරම්භ වූ සාමකාමී විරෝධතා, 2012 වසර වන විට පූර්ණ සිවිල් යුද්ධයක් බවට පරිවර්තනය වී තිබුණි. සිරියානු වෙළඳපොළේ 2/3 ක වෙළඳපොළ කොටසක් හිමිකර ගනිමින් තේ ජනප්‍රියතම උණුසුම් පානය බවට පත් වී ඇති අතර කෝපි හා මාතේ (ඖෂධීය පානය) ඉතිරි වෙළඳපොළේ කොටස් හිමිකර ගෙන ඇත. දේශීය පරිභෝජනය සඳහා මෙන්ම එහි උතුරු දේශ සීමාව හරහා ඉරාකයට හා තුර්කියට තේ ප්‍රති අපනයනය කිරීම සඳහාද සිරියාව තේ ආනයනය කරයි.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වලට අනුව 2012 වසරේදී මෙ.ටො. 24,714 ක තේ ප්‍රමාණයක් සිරියාවට අපනයනය කර ඇත. ආරක්ෂක හේතූන් මත 2011 වසරේ එම කාල සීමාව සඳහා වාර්තාගත වූ මෙ.ටො. 28,759 ක පරිමාව හා සැසඳීමේදී මෙ.ටො. 4,047 ක එනම් 14% අඩුවීමක් පිළිඹිබු කෙරේ. කෙසේ වුවද වසරේ දෙවන භාගයේදී සිවිල් යුද්ධය හේතුවෙන් රට තුළ නිදහසේ තේ බෙදා හැරීමට හා බෙදාහරින ලද තේ සඳහා ගෙවීම් ලබා ගැනීමට වෙළඳුන්ට නොහැකි වීම මෙන්ම ඉරානය සමඟ දේශ සීමා හරහා වෙළඳ කටයුතු සිදු කිරීමට බාධා වීම හේතුවෙන්ද තේ වෙළඳපොළට ඉතා අයහපත් බලපෑම්වලට මුහුණ දීමට සිදු විය.

## 2.6.2.4 ඉරාකය



වසර දෙකකට පෙර තේ ආනයන නිදහස් කරන ලද අතර මේ අනුව සෘජු ආනයන ප්‍රමාණය වැඩි විය. ඉරාකයේ තේ අවශ්‍යතාවයෙන් කොටසක් ජෝර්දානය හා කුවේටය මගින් තවදුරටත් ආනයනය කරනු ලැබේ. ඉරාකයට යැවෙන සෘජු අපනයන වැඩිකර ගැනීමට හැකි වීම හේතුවෙන් 2011 වන විට ඉරාක තේ වෙළඳපොළෙන් 50% කට වැඩි ප්‍රමාණයක් අත්පත් කර ගනිමින් එය සුරක්ෂිත කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. 2012 වර්ෂය සඳහා ඉරාකයෙහි ඇති ශ්‍රී ලංකා වෙළඳපොළ දායකත්වය වන මෙ.ටො. 23,484 ක ප්‍රමාණය 60% දක්වා තවදුරටත් ඉහළ නංවා ගැනීමට හැකියාව ඇති විය හැකිය.

රාජ්‍ය අංශය විසින් තේ අපනයනය කිරීම නවතා දැමූ පසු ඉන්දීය සැපයුම්කරුවන්ට තම වෙළඳපොළ දායකත්වය පවත්වාගැනීමට නොහැකි විය. ඉන්දියාව විසින් නැවුම් / පිවිතුරු ඉන්දීය තේ සැපයීම වෙනුවට විවිධ ස්ථානයන්හි නිපැයුණු තේ මිශ්‍ර කර සපයනු ලබන බව බොහෝ පෞද්ගලික වෙළඳ සාමාජිකයින් විසින් දැන සිටි අතර ඉන්දීය තේ මිලදී ගැනීම අඩු කිරීමට ඔවුන් යොමු කළ හේතුව එය විය හැකිය. වියට්නාම තේ සංසන්දනාත්මකව බැලූ කල්හි අඩු මිලක් වන අතර ලංකා තේ වලට පෙනුමින් සමීප සමානකම් දක්වන නිසා ඉරාක තේ වෙළඳපොළෙහි ශ්‍රී ලංකා තේ වෙළඳපොළ කොටසට අභියෝගයක් එල්ල කරමින් පවතී.

වෙළඳපොළ ආරංචි මාර්ග වලට අනුව, ඉරාකයට ආනයනය කරන ලද ආහාර පිළිබඳව පරීක්ෂා කිරීමට පත්කළ SGS ජාත්‍යන්තර සමාගමට විරුද්ධව ලැබුණු ඇතැම් පැමිණිලි හේතුවෙන් එම සමාගමේ සේවා අවසන් කරන ලෙස රජය වෙත බලපෑම් ඇති විය. පසුගිය වසරේ සිට ඉරාකයට අපනයනය කරන ලද ආහාර අයිතම පිළිබඳ තත්ත්ව පරීක්ෂාව සිදු කරනු ලැබුවේ වෙරිටාස් කාර්යාංශය පමණක් වන නමුදු ගුණාත්මකභාවයෙන් අඩු තේ වෙළඳපොළේ පැවතීම සැබෑ තේ අපනයනකරුවන් බොහෝ දෙනෙකුගේ අවධානයට යොමු වූ කරුණකි. ඉරාකයට අපනයනය කළ තේ පිළිබඳ වැදගත් සාධකය වන්නේ එම තේ විශාල ප්‍රමාණයක් පෙර ඇසුරුම් තේ වූ අතර මුළු පරිමාවෙන් 5% කටත් වඩා අඩුවෙන් තේ තොග අපනයනය සිදු වීමය.

## 2.6.2.5 සවුදි අරාබිය



ගල්ෆ් රාජ්‍යයන් 06 අතර විශාලතම රාජ්‍යය වන සවුදි අරාබිය, විශාලතම තේ පරිභෝජනය කරන්නාද වේ. පවත්නා වාර්තා අනුව, වාර්ෂිකව මෙ.ටො. 30,000 කට ආසන්න ප්‍රමාණයක තේ, රාජධානිය විසින් ආනයනය කරනු ලබන අතර ඉන් මෙ.ටො. 29,000 ක් සිය දේශීය පරිභෝජනය වෙනුවෙන් තබා ගනිමින් මෙ.ටො '1000 ක ප්‍රමාණයක් ප්‍රති - අපනයනය කෙරේ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙහි දත්තයන්ට අනුව, 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් සෞදි වෙළඳපොළට තේ මෙ.ටො. 4,470 ක් අපනයනය කර ඇති අතර 2011 දී නැව් ගත කළ තේ මෙ.ටො. 4,671 ක පරිමාවට සාපේක්ෂව ගත්කළ 4% ක් වන මෙ.ටො. 201 ක අඩුවීම් තීරුවක් පෙන්නුම් කරයි. එහෙත්, සවුදි අරාබියේ සමස්ත තේ ආනයන ප්‍රමාණය ද පහළ යන ලදී. මෙම තත්ත්වය අනුව ශ්‍රී ලංකාවේ වෙළඳපොළ කොටස ඉහළ යන ලදී. සවුදි වෙළඳපොළට ලංකා තේ සපයන විශාලතම කේවල / එක පුද්ගල අපනයනකරු ලෙස තවමත් සිටිනුයේ, රාබියා වෙළඳ ලකුණ තේ හිමිකාරත්වය දරණ බීෂන් තේ සමාගමයි.

## 2.6.2.6 ජෝර්දානය



2011 සහ 2012 වර්ෂයන්හි මැද පෙරදිග රාජ්‍යයන් හරහා හමාගිය නොසන්සුන්කාරී වාතාවරණය මේ දක්වා ජෝර්දානයට බලපෑම් නොකලේය.

ඉරාකයට අයත් තේ අපනයනය කිරීමේදී වරෙක ජෝර්දානය ශ්‍රී ලංකාව වෙනුවෙන් වැදගත් තේ භූමාරු ස්ථානයක්ව පැවතියද ඉරාකය මගින් සෘජු අපනයන ඉහළ නැංවීමත් සමගම මෙම තත්ත්වය ක්‍රමයෙන් අඩු විය. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනයන්ට අනුව, ශ්‍රී ලංකාව විසින් 2012 වර්ෂයේදී ජෝර්දානයට තේ මෙ.ටො. 9,398 ක් අපනයනය කරමින් මෙ.ටො. 2,104 ක හෙවත් 29% ක් එනම් 2011 වර්ෂයේ එම කාල වකවානුවෙහිදී ම නැව්ගත කළ මෙ.ටො. 7,294 ක පරිමාණයට සාපේක්ෂව වැඩි වීමක් සනිටුහන් කරන ලදී. ශ්‍රී ලංකාව ජෝර්දානයට අපනයනය කරනු ලබන තේ පරිමාණය ඉහළයාමට හේතුව ඉරාක වෙළඳපොළට වැඩි වැඩියෙන් ප්‍රති - අපනයන කිරීම මිස දේශීය වෙළඳපොළෙහි සිදු වූ අන් කිසිදු විශේෂ සංවර්ධනයක් නොවේ. යුනිලීවර් සමාගම මගින් ඊජිප්තුවෙහි ඇති එහි කර්මාන්තශාලාවෙන් ජෝර්දානයට ලිප්ටන් ලකුණ තේ සපයනුයේ ප්‍රධාන වශයෙන්ම ඉහළ යන තේ බෑග් ඉල්ලුම සපුරාලීමේ පරමාර්ථයෙනි.

## 2.6.2.7 තුර්කිය



තුර්කිය, කලාපයේ සාම්ප්‍රදායික තේ නිපදවන ප්‍රමුඛයා වේ. වෙළඳ මූලාශ්‍රයන් ප්‍රකාරව, තුර්කියට නීත්‍යානුකූලව ආනයනය කළ තේ පරිමාණය වර්ෂයකට මෙ.ටො. 8,000 කටත් වඩා අඩුය. තුර්කිය තුළට නීත්‍යානුකූල නොවන තේ ගලා එම ප්‍රධාන වශයෙන්ම සිදුවන්නේ ඉරානය, ඉරාකය සහ සිරියාව සමග ඇති නැගෙනහිර හා දකුණු දේශ සීමාවන්ගෙනි. තුර්කිය තුළට නීත්‍යානුකූල නොවන අයුරින් පැමිණෙන තේ පිළිබඳව නිවැරදිම සංඛ්‍යාලේඛන නොමැති වුවද වසරකට මෙ.ටො. 30,000 ක් වැනි ප්‍රමාණයකැ යි යුරෝ මොනිටර් ආරංචි මාර්ග පෙන්වා දේ.

02

කර්මාන්තයේ පැතිකඩ

පෙර වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී තුර්කිය වෙත අපනයනය කරන ලද ශ්‍රී ලංකා තේ ප්‍රමාණය මෙ.ටො. 3,958 ක හෙවත් 20.6% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. තුර්කියට පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකා තේ අපනයන මෙ.ටො. 23,129 ක් සිදු කිරීම 2011 වර්ෂයේ වාර්තා කළ මෙ.ටො. 19,171 ට සාපේක්ෂව පවතී. රටේ නැගෙනහිර කොටසේ වෙසෙන බොහෝ තුර්කි ජාතික පාරිභෝගිකයන් ලංකා තේ ප්‍රිය කරන බැවින් නීත්‍යානුකූල නොවන තේ වෙළඳාම් කිරීමේ කටයුත්තට අනුබල ලැබී ඇත.

### 2.6.2.8 කුවේට්



වර්ෂයකට කුවේටයෙහි ගෘහස්ථ තේ පරිභෝජනය මෙ.ටො. 3,000 ක් පමණ වන බව ඇස්තමේන්තු කරන ලද නමුදු ඉරානයට හා ඉරාකයට තේ සැපයීම පිණිස වැඩි තේ ප්‍රමාණයක් සෑම විටම ආනයනය කෙරේ. රටේ සම්පූර්ණ තේ ආනයනය ඉහළ යාමට හේතු වූයේ ඉරාකයට තේ සැපයීමට කුවේටයද ආරම්භ කිරීමයි. ඉරානය සහ ඉරාකය විසින් ලංකා තේ වලට කැමැත්ත පල කරන බැවින් ප්‍රති - අපනයන අවශ්‍යතා සඳහා කුවේටයට තේ අපනයනය කරන ප්‍රධාන සැපයුම්කරු වන්නේ ශ්‍රී ලංකාවයි.

ශ්‍රී ලංකාව විසින් 2012 වර්ෂයේදී කුවේටයට මෙ.ටො. 7,278 ක තේ අපනයනය කර ඇති අතර එම ප්‍රමාණය 2011 වර්ෂයේදී නැව්ගත කළ මෙ.ටො. 9,088 ක ප්‍රමාණයකට සාපේක්ෂව 20% ක පමණ අඩු වීමකි. පසුගිය වර්ෂයේදී කුවේටයට අපනයනය කරන ලද ශ්‍රී ලංකා තේ ප්‍රමාණය පහළ බැසීමට හේතුවිය හැක්කේ ඉරාකය සමඟ සිදුවූ ප්‍රති - අපනයන වෙළඳාම පහත වැටීම විය හැකි අතර ඉරාකය ශ්‍රී ලංකාවෙන් තේ වැඩි ප්‍රමාණයක් ඍජු ලෙස ආනයනය කරන ලදී.

### 2.6.2.9 ලෙබනනය



තේ බෑග් ඛණ්ඩයේ වර්ධනය මගින් ලෙබනන වෙළඳපොළේ සිය දායකත්වය ඉහළ නංවා ගැනීමට ඊජිප්තුවට හැකියාව ලැබිණි. ඊජිප්තුවෙහි, ඇලෙක්සැන්ඩ්‍රියාවෙහි යුනිලීවර් තේ සමාග මෙහි තේ ඇසුරුම් කර්මාන්තශාලාවෙන් ලිප්ටන් වෙළඳ ලකුණ තේ අපනයනය කිරීම හේතුවෙන් ලෙබනන තේ වෙළඳපොළෙහි වැදගත් ව්‍යාපාරිකයකු බවට ඊජිප්තුව පත්ව ඇත. වර්ෂ 2009 දී මෙ.ටො. 254 සිට 2011 දී මෙ.ටො. 422 දක්වා ලිප්ටන් තේ ප්‍රමාණය ඉහළ ගොස් ඇත. තේ බෑග අපනයනයන්හි ඉහළ යාම ආශිර්වාදාත්මක සංවර්ධනයකි. ලෙබනන තේ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවෙහි ස්ථාපිත තත්ත්වයට හේතු වී ඇත්තේ අශ්ව හිස ලකුණ ලංකා තේ නිෂ්පාදනයෙහි සාර්ථක කාර්යයසාධනයයි. එම වෙළඳ ලකුණ වසර 50 කට ආසන්න කාලයක් වෙළඳපොළෙහි රැඳී සිටින ලද නමුදු තේ බෑග පරිභෝජනය ඉහළ යාමත් සමඟ ලිප්ටන් ලකුණ මගින් ලබාදුන් ප්‍රබල අභියෝගයට එයට මුහුණ දීමට සිදුවිය.

## 2.6.3 උතුරු/බටහිර අප්‍රිකානු කලාපයට අයත් රටවල්

**2.19 වගුව උතුරු/ බටහිර අප්‍රිකානු කලාපයට අයත් රටවල ලංකා තේ සඳහා වන වෙළඳපොළ කොටස**

| අංකය | රට | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| | වෙළඳපොළ කොටස - % | | | | |
| 1 | ටියුනීසියාව | 40 | 10 | 24 | 0.45 |
| 2 | ලිබියාව | 84 | 88 | 83 | 83 |
| 3 | ඊජිප්තුව | 2 | 1 | 2 | 4 |

දත්ත මූලාශ්‍රය : අන්තර්ජාතික තේ කමිටුව : වාර්ෂික සංඛ්‍යාලේඛන තොරතුරු ප්‍රකාශය 2013

## 2.6.3.1 ටියුනීසියාව



ටියුනීසියානු තේ වෙළඳපොළ වර්ෂයකට ආසන්න වශයෙන් කිලෝ ග්‍රෑම් මිලියන 10 - 11 ක පමණ 70% ක වූ කළු තේ කොටසකින් සහ ඉතිරි 30% ක ප්‍රමාණය හරිත තේ වලින්ද යුතු වන්නකි. ටියුනීසියාවේ තේ ආනයනය තවමත් පවතිනුයේ රටේ මූලික ආහාර අයිතම ආනයනය සහ බෙදාහැරීම සඳහා වගකීම් දරන රාජ්‍ය සංවිධානය වන ටියුනීසියානු වාණිජ කාර්යාලයෙහි (Office du Commerce Tunisia (OCT)), පාලනය යටතේය. තේ,සීනි, කිරි වැනි මූලික ආහාර අයිතමයන්හි මිල ගණන් රජය විසින් සහනදායීව ලබාදෙන බැවින්, ටියුනීසියානු ආනයනයන්හි වැදගත් කාර්යභාරයක් පාරිභෝගික භාණ්ඩයක මිල මගින් ඉටු කරයි.

2008 වර්ෂය වන තෙක්, ටියුනීසියාවට කළු තේ ප්‍රධාන වශයෙන් ලබාදෙන සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාව පැවතුණු අතර හරිත තේ සඳහා චීනය මූලික සම්පාදකයා වශයෙන් සිටින ලදී. කෙසේ නමුදු, 2009 න් ඉදිරියට කොළඹ තේ මිල ගණන් ඉහළ යාමත් සමඟ ටියුනීසියානු වාණිජ කාර්යාලය විසින් ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන තේ ප්‍රමාණය අඩු කර කළු තේ සැපයීම අනෙකුත් රටවලින් බලාපොරොත්තු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2009 - 2012 කාලයන්හි ශ්‍රී ලංකාව විසින් ටියුනීසියානු වෙළඳපොළට සපයන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 6,000 සිට 20 දක්වා ප්‍රමාණයකින් අඩු වූ අතර 2009 වසරෙන් පසුව ගෝලීය තේ මිල ගණන් වැඩි වීම හේතුවෙන් ටියුනීසියාවට ආනයන කරනු ලබන මුළු තේ පරිමාව අඩු විය.

## 2.6.3.2 ලිබියාව



සාමාන්‍ය ජනතාවට අත් විඳීමට සිදුව ඇති ආර්ථික දුෂ්කරතා හේතුවෙන් සහනාධාර ලබා දෙන භාණ්ඩ ප්‍රවර්ගයට අයත් වන ඇතැම් ආහාර නිෂ්පාදන අතර තේ, සීනි සහ තිරිඟු පිටි වේ. රාජ්‍ය හා පුද්ගලික අංශය තේ ආනයනය කිරීමේ නිරතව සිටියද, තේ සඳහා සිල්ලර මිල නියාමනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ රජයටය. රටේ වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ. මිලියන 9 - 10 අතර පමණක් බව තක්සේරු කර ඇත. වෙළඳපොළ ආරංචි මාර්ග වලට අනුව, ලිබියානුවන්ට සහන මිලට ලබා දෙන තේ අසල්වැසි රටවලට විකුණනු ලබන අතර දේශ සීමා මායිම් හරහා වෙළඳාම් කරනු ලබන ප්‍රමාණය ගැන තොරතුරු ලබා ගත නොහැකිය. අඩු ආදායම්ලාභී ලිබියානු ජනතාවට අමතර ආදායමක් ලබා දෙන නිල නොවන වෙළඳාමක් බවට මෙය පත් වී තිබේ.

සිවිල් යුද්ධය හේතු කොට ගෙන, 2011 වසරේදී ශ්‍රී ලංකා තේ ලිබියාවට අපනයනය කිරීම සම්බන්ධයෙන් අහිතකර ප්‍රතිවිපාක වලට මුහුණ දීමට සිදු විය. ශ්‍රී ලංකාවෙන් ලිබියාවට අපනයනය කරන ලද වාර්තාගත ඉහළම තේ පරිමාව විය හැක්කේ 2012 වසරේදී තේ කර්මාන්තය පුනර්ජීවය ලබා සිටි අවස්ථාවේදී අපනයනය කරන ලද වාර්තාගත මෙ. ටො. 16,326 ක පරිමාව විය හැකිය. 2011 වසර සඳහා ලියාපදිංචි වූ පරිමාව හා සැසඳීමේදී, ලිබියාවට තේ අපනයනය කිරීමෙන් ශ්‍රී ලංකාව 100% ට වඩා වැඩි වර්ධන වේගයක් අත්පත් කර ගෙන ආනයන පරිමාව වැඩි වීම හේතුවෙන් වෙළඳපොළ දායකත්වය වෙනස් වී නොමැත.

02

කර්මාන්තයේ පැතිකඩ

## 2.6.3.3 ඊජිප්තුව



වසර දෙකකට වැඩි දේශපාලන අසථාවරත්වයක් පැවතුණු පෙර ඊජිප්තු අර්ථිකය තවමත් ඉහළ නැගීමේ පූර්ව මට්ටමට පැමිණෙමින් පවතී. අරාබි ලෝකයෙහි විශාලතම තේ වෙළඳපොළ ඊජිප්තුවයි. තේ යනු ජනප්‍රියම උණුසුම් පානය වන අතර කි.ග්‍රෑ. මිලියන 90 - 95 අතර වාර්ෂික තේ පරිභෝජනයක් පවතී. පසුගිය දශක තුන තුළ සාම්ප්‍රදායික තේ වල සිට CTC දක්වා තේ සඳහා වන පාරිභෝගික කැමැත්ත වෙනස් වී ඇත. සාපේක්ෂ මිල වාසිය සහ තද කහට පැහැ තේ වලට ඇති කැමැත්ත, ඊජිප්තු තේ වෙළඳපොළෙහි සාම්ප්‍රදායික තේ සැපයුම්කරුවන්ට සාපේක්ෂව විශේෂ වාසියක් CTC තේ නිෂ්පාදකයන්ට ලබා දී ඇත.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන වලට අනුව මෙ.ටො. 3,649 ක මුළු ප්‍රමාණයක් සමග 2012 වර්ෂයේදී ඊජිප්තු වෙළඳපොළෙහි සිය දායකත්වය ඉහළ නංවා ගැනීමට ශ්‍රී ලංකාව සමත්ව ඇත. මෙමගින් 2011 දී නැව්ගත කළ මෙ.ටො. 2382 ක ධාරිතාවට සාපේක්ෂව මෙ.ටො. 1267 ක ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. කෙසේ නමුදු, තේ වල කාණ්ඩ විශ්ලේෂණය කළ විට අනාවරණය වන්නේ, මෙම වැඩි වීම තොග/ විශාල ප්‍රමාණයේ තේ අංශයෙන් ලද වැඩිවීමක් බවත් 2011/ 2012 කාලච්ඡේදය තුළදී අගය එකතු කළ අංශයෙහි පහත වැටීමක් සිදුව ඇති බවත්ය. කෙන්යානු තේ මිල ගණන් වල ඉහළ යාම මෙන්ම අස්වැන්න අඩු වීම මගින් 2012 වර්ෂයේදී ඊජිප්තු වෙළඳපොළට ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම් වැඩි කිරීමේ අවස්ථාවක් ලබා දුන්නා විය හැකිය.

## 2.6.4 යුරෝපීය ප්‍රජාවට අයත් කලාපය

**2.20 වගුව යුරෝපීය ප්‍රජාවට අයත් රටවල ලංකා තේ සඳහා වන වෙළඳපොළ කොටස**

| අංකය | රට | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| වෙළඳපොළ කොටස - % | | | | | |
| 1 | එක්සත් රාජධානිය | 2 | 1 | 1 | 2 |
| 2 | පෝලන්තය | 9 | 8 | 7 | 8 |
| 3 | ප්‍රංශය | 5 | 4 | 5 | 5 |
| 4 | ජර්මනිය | 11 | 11 | 11 | 10 |
| 5 | නෙදර්ලන්තය | N/A | N/A | N/A | N/A |
| 6 | බෙල්ජියම | N/A | N/A | N/A | N/A |

දත්ත මූලාශ්‍රය : අන්තර්ජාතික තේ කමිටුව : වාර්ෂික සංඛ්‍යාලේඛන තොරතුරු ප්‍රකාශය 2013

## 2.6.4.1 එක්සත් රාජධානිය



2012 වර්ෂයේදී එක්සත් රාජධානිය වෙතට තේ ආනයනය කිරීම්වල එකතුව මෙ.ටො. 144,575 ක් ලෙස වාර්තා වීමෙන් 2011 වර්ෂයේදී සිදු වූ මෙ.ටො. 154,500 කට 6.8% ක සීමාන්තික අඩුවීමක් පෙන්වයි. 2011 සමස්ත වර්ෂය තුළ 1.1% වූ මෙ.ටො. 1,754 ට සාපේක්ෂව 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකාවෙන් කළ ආනයන ප්‍රමාණය මෙ.ටො. 2,302 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇති අතර එය දළ වශයෙන් 2.2% ක කොටසක් විය.

එක්සත් රාජධානියේ උණුසුම් පාන වෙළඳපොළ සැලකිය යුතු ලෙස කොටස් වලට බෙදී පවතින අතර මුලු වෙළඳපොළෙන් 40.2% ක ප්‍රමාණයක් ප්‍රධාන පෙළේ ගණුදෙනුකරුවන් තිදෙනා විසින් පාලනය කරනු ලැබේ. එක්සත් රාජධානිය තුළ උණුසුම් පාන වෙළඳපොළෙහි ප්‍රමුඛතමයා වන්නේ ටාටා ග්ලෝබල් බෙවරේජ් ලිමිටඩ්, එනම් 15.1% ක ප්‍රමාණයක කොටසක් වන අතර අනෙක් පාර්ශවයන් වන්නේ යුනිලීවර් සහ නෙස්ලේ එස්.ඒ. ය.

පසුගිය දශක පහ තුළ එක්සත් රාජධානියෙහි ශ්‍රී ලංකා තේ අපනයන පහත වැටීමේ නැඹුරුවක් ඇති වීමට එරට වෙළඳ සහ පරිභෝජන රටා හා පුරුදු වල මූලික වෙනස්වීම බලපාන ලදී.

ගෘහස්ථව කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ඉහළ මට්ටමක පැවතීමෙන් දේශීය සමාජ ආර්ථික සාධක සමඟ අනුබද්ධිතව CTC තේ වලට සුහවාදීව එක්සත් රාජධානි වෙළඳපොළෙහි වෙනස්කම් සිදු විය. CTC තේ වලට ඇබ්බැහි වීම නිසා ඇති ඉල්ලුම විතැන් වීමේ හේතුන් ලෙස සාම්ප්‍රදායික තේ වලට වඩා කෙන්යාව සහ නැගෙනහිර අප්‍රිකාව වැනි රටවලින් ගෙන්වන තේ ඉහළ ප්‍රමාණයන්ගෙන් වැඩි වීම ගත හැකිය. තේ බෑග්/ පැකට් වලින් කහට රස ගන්වනු ලබන, එක්සත් රාජධානියෙහි දෛනිකව පානය කරන තේ කෝප්ප වලින් 96% ක් පමණ ප්‍රමාණයක් සඳහා තේ බෑග් / පැකට් සඳහා අධිකාරීත්වයක් සහිත වෙළඳපොළක් බවට එක්සත් රාජධානිය පරිවර්තනය විය.

## 2.6.4.2 පෝලන්තය



පෝලන්තය මධ්‍යම ප්‍රමාණයේ තේ ආනයනය කරන්නෙකු වන නමුදු යුරෝපා හවුලේ රටවල මුළු තේ ආනයනවලින් 11% ක ආසන්න අගයකට ආයක වෙමින් 2 වන ස්ථානයේ පසුවේ. වර්ෂයකට පෝලන්තට ආනයනය කෙරෙන තේ ප්‍රමාණය, වසරකට මෙ.ටො. 28,000 - 30,000 ක් අතර ප්‍රමාණයක පවතී. පෝලන්තය සංඛ්‍යාලේඛන මූලාශ්‍රයන්ට අනුව එරටට ගෙන්වන තේ වලින් වැඩි ප්‍රමාණය නිෂ්පාදිත රටෙන්ම ආනයනය කෙරේ. වර්තමානයේ පෝලන්ත වෙළඳපොළට තේ සපයනු ලබන විශාලතම නිර්යාතකරු කෙන්යාව වන අතර ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන වෙළඳපොළ කොටස 8% කි. සම්පූර්ණ තේ වෙළඳපොළෙන් 60.0% ක පමණම කළු තේය. හරිත තේ වෙළඳපොළ කොටසින් ආසන්න වශයෙන් 12% ක්ද වන අතර ඖෂධීය තේ වර්ග සඳහා ඉතිරිය වෙන් වේ. සාපේක්ෂව ගත් කළ පෝලන්ත ප්‍රති - අපනයන සුළු ප්‍රමාණයකි.

නිරන්තරයෙන් වර්ධනය වන, 65% ක පමණ වන පෝලන්ත වෙළඳපොළෙහි තේ පරිභරණය ගත් කළ මේ වන විට අවධානය යොමු කෙරෙනුයේ වඩාත් පහසු බෑග් කළ තේ වලටය. එහි ප්‍රතිඵලක් ලෙස, කළු තේ වෙළඳපොළෙහි විශේෂ කොටසක් CTC ආකාරයේ තේ සඳහා වෙන් වේ.

සංඛ්‍යාලේඛන වලට අනුව, ශ්‍රී ලංකාව විසින් හිමිකාරත්වය දරන තේ වෙළඳ ලකුණ යටතේ අගය එකතු කළ හෝ පෙර ඇසුරුම් කරන ලද තේ වලට මින් 40% ක්ම වෙන් වූ බව සඳහන් කිරීම වැදගත් වේ. 2012 වර්ෂයේ වාර්තා කළ රුපියල් මිලියන 1644, වර්ෂ 2011 දී වාර්තා කළ අගයට සාපේක්ෂව 8% වැඩි වීමකි

02

කර්මාන්තයේ පැතිකඩ

## 2.6.4.3 ප්‍රංශය



යුරෝපා සංගමයේ, වෙළඳපොළේ 6% ක කොටස් ප්‍රමාණයක් සමඟින් සිව් වැනි ස්ථානයේ සිටින විශාලතම ආනයනකරු ප්‍රංශය වේ. 2009 - 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ තේ අපනයනය මෙ.ටො. 19,300 - 17,800 අතර උච්චාවචනයට ලක් වූ අතර ශ්‍රී ලංකාව 7.2% ක වෙළඳපොළ දායකත්වයක් පෙන්නුම් කරයි.

මෙ.ටො. 10,000 ක් වන කළු තේ ආනයන මුළු ආනයනවලින් 51% ක් නියෝජනය කරනු ලබන අතර ඉතිරි හරිත තේ ආනයනය මෙ.ටො. 8,000 ක ප්‍රාමාණික අගයක් ගනී. එමෙන්ම ප්‍රංශය ඕලෝන්ග් තේ (Oolong tea) මෙ.ටො. 500 ක් ප්‍රමාණයක් ද ආනයනය කරනු ලබන අතර එය කළු තේ සංඛ්‍යාලේඛනවල ඇතුළත් වේ. ප්‍රංශයට ආනයනය කරනු ලබන තේ වලින් 70% ක් පමණ පෙර ඇසුරුම් කරන ලද ඒවා වන අතර ඉතිරි 30% ක් පමණක් තොග වශයෙන් ආනයනය කරනු ලැබේ. 14% ක වෙළඳපොළ දායකත්වයක් සහිතව ශ්‍රී ලංකාව ද කළු තේ සැපයුම්කරුවකු බවට පත් වී තිබේ. "ලංකා තේ" සැලකිය යුතු ප්‍රමාණයක් බෙල්ජියම, එක්සත් රාජධානිය සහ ජර්මනිය යන රටවලින් පැමිණෙන තේ වලද අන්තර්ගත වන බැවින් ප්‍රංශ වෙළඳපොළේ ශ්‍රී ලංකාවේ දායකත්වය වඩා වැඩි විය හැකිය. දළ වශයෙන් ප්‍රංශයට අපනයනය කරනු ලබන තේ වලින් 84% ක් පෙර සැකසුම් ආකාරයට පැවතී ඇත.

## 2.6.4.4 ජර්මනිය



ජර්මනිය යුරෝපා සංගමයේ දෙවන විශාලතම තේ ආනයනකරු වේ. මෙම රට තේ මෙ.ටො. 50,000 - 55,000 බැගින් වසරකට ආනයනය කරයි. ජර්මනිය යුරෝපයේ විශාලතම තේ ප්‍රති අපනයනකරු ලෙස නැගී සිටි අතර දේශීය වෙළඳපොළට 48% ක තේ ප්‍රමාණයක් ඉතිරිකර තබමින් සමස්ත ආනයනයන්ගෙන් 52% ක් විය. එසේම කලින් වර්ෂයේ ආනයන හා සසඳා බලන කළ 2012 වසරේ ආනයනය 3% ක වැඩිවීමක් පිළිඹිබු කරයි.

ශ්‍රී ලංකාව 10% ක වෙළඳපොළ දායකත්වයක් සහිත වන අතර මුළු ආනයනවලින් 72% ක් කළු තේ වන අතර 28% ක් වන ඉතිරිය හරිත තේ වේ. ජර්මනියේ හැම්බර්ග් වරාය ලෝකයේ වඩාත් සුවිශේෂී තේ කේන්ද්‍රස්ථාන වලින් එකක් ලෙස සැලකේ.

## 2.6.4.5 නෙදර්ලන්තය



2005 - 2012 කාලය තුළ රටට ගෙන්වන ලද තේ ප්‍රමාණය මෙ.ටො. 25,000 - 30,000 දක්වා අතර මට්ටම් හි උච්චාවචනය වී ඇත. කළු තේ සමස්ත ආනයන ප්‍රමාණයෙන් 93% ක් පමණ වන විශාලතම වෙළඳපොළ දායකත්වයක් දරයි.

7.2% ක වෙළඳපොළ දායකත්වයක් සහිතව ශ්‍රී ලංකාව ද තේ සැපයුම්කරුවකු බවට පත් විය. වෙළඳපොළෙහි කළු තේ දායකත්වය ආසන්න වශයෙන් 85% ක් වන අතර ඉතිරිය සඳහා හරිත තේ දායකත්වයක් දරයි. තේ මළු අංශය ද ඉතා ජනප්‍රිය වන අතර එය සිල්ලර විකුණුම්වලින් 90% කට වැඩි අගයක් ගනී. බොහෝ දෙනා හොඳ තත්ත්වයේ තේ අපේක්ෂා කරන බැවින් සුවිශේෂී වූ තේ සැල් සංඛ්‍යාව වැඩි වෙමින් පවත්නා බව සැලකේ.

### 2.6.4.6 බෙල්ජියම



කෝපි, මෘදු පානයක් සහ සෙසු බීම වර්ග සඳහා බලන කළ අඩු තේ පරිභෝජනය හේතු කොට ගෙන බෙල්ජියමේ තේ වෙළඳපොල සාපේක්ෂ වශයෙන් කුඩාය. ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 0.3 කට ආසන්න වේ. එය යුරෝපා සංගමයේ අලෙවි කොටසින් 1% කට වඩා අඩු අගයක් ගනී. බෙල්ජියමට ගෙන්වනු ලබන සමස්ත තේ ආනයනය එ.ජ.ඩො. මිලියන 50 කට ආසන්නය.

බෙල්ජියමේ ප්‍රමුඛ තේ වර්ගයක් වන්නේ ලිප්ටන්, පික්වික් සහ ට්විනිංග්ස් ය. බෙල්ජියමේ තේ බෙදාහරිනු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම සුපිරි වෙළඳසැල්, සුවිශේෂී සාප්පු සහ සිල්ලර ආහාර වෙළඳසැල් ජාලය හරහා ය. බෙල්ජියමේ විශාල සුපිරි වෙළඳසැල්වල වර්ග කිරීම් හි කළු තේ සාමාන්‍ය ප්‍රමාණය 35% කි.

විශේෂයෙන්ම ප්‍රතිලාභ හිමිකර දෙන තේ නිෂ්පාදන වන හරිත තේ ද සිරුර සිහින් කරවන තේ ඖෂධීය / සාම්ප්‍රදායික ඖෂධ තේ වැනි තේ පිටුපස සිටින වත්මන් ක්‍රියාත්මක බලය සෞඛ්‍ය සම්පන්න බව හා ගුණාත්මක බව වේ÷ කොළ තේ මෙන් සෞඛ්‍ය සම්පන්න නොවන බව සැලකෙන කළු තේ වල 2011 සහ 2012 වසරවල විකුණුම් ප්‍රමාණය පහත වැටී ඇති බව වාර්තා වී ඇත÷

## 2.6.5 ආසියාව / ඕෂනියා කලාපය

**2.24 වගුව ආසියාව / ඕෂනියා කලාපය අයත් රටවල ලංකා තේ සඳහා වන වෙළඳපොළ කොටස**

| සංඛ්‍යාව | රට | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| | | වෙළඳපොළ කොටස - % | | | |
| 1 | ඕස්ට්‍රේලියාව | 22 | 23 | 23 | 23 |
| 2 | චීනය | 8 | 12 | 20 | 28 |
| 3 | ජපානය | 22 | 27 | 28 | 26 |
| 4 | හොංකොං | 43 | 44 | 44 | 36 |
| 5 | තායිවානය | 5 | 6 | 7 | 7 |
| 6 | ඉන්දියාව | 5 | 1 | 1 | 2 |
| 7 | පාකිස්තානය | 2 | 1 | 1 | 4 |

දත්ත මූලාශ්‍රය : අන්තර්ජාතික තේ කමිටුව : වාර්ෂික සංඛ්‍යාලේඛන තොරතුරු ප්‍රකාශය 2013

### 2.6.5.1 ඕස්ට්‍රේලියාව



තේ පරිභෝජනය ප්‍රධාන වශයෙන් ම කළු තේ ස්වරූපයේ වන නමුදු ඉතා කුඩා ප්‍රමාණයක (ආසන්න වශයෙන් 3%) වන හරිත තේ දායකත්වය ධනාත්මක වර්ධනයක් පෙන්වා ඇත. ඕස්ට්‍රේලියාව ආනයන කරනු ලබන සමස්ත තේ ප්‍රමාණය ශ්‍රී ලංකාවේ 23% දායකත්වය ද සමග 2012 වසරේ දී මෙ.ටො. 11,800 ක් විය. ධාරිතාවයට අනුව කළු තේ වෙළඳපොළ දායකත්වය 90% ක අගයක් ගන්නා අතර පළතුරු / ඔසු තේ 4% ක් ද හරිත තේ 6% ක් ද විය.


Dilmah (16%), Twining (11%), Nerada (8%) සහ Madura (4%) යන වර්ග අභිබවමින් Lipton සහ Bushells යන වර්ග දෙක සමග යුනිලීවර් තේ 35% ක වෙළඳපොළ දායකත්වයක් දරයි. කළු සුවිශේෂී තේ, හරිත තේ සහ පළතුරු/ ඔසු තේ පිළිබඳව ඉල්ලුම වර්ධනය වෙමින් පවතී.

02

කර්මාන්තයේ පැතිකඩ

ඕස්ට්‍රේලියාවට අපනයනය කරන ලංකා තේ පරිමාව 2012 වසරේදී මෙ.ටො. 2739 ක් වූ අතර එය 2011 වසරේදී ලංකා තේ පරිමාව වූ මෙ.ටො. 2,686 ට සාපේක්ෂව මඳ ප්‍රමාණයකින් වැඩි වී ඇත. එම වැඩිවීම 2% කි. ඕස්ට්‍රේලියාවට අපනයනය කරනු ලබන සමස්ත ලංකා තේ, ප්‍රමාණය වන 83% (තේ බෑග් 67% හා ඇසුරුම් කරන ලද තේ 16%) සඳහා අගය එකතු කරන ලද සංරචකය දායක වේ.

## 2.6.5.2 චීනය



චීනයේ තේ නිෂ්පාදන මට්ටම ලෝක සැපයුමට 39% ක දායකත්වයක් ලබා දෙන විශාලතම තේ නිෂ්පාදකයා ලෙස 2012 වසරේදී කිලෝ මිලියන 1790 කට ළඟා වී ඇත. සමස්ත නිෂ්පාදන ධාරිතාවයෙන් ආසන්න වශයෙන් 77% ක් හරිත තේ වේ.

දේශීය පරිභෝජනය ප්‍රධාන වශයෙන් ම කළු තේ වන චීනයට කරනු ලබන සෘජු තේ අපනයන ලෝක වෙළඳ සංවිධානය සඳහා ප්‍රවේශවීමෙන් පසුව සහ ආනයන බදු මත තීරු බදු ක්‍රමිකව අඩුවීමෙන් පසුව පසුගිය වසර කිහිපය තුළ ඉතා එළදායී ලෙස කුඩා පදනමකින් වර්ධනය වෙමින් පවතී. චීනයට අපනයනය කරනු ලබන සමස්ත තේ ප්‍රමාණය මෙ.ටො. 12,200 - මෙ.ටො. 11,000 අතර උච්චාවචනය වේ. 2011 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ මෙ.ටො. 2,461 කට සාපේක්ෂව 2012 වසර තුළ මෙ.ටො. 3,084 ක ධාරිතාවයක් වාර්තා කරමින් චීනයට අපනයනය කරනු ලබන සමස්ත ලංකා තේ ප්‍රමාණය 25% ක අගයකින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

## 2.6.5.3 ජපානය



ලෝකයේ අතිනවීන හා සංවර්ධිත තේ වෙළඳපොල ලෙස ජපානය නිසැකවම සැලකේ. එලෙස සුවිශේෂ ස්ථානයක් හිමිකර ගෙන ඇති ජපානය, යම් තේ කර්මාන්තයක අවසන් ඉලක්කය ලෙස එකී මූලය සඳහා එම මූලික වෙනස්වීමට පිටුබලයක් මෙන්ම සෙසු නිෂ්පාදන රටවල් කෙරෙහි නිශ්චිත තරඟකාරී සීමාවක්ද විය හැකිය.

ලෝක තේ ක්ෂේත්‍රයෙහි, ජපානය, චීනය, ඉන්දියාව, රුසියාව, පාකිස්ථානය සහ ටර්කි රටවලට පසුව ටොන් 130,000 සිට 135,000 දක්වා වන ආසන්න ප්‍රමාණයක් වාර්ෂිකව පරිභෝජනය කරන ප්‍රමුඛ කාර්යයක නිරතව සිටී. හරිත තේ පරිභෝජනය ජපන් වෙළඳපොළ 70% කින් ග්‍රහණය කරගෙන ඇත. එසේම කළු තේ සඳහා ඉල්ලුම සෙමෙන් වර්ධනය වන නමුදු ස්ථාවරව පවතී. Oolong තේ අන්තර්ග්‍රහණය පහළ යන ප්‍රවණතාවයක් පිළිඹිබු කරන අතර හරිත, කළු Oolong සහ බාර්ලි වැනි සෙසු වර්ග වල තේ හැරුණු විට ජපානය වාර්ෂිකව ක්ෂණික තේ කි.ග්‍රෑ. 1.5 සිට 2.0 කට ආසන්න ප්‍රමාණයක් පරිභෝජනය කරනු ලබන ප්‍රශස්ත වෙළඳපොලක් සතුකරගෙන සිටී.

කෙසේ වුවද, කළු තේ සඳහා පවතින ඉල්ලුම පසුගිය දශක දෙක තුළ සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර එම වර්ධනය ධාරිතාවය අනුව 30% ක සංසිද්ධියකි.

ශ්‍රී ලංකාව 26% කට ආසන්න ප්‍රබල වෙළඳ හා මූලිකාරීත්වයක් සහිතව ජපානයේ කළු තේ ආධිපත්‍යය අඛණ්ඩව පවත්වාගෙන යයි. 2012 වසරේදී, 2011 වසරේ මෙ. ටො. 11,587 ට සාපේක්ෂව ශ්‍රී ලංකාව ජපානයට තේ මෙ.ටො. 9,545 ක් අපනයනය කර ඇති අතර එය ප්‍රමාණුකූලව 18% ක අඩු වීමකි.

### 2.6.5.4 හොංකොං



හොංකොං, එක් අතකින් දීර්ඝකාලීනව මුල්බැස ගෙන ඇති බ්‍රිතාන්‍ය ආභාෂය මෙන්ම අනෙක් අතින් චීන මච්චිමෙහි Green / Pierh තේ සංස්කෘතිය හේතුකොට ගෙන ශ්‍රේෂ්ඨ තේ සංස්කෘතියක් ප්‍රදර්ශනය කරයි. කෙසේවුවද, සෑම වසරකම හොංකොං සඳහා අනුග්‍රහය දක්වන සංචාරකයින් හා ආගන්තුකයින් මිලියන 30 ක් නිසා නේවාසිකයින් විසින් තේ උකහාගැනීම අඩුවිය යුතුය.

2012 වසරේ දී 36% ක වෙළඳපොළ කොටසක් සහිතව, ශ්‍රී ලංකාව හොංකොං තේ වෙළඳපොළෙහි ආධිපත්‍යය අඛණ්ඩව පවත්වාගෙන යයි. හොංකොං සඳහා අපනයනය කරන සමස්ත තේ සුළු වශයෙන් උච්චාවචනය වන නමුදු පසුගිය දශකය තුල ටොන් 9,000 සිට 12,000 දක්වා අතර පවතී. ශ්‍රී ලංකාව 2011 වසරේදී හොංකොං සඳහා අපනයනය කරන ලද මෙ.ටො. 5,145 ට සාපේක්ෂව, 2012 වසරේදී මෙ.ටො. 4,390 ක් අපනයනය කර ඇත. හොංකොං සඳහා ලංකා තේ අපනයනයෙහි අගය එකතු කරන ලද සංරචකය 21% කි.

### 2.6.5.5 තායිවානය



වර්තමානයේ දී, තායිවානයේ තේ නිෂ්පාදනය මෙ.ටො.17,000 කට ආසන්නව සීමා වී ඇති අතර ඒවා ලෝකයේ හොඳම තේ බවට නිශ්චිත වන Oolong තේ ලෙස වඩාත් උසස් තත්ත්වයක් හිමිකර ගෙන ඇත.

තායිවානයට ආනයනය කරනු ලබන සමස්ත තේ ප්‍රමාණය වසරකට මෙ.ටො. 25 - 30 ආසන්න බවට වාර්තා වේ. 2011 වසරේ සංඛ්‍යා ලේඛනවලට අනුව, තායිවානය සියළුම සම්භවයන්වලින් හරිත තේ මෙ.ටො. 3,640 ක් ආනයනය කර ඇත. ඒ චීනයට සහ ශ්‍රී ලංකාවට පිළිවෙළින් 18% ක සහ 7% ක අවස්ථා හිමිකර දෙමිනි. තායිවානයට අපනයනය කරන ශ්‍රී ලංකා තේ 2011 වසරේ වූ මෙ.ටො. 2,097 ට සාපේක්ෂව 2012 වසරේ දී මෙ.ටො. 1,935 ක් පෙන්නුම් කරයි. එය 2011 වසරට සාපේක්ෂව 8% කින් අඩුවීමකි. තායිවානයේ සමස්ත ආනයන අඩු වුවද වෙළඳපොළ දායකත්වය නොවෙනස්ව පැවතුණි.

### 2.6.5.6 ඉන්දියාව



ඉන්දියාව විවෘත වෙළඳපොළ ආර්ථිකයට සංවර්ධනය වෙමින් පවතින මුත් එහි අතීත වංශාධිපති ප්‍රතිපත්ති අනුගමනය තවදුරටත් පවතී. කාර්මික රෙගුලාසි අඩු වීම / ඉවත්වීම රාජ්‍ය සතු ව්‍යවසායන් පෞද්ගලීකරණය සහ විදේශ වෙළඳාම සහ ආයෝජන මත අවම කරන ලද පාලනයන් ඇතුළුව ආර්ථික ලිහිල් කරණය 1990 ගණන්වලට පෙරාතුව ආරම්භ විය. එසේම, 1997 පටන් වර්ෂයකට 7% කට වඩා සාමාන්‍ය ආර්ථික වර්ධනය කඩිනම්වීමට එය උපකාරී වී ඇත. වෙළඳපොළ සීමා ලිහිල් කිරීමට අනුව, ඉන්දියාවට තේ අපනයනය කිරීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට ලැබී තිබුණද, ඉන්දියාව ලෝකයේ දෙවන විශාලතම තේ නිෂ්පාදකයා වීම හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ වෙළඳපොළ දායකත්වය විශාල වූයේ නැත.

02

කර්මාන්තයේ පැතිකඩ

### 2.6.5.7 පාකිස්ථානය



පාකිස්ථානය ලෝකයේ තේ පරිභෝජනය කරන ප්‍රමුඛතම රටවල් අතුරින් එකක් බවට පත්ව ඇත. තේ වෙළඳපොළ ප්‍රමාණය වාර්ෂිකව මිලියන 190 - 200 ක් පමණ වේ. පාකිස්ථානයට තේ ආනයනය ඉහළ යමින් පවතී. 2012 වසරේදී, සමස්ත ආනයනල පෙර වර්ෂයේ ආනයනය කරන ලද මෙ.ටො. 122,530 ට සාපේක්ෂව මෙ.ටො. 129,238 ක ප්‍රමාණයක් වාර්තා වේ. පකිස්ථානු තේ සමායතනයට අනුව, තේ මෙ.ටො. 80,000 ක් පමණ විවිධ මාර්ගයන් ඔස්සේ පාකිස්ථානයට හොර රහසේ ගෙන්වනු ලැබේ.

පාකිස්ථානයට ගෙන්වන ලද කළු තේ සාමාන්‍ය මිල සම්භවය වූ රට සහ ගුණාත්මකභාවය අනුව වෙනස් වේ. කළු තේ අවම සාමාන්‍ය මිල චීනයෙන් කි. ග්‍රෑමයට ඇ.එ.ජ.ඩො. 0.90 ක් ලෙස වාර්තා වන අතර ඉහළම සාමාන්‍ය මිල ශ්‍රී ලංකාවෙන්, කි.ග්‍රෑමයකට ඇ.එ.ජ.ඩො. 3.46 ක් ලෙස වාර්තා වේ.

ශ්‍රී ලංකාවෙන් පාකිස්තානයට අපනයනය කරනු ලබන තේ 2012 වසරේදී සුවිශේෂී වැඩිවීමක් පෙන්නුම් කරයි. එ 2011 වසරේ දී වාර්තා වූ මෙ.ටො. 1057.7 සමඟ සසඳා බලන කල මෙ.ටො. 4,675 ක් ලෙස වාර්තා වෙමිනි. (300% කට වඩා වැඩිවීමකි). කෙන්යානු තේ මිල ගණන් වැඩිවීමේ වාසිය සහ පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පවතින බදු සහන යනාදිය සැලකිල්ලට ගෙන ලංකා තේ, පාකිස්ථානයේ දී ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයන් මෙමගින් විද්‍යාමාන වේ.

1970 හා 1980 වසරේ මුල් භාගයේදී, ශ්‍රී ලංකාව පාකිස්ථානයේ තේ වෙළඳපොළ ප්‍රමුඛයා විය. කොළඹ වෙන්දේසි මිල ගණන් ඉහළ යාමත් සමඟ වෙළඳපොළ දායකත්වය අඩු වූ අතර පාකිස්ථානු ආනයනකරුවෝ ලාභදායී මිල ගණන් වෙනුවෙන් කෙන්යාවේ CTC තේ වෙත ප්‍රවේශ වූහ.

## 2.6.6 ඇමෙරිකානු කලාපය

**2.22 වගුව ඇමෙරිකානු කලාපයට අයත් රටවල ලංකා තේ සඳහා වන වෙළඳපොළ කොටස**

| සංඛ්‍යාව | රට | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| වෙළඳපොළ කොටස - % | | | | | |
| 1 | ඇමරිකා එක්සත් ජනපදය | 2 | 3 | 3 | 3 |
| 2 | කැනඩාව | 4 | 5 | 4 | 3 |

දත්ත මූලාශ්‍රය : අන්තර්ජාතික තේ කමිටුව : වාර්ෂික සංඛ්‍යාලේඛන තොරතුරු ප්‍රකාශය 2013

### 2.6.6.1 ඇමරිකා එක්සත් ජනපදය



රුසියාව සහ පාකිස්ථානයට පසුව 2012 වසරේ මෙ.ටො. 125,500 ක වාර්තා වූ අපනයන සහිතව ඇමරිකා එක්සත් ජනපදය ලෝකයේ තුන්වන විශාලතම තේ අපනයන රට බවට පත් වී ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ තේ වෙළඳපොළ ප්‍රධාන කාණ්ඩ 4 ක් යටතේ වර්ගීකරණයට මේ අතර ලක්කර ඇත. එනම්, සාම්ප්‍රදායික තේ (තේ බෑග්, තේ කොළ) RTD තේ (ටින් සහ බෝතල්) සේවා කර්මාන්ත (හෝටල්, අපනශාලා ආදිය) සහ සුවිශේෂී තේ (තේ සැලුන්, gourmet. තේ සාප්පු යනාදිය) එකී සියලු දෑ පසුගිය වසර කිහිපය තුළ වර්ධනය වී ඇත. RTD කාණ්ඩය සුවිශේෂී තේ අභිබවා ප්‍රශස්ත වර්ධනයක් වාර්තා කර ඇත.

ඇමරිකා එක්සත් ජනපදයට ලංකාවෙන් අපනයනය කරනු ලබන තේ ප්‍රමාණය වාර්ෂිකව මෙ.ටො. 2,500 - 3,500 දක්වා වේ. 2012 වසර තුළ ශ්‍රී ලංකාව වෙළඳපොළ දායකත්වය 3% ක් වශයෙන් තේ මෙ.ටො. 3,277 ක් අපනයනය කර ඇත.

### 2.6.6.2 කැනඩාව



2010 වසර තුළ කැනේඩියානු තේ වෙළඳපොළ ධාරිතාවෙන් ඉහළ ගියේය. එසේම අගය එකතු කරන ලද තත්ත්වයේ උසස් නිෂ්පාදන සඳහා අතිරේකව ගෙවීමට කැනේඩියානු පාරිභෝගිකයන්ගේ රුචිකත්වය පළ කිරීම සනාථ කරමින් වටිනාකම අනුවද වර්ධනය විය. කැනඩාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණය පසුගිය වසර කිහිපය තුළ මෙ.ටො. 17,000 සිට මෙ.ටො. 19,000 දක්වා වාර්ෂිකව ආසන්න ප්‍රමාණයකින් වැඩි වී ඇත.

ශ්‍රී ලංකාව 3% ක වෙළඳපොළ දායකත්වයක් සහිතව එක් තේ සැපයුම්කරුවෙකු බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවෙන් කැනඩාවට අපනයනය කරන තේ ප්‍රමාණය පසුගිය කාලයේදී මෙ.ටො. 1,000 ට වැඩි විය. 2010 වසරේ සිට ඉදිරියට, ලංකා තේ වල පවතින ඉහළම මිල ගණන් නිසා (loose) සුළු තේ වර්ගීකරණයේ සැලකිය යුතු පහළ බැසීමක් හෙවත් ශ්‍රී ලංකාවේ අපනයන තේ ප්‍රමාණය අඩු වී ඇත. හරිත තේ වල පවත්නා වූ සෞඛ්‍යදායීබව හේතුකොටගෙන හරිත තේ පරිභෝජනය සඳහා වැඩි රුචිකත්වයක් කැනඩාවෙහි සීඝ්‍ර ලෙස වර්ධනය වේ. සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය ලීටර් 70 ක ප්‍රමාණයක් ලෙස වාර්තාවෙමින් පසුගිය වසර 5 තුළ දී සුවිශේෂී වර්ධනයක් පිළිඹිබු කර ඇත.


වෙළඳපොළ දායකත්වය 7% ක් ලෙස උරුම කරගනිමින් ශ්‍රී ලංකාව ප්‍රමුඛ කළු තේ සැපයුම්කරුවන් අතරින් එක් රටක් ලෙස තවදුරටත් රැඳී සිටියි. "Tata Global Beverages" ආයතනයේ පවත්නා ඉහළ මට්ටමේ උපයෝජන කටයුතු හේතුවෙන් ඉන්දියාවේ සැපයුම්වල ක්ෂණික ඉහළයාම නිසා පසුගිය වර්ෂ කිහිපය තුළ වෙළඳපොළේ ශ්‍රී ලංකාවේ සහ කෙන්යාවේ තත්ත්වය පහළ ගොස් ඇත.

# තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්


Seminars conducted for tea factory owners


Up-country tea factory


Sorting of green leaves



Green tea leaf count


Roll breaking


Shifting room

# 3.තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම් 03

## 3.1.තේ කොමසාරිස්වරයාගේ අංශයේ කාර්යය සාධනය

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

1976 ජනවාරි 01 දින සිට තේ කොමසාරිස්වරයා වෙත අභිනියෝජනය කරන ලද තේ කර්මාන්තයේ සංවර්ධනය, නිෂ්පාදනය, බෙදා හැරීම, නියාමනය කිරීම සම්බන්ධයෙන් අදාළ වු 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල ව්‍යවස්ථාව සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත ප්‍රකාරව තේ කොමසාරිස්වරයාගේ අංශය විසින් නියාමන කටයුතු හා සම්බන්ධ සියලුම කාර්යයන් පාලනය කරනු ලැබේ.

තේ කොමසාරිස්වරයාගේ අංශයේ කාර්යයන් ගාල්ල, මාතර, රත්නපුර, ගම්පොල, හැටන්, බණ්ඩාරවෙල සහ මතුගම පිහිටි ප්‍රාදේශීය කාර්යාල 07 කට විමධ්‍යගත කර ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කොමසාරිස්වරයාගේ අංශයේ මගින් තේ කර්මාන්තයේ චිරස්තිථිය උදෙසා පහත කාර්යයන් ඉටු කරනු ලබයි÷

- තේ නිෂ්පාදනය සඳහා අදාළ වන සංඛ්‍යා ලේඛන එකතු කිරීම.
- තේ නිෂ්පාදනය සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සහ ලියා පදිංචිය අළුත් කිරීම÷
- හරිත තේ දළුවල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා වැඩසටහන්.
- කර්මාන්තශාලා නවීකරණයට සහ නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබාදීම. (අතරමැදි වගා කිරීම් සහ නව වගා කිරීම ඇතුළුව)
- කර්මාන්තශාලා සහ බෙදාහරින්නන් සඳහා සාධාරණ මිළ ගණන්.
- යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ විශේෂ විමර්ශනය (GMP)
- හරිත තේ බෙදාහරින්නන් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම.
- කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සහ බෙදාහරින්නන් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා තේ මණ්ඩල/ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනවල නිෂ්පාදනයන්හි ගුණාත්මක බව සහතික කරනු ලබන වැඩසටහන් මෙහෙයවීම.

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල ව්‍යවස්ථාවේ 25 වල වගන්තිය යටතේ සකස් කරන ලද සහ තේ කොමසාරිස්වරයා වෙත අභිනියෝජනය කරන ලද රෙගුලාසි පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නිමි තේ සඳහා පිරිසැකසුම් සහ සනීපාරක්ෂක ප්‍රමිතිය) රෙගුලාසි - 1986

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නැවත වගා කිරීම සහ කර්මාන්තශාලා නවීකරණ සහනාධාර වැඩසටහන)

### 3.1.1. ප්‍රධාන ජයග්‍රහණ

පසුගිය වසර ගණනාව හා සංසන්දනය කරන විට, 2012 වර්ෂය තුළ මෙම අංශය මගින් ප්‍රධාන ජයග්‍රහණ කිහිපයක් අත්පත් කර ගන්නා ලදි.

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

එසේ ළඟා කරගත් ප්‍රධානතම ජයග්‍රහණයන් ලෙස බදු පැහැර හරින්නන් සහ අංශය මගින් දඩ මුදල් යෝජනා ක්‍රමයේ සංශෝධනයක් හඳුන්වා දීම දැක්විය හැකිය. 2012 වර්ෂය තුළ ඇරඹීම කරන ලද තවත් ප්‍රධානතම සංවර්ධන කාර්යයක් වන්නේ " B Leaf 60 program" වැඩසටහන හඳුන්වා දීමය. 2012 වර්ෂය තුළ, මිල ගණන් දැන ගැනීම සඳහා කෙටි පණිවුඩ ක්‍රමයක් ස්ථාපිත කිරීමත්, දේශීය වෙළඳපොළ සඳහා ප්‍රමිතීන් සංවර්ධනය කිරීමත් සිදු කරන ලදි.

## 3.1.2. නිෂ්පාදකයන් සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

1957 අංක 51 දරණ තේ පාලන පනත යටතේ, තේ නිෂ්පාදකයන් සම්බන්ධයෙන් වන නිපදවන්නන්ගේ ලේඛනයක් තේ කොමසාරිස්වරයාගේ අංශයෙන් පවත්වාගෙන යනු ලබන අතර එවන් නිෂ්පාදකයන් ලියාපදිංචි විය යුතු තේ කර්මාන්තශාලාවලට අදාළ වන කරුණු නිර්දේශ කර ඇත. මෙම පනතේ අරමුණ සඳහා කවර හෝ පුද්ගලයෙකු, නිශ්පාදකයෙකු වශයෙන් ලියාපදිංචි කළ යුතු ද යන්න පිළිබඳව තීරණය කිරීමේ බලය අංශය සතු වේ. වෙන්දේසි මධ්‍යස්ථාන හරහා තේ විකිණීම හා තේ නිෂ්පාදනය කිරීම සඳහා සෑම තේ නිෂ්පාදකයෙකුම තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය.

ගොඩනැගිලි, උපකරණ සහ වඩාත් ගුණාත්මක බවින් යුතු තේ නිෂ්පාදනයට කර්මාන්ත ශාලාවේ මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන ආකාරය ප්‍රමාණිකව හේතු සාධකවන බවට, කර්මාන්ත ශාලාවෙන් නිපදවනු ලබන තේවල ගුණාත්මක බව අධීක්ෂණය කිරීම සඳහා සහය වීමට කසල තේ බැහැර කිරීම පාලනය කිරීමට හැකියාව ලබා දීම සහ සාධාරණ මිළ සංයුතියක් ක්‍රියාවට නැංවීම සහතික කරනු පිණිස නිම් තේ නිෂ්පාදනය කරනු ලබන සෑම කර්මාන්ත ශාලාවක්ම තේ මණ්ඩලයේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රභේදයන් අනුව සිදු කරනු ලබන මෙහෙයුම් කටයුතු වර්ගීකරණය සහ තේ නිෂ්පාදන මිළට ගැනුම් 3.1 වගුවෙන් පෙන්නුම් කෙරේ.

**3.1 වගුව මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය**

| තත්ත්වය | ඉහළ | මධ්‍යම | පහළ | එකතුව |
|---|---|---|---|---|
| 1. ස්වකීය තේ දළුවලට සීමා ව | 69 | 15 | 6 | 90 |
| 2. ස්වකීය තේ දළු හා මිලදී ගන්නා ලද තේ දළු<br>a) සමස්ත නිෂ්පාදනයෙන් 50% ට අඩු ස්වකීය තේ දළු | 21 | 38 | 157 | 216 |
| b) සමස්ත නිෂ්පාදනයෙන් 50% ට වැඩි ස්වකීය තේ දළු | 72 | 30 | 15 | 117 |
| 3. මිලදී ගන්නා ලද තේ දළු පමණක් | 7 | 25 | 247 | 279 |
| 4. ලියාපදිංචි කරනු ලැබුව ද මෙහෙයුම් සිදු නොකරන තේ කර්මාන්ත ශාලා | 35 | 81 | 81 | 197 |
| 5. ලියාපදිංචි කරන ලද සමස්ත තේ කර්මාන්ත ශාලා ගණන | 204 | 181 | 506 | 891 |
| 6. මෙහෙයුම් සිදුකරනු ලබන සමස්ත ලියාපදිංචි තේ කර්මාන්තශාලා ගණන | 169 | 108 | 425 | 702 |

# 3.1.3. තේ දළු මිළට ගැණුම් සඳහා ගෙවිය හැකි සාධාරණ මිළ ගණන්.

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

තේ පාලන පනතේ විධි විධාන යටතේ, මිළට ගත් තේ දළු නිෂ්පාදනයේ යෙදී සිටින කර්මාන්ත ශාලා, එම කර්මාන්තශාලාවල නිපදවනු ලබන නිමි තේ වලින් උපයා දෙනු ලබන මිළ පිළිබඳව අවධානය යොමු කර තේ කොමසාරිස්වරයාගේ නිර්දේශිත මිළ ගණන් මත පදනම් ව මිළට ගත් තේ සඳහා සාධාරණ මිළක් ගෙවීම අවශ්‍ය වේ. හරිත තේ දළු සැපයුම්කරුවන් සඳහා කර්මාන්ත ශාලාවලින් ගෙවිය යුතු සාධාරණ මිළ තීරණය කරන ලද්දේ එවන් කර්මාන්තශාලාවල මාසික ශුද්ධ විකුණුම් සාමාන්‍ය මත පදනම්වය. නිමි තේ විකුණුම්වලින් ලැබෙන මුදල්, තේ දළු සැපයුම්කරුවන් සහ කර්මාන්ත ශාලා අතර 68:32 අනුපාතයට බෙදිය යුතු වේ. කර්මාන්තශාලා විකුණුම් සාමාන්‍ය මාසික උන්නතාංශික සාමාන්‍ය ඉක්මවා යන්නේ නම් වෑද්ධි ආදායම් 50:50 අනුපාතයට කොටස් කෙරේ. හරිත තේවල සිට නිමි තේ දක්වා නිෂ්පාදිත ප්‍රමාණ අනුපාතය 21.5% යන සූත්‍රය පදනම්ව ඇත.

## 3.1.3.1. පැහැර හරින ලද ගෙවීම්

සමාලෝචනයට ගැනෙන වර්ෂය තුළදී, හරිත තේ සපයුම්කරුවන් වෙත පැහැර හරින ලද මුළු ගෙවීම් ප්‍රමාණය 2012 දෙසැම්බර් 31 දිනය වන විට රු.මි. 83.4 ක් ලෙස සටහන් කර ඇත. එමෙන්ම 2012 වර්ෂයේ දී රු.මි. 94.23 ක් අප විසින් අය කරගෙන ඇත. තවද, පැහැර හරින ලද ගෙවීම්වල එකතුව, ඔවුන්ගේ ලියාපදිංචිය අත්හිටුවීම හේතුවෙන් බාධා විය. එවන් කර්මාන්තශාලා නැවත ලියාපදිංචි කිරීම පිළිබඳව සලකා බලනු ලබන්නේ එම කර්මාන්තශාලා විසින් මුලු පැහැර හරින ලද මුදල් ප්‍රමාණය ගෙවා නිරවුල් කිරීමෙන් අනතුරුව පමණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පැහැර හරින ලද ගෙවීම් වටිනාකම 22÷6% ක අඩුවක් සිදු විය.

# 03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

**3.2 වගුව - පැහැර හරින ලද ගෙවීම්**

| කලාපය | 2012.01.01 දිනට මුදල | 2012 වර්ෂයේදී එකතු කරන ලද මුදල | අයකරගන්නා ලද සහ ගෙවූ මුදල | 31.12.2012 වන දිනට කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය | වසා දැමූ කර්මාන්ත ශාලාවලින් අයවිය යුතු මුදල | මෙහෙයුම් කටයුතු සිදුකරමින් සිටින කර්මාන්ත ශාලාවලින් අයවිය යුතු මුදල |
|---|---|---|---|---|---|---|
| රත්නපුර | 50,092,153.86 | 16,502,078.90 | 32,629,413.75 | 33,964,819.07 | 16,368,758.24 | 17,596,060.77 |
| මාතර | 4,063,243.93 | - | 1,409,470.38 | 2,653,773.55 | 2,639,004.69 | 14768.86 |
| ගම්පොල | 14,868,452.26 | | 367,230.30 | 14,501,221.96 | 10,900,641.81 | 3,600,580.00 |
| ගාල්ල | 15,002,386.38 | 645,358.11 | 1,198,095.59 | 14,449,648.90 | 10,559,979.15 | 3,889,669.74 |
| මතුගම | 23,014,567.76 | 6,584,587.45 | 21,101,349.00 | 8,497,807.02 | 6,754,435.21 | 1,743,371.00 |
| හැටන් | 1,413,022.12 | 29,299.54 | 189,187.90 | 1,253,133.76 | 308,737.06 | 944,396.70 |
| බණ්ඩාරවෙල | 8,055,009.59 | 37,363,498.91 | 37,335,604.62 | 8,082,903.88 | 847,287.30 | 7235616.58 |
| එකතුව | 116,508,835.90 | 61,124,822.91 | 94,230,351.54 | 83,403,308.14 | 48,378,843.46 | 35,024,463.65 |

## 3.1.4. හරිත තේ දළුවල ගුණාත්මක බව පාලනය කිරීම

නිමි තේවල ගුණාත්මක බව පවත්වා ගැනීම සඳහා, ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙහෙයුම් ක්‍රියාවලියේ ස්වභාවයේ යෝග්‍ය තත්ත්වයන් පැවතීම අනිවාර්යය වේ. එබැවින්, ගුණාත්මක බවින් යුතු නිමි තේ නිෂ්පාදනය කිරීම සඳහා ඉහත කොන්දේසි උපකාරී නොවේ නම්, තේ පාලන පනත යටතේ එවන් කර්මාන්ශාලාවල ලියාපදිංචි අවලංගු කිරීමේ බලය තේ කොමසාරිස්වරයා සතු වේ.

මිළට ගත් තේ දළුවලින් සිදු කරන නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා හරිත තේ දළුවල තත්ත්ව පාලනය බෙහෙවින් වැදගත් කරුණක් වේ. ගුණාත්මක බවින් ඉහළ හරිත තේ දළු නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදා ගන්නේ නම් නිමි තේවල ගුණාත්මක බව ද ඉන් ඉහළ නැංවෙනු ඇත. එමෙන්ම එය, හරිත තේ දළු වෙළඳාම් වලදී මෙන්ම තේ නිෂ්පාදනයේ දී වඩාත් ප්‍රතිලාභ ගෙනදෙන්නක් වනු ඇත. කවර හෝ කර්මාන්ත ශාලාවක් ගෙවීම් පැහැර හරින කර්මාන්ත ශාලාවක් ලෙස හඳුනා ගැනේ නම්, කර්මාන්ත ශාලාවේ ලියාපදිංචිය අත් හිටුවීමට හෝ අවලංගු කිරීමට ලක්වනු ඇතැයි එම අනතුරු අඟවනු ලැබේ.

හරිත තේ දළු ප්‍රමිතීන් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2010 දෙසැම්බර් 14 දින ගැසට් නිවේදනයක් ප්‍රසිද්ධියට පත් කර ඇත. තේ පාලන පනත යටතේ, තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව නියාමනය කිරීමට හා වර්ධනය කිරීමට තේ කොමසාරිස්වරයාගේ අංශය වෙත බලය පවරා ඇති අතර තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම උදෙසා පහත සඳහන් ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන/ශ්‍රී ලංකා තේ මණ්ඩල තත්ත්ව සහතික.
2. තේ දළුවල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා B Leaf 60 උපාය මාර්ගය.
3. උත්සව සමයේ දී කඩිනම් අස්වනු කළමනාකරණ වැඩසටහන
4. උඩු මට්ටමේ NSA උපාය මාර්ගය.
5. තත්ත්ව මෙහෙයුම් පද්ධතිය (කාර්යය කණ්ඩායම් මෙහෙයුම Task Team Operation – TTO)
6. කර්මාන්තශාලා නවීකරණ සහනාධාර වැඩ පිළිවෙල.
7. තේ නැවත වගා කිරීමේ සහනාධාර වැඩපිළිවෙල.
8. කර්මාන්තශාලාව පදනම් වූ තේ සංවර්ධන වැඩසටහන.

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

9. හරිත තේ බෙදා හරින්නන් පුහුණු කිරීමේ වැඩසටහන (NIPM)
10. තේ කර්මාන්ත ශාලාවල යහපත් නිෂ්පාදන ක්‍රියාවලියන් ස්ථාපිත කිරීම.

### 3.1.4.1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන - ශ්‍රී ලංකා තේ මණ්ඩල තත්ත්ව සහතිකය.

නිෂ්පාදන ක්‍රියාවලිය සහ අවසන් නිෂ්පාදනය එනම් කළු තේ සහතික කිරීම සඳහා නිෂ්පාදන සහතික කිරීමේ වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහය ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙහෙයවනු ලැබේ.

මෙම වැඩසටහන, පිරිසැකසුම් පාලනයේ අතිරේක අවශ්‍යතා සමග එක්ව තත්ත්ව කළමනාකරණ පද්ධතියේ අත්‍යාවශ්‍ය මූලිකාංග කෙරෙහි යොමු වී ඇති අතර අවශ්‍ය නෛතික අවශ්‍යතා සමග අදාළ ප්‍රමිතීන්වල දක්වා ඇති නිෂ්පාදන පරික්ෂාවන් කෙරෙහිද යොමු වී ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන ශ්‍රී ලංකා තේ මණ්ඩල, තේ නිෂ්පාදන සහතික කිරීමේ ව වැඩ පිළිවෙල, අවසන් පාරිභෝගිකයාට ගුණාත්මක බවින් ඉහළ කළු තේ සැපයීම සඳහා තුන්වන පාර්ශ්වීය සහතිකයක් ලබාදීමට අපක්ෂපාතී වෙනස්කමක් සිදු නොවන අයුරින් විනිවිද බවකින් යුතුව ක්‍රියාත්මක කරනු ලැබේ.

### 3.1.4.2. තේ දළුවල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා B Leaf 60 උපාය මාර්ගය

පසු අස්වනු නාස්තිය අවම කිරීම හා තේ දළු නෙලීමේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම තුළින් තේ දළුවල ගුණාත්මක බව ඉහළ නැංවීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.දැනට පවත්නා තේ දළු ප්‍රමිතීන් වන්නේ හොඳම තේ දළු 33% ක් ද, හොඳම තත්ත්වයට තරමක් පහළින් 32% ක් ද, අවම තත්ත්වයේ 35% ක් ද වශයෙනි. කෙටි කාල පරිච්ඡේදයක් තුළ හරිත තේ දළුවල ප්‍රමිතිය අවම වශයෙන් 60% ක් ලෙස (හොඳම තේ දළුවල ප්‍රමිතිය) පවත්වා ගෙන යාමේ ඉලක්කය සහිතව මෙම බී ලීෆ් 60ම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම ඉලක්කය කරා ළඟාවීම සඳහා පහත සඳහන් උපාය මාර්ග දැනටමත් ක්‍රියාවට නංවා ඇත.



1.පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

2.තේ දළු පිළිබඳ කටයුතු කිරීම සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීම.

3.පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය සහයෝගය ලබා දීම.

# 03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්






*Awareness programs for stakeholders*

### 3.1.4.3.උත්සව සමයේ කඩිනම් අස්වනු කළමනාකරණ වැඩසටහන්

උත්සව සමයේදී තේ කර්මාන්ත ශාලා දීර්ඝ කාලයක් වසා තැබීම හේතුවෙන් අස්වනු අලාභ අවම කර ගැනීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය සකස් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2005 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද අතර එතැන් පටන් විවිධ කාර්යයන් හඳුන්වා දීම තුළින් මුලුමනින්ම පාහේ අස්වනු අලාභයන් පාලනය කිරීමට තේ කොමසාරිස්වරයාගේ අංශයට හැකියාව ලැබී ඇත. උත්සව සමයේ තේ කර්මාන්ත ශාලා වසා දැමීම, 2012 අප්‍රේල් මස 11 වන දින සිට 16 වන දින දක්වා සීමා කරන ලදී.

### 3.1.4.4. උඩු මට්ටමේ NSA උපාය මාර්ගය

NSA ඉණිමගෙහි පහතම ඉනිමං පෙත්වල තිබෙන තේ කර්මාන්ත ශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සකස් කර ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, හරිත තේවල මෙන්ම තේ නිෂ්පාදනයේ ද ප්‍රමිතීන් ඉහළ නංවමින් මෙම කර්මාන්ත ශාලාවල NSA ඉහළ මට්ටමකට රැගෙන ඒමයි.

### 3.1.4.5. තත්ත්ව මෙහෙයුම් පද්ධතිය (කාර්යය කණ්ඩායම මෙහෙයුම - TTO )

2012 වර්ෂයේ දී තේ කොමසාරිස්වරයාගේ අංශය විසින් හදිසි පරීක්ෂන 36 ක් තේ කර්මාන්තශාලාවල සිදු කරන ලදි.

3.3 වගුව කාර්යය කණ්ඩායම් මෙහෙයුම

| ප්‍රදේශය | සිදුකරන ලද පරීක්ෂණ ගණන |
|---|---|
| බණ්ඩාරවෙල | 0 |
| ගම්පොළ | 6 |
| රත්නපුර | 16 |
| මාතර | 7 |
| ගාල්ල | 1 |
| මතුගම | 6 |

### 3.1.4.6. කර්මාන්ත ශාලා නවීකරණ සහ තේ නැවත වගා කිරීමේ සහනාධාර වැඩ පිළිවෙල

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අයවැයෙන් තේ සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාරය විසින් දේශීය අරමුදල් යටතේ අරමුදල් වෙන් කර ඇත. එම වෙන් කරන ලද අරමුදල්, කර්මාන්ත ශාලා නවීකරණයට සහ තේ වගා කිරීම සඳහා වන සහනාධාර වැඩපිළිවෙල සඳහා වර්ෂය තුළදී යොදා ගැනේ.

තේ නැවත වගා කිරීම සහ කර්මාන්ත ශාලා නවීකරණය කිරීම සඳහා, සංස්ථා මෙන් ම පෞද්ගලික අංශය සඳහා ද 2012 වර්ෂයේ දී අරමුදල් පැවතිණ. මෙම අරමුදල්වලින් පෞද්ගලික අංශයේ හිමිකාරිත්වය සහිත තේ කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම සඳහා 45% ක් ද ඉතිරිය සංස්ථාපිත අංශයේ තේ කර්මාන්ත ශාලා නවීකරණයට සහ නැවත වගා කිරීම සඳහා ද වෙන් කරන ලදී.

### 3.1.4.7.කර්මාන්ත ශාලා මත පදනම් වූ තේ සංවර්ධන වැඩසටහන(FBTDP)

කර්මාන්ත ශාලා මත පදනම් වූ තේ සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ පර්යේෂණ ආයතනයේ සහ කුඩා තේ වතු සංවර්ධනඅධිකාරියේ සහය ඇතිව,



Sri Lankan Tea Plucker

කුඩා තේ වතු හිමියන්ගේ සහ තේ කර්මාන්ත ශාලාවල ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් සකස් කර ඇත.

කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතාව අධීක්ෂණය කිරීම සහ හරිත තේ දළු පාලනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන මගින් ව්‍යාප්ති නිලධාරියෙකු (ක්ෂේත්‍ර සම්බන්ධීකාරක) පත් කිරීම සඳහා සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන 2012 වර්ෂය සඳහා සියලුම තේ වැවෙන ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.



### 3.1.4.8. තේ කර්මාන්ත ශාලාවල යහපත් නිෂ්පාදන පරිචයන් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ සියලුම කර්මාන්ත ශාලා තක්සේරු කරනු ලබන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා පියවර ගනු ලැබීය.

**3.4 වගුව- යහපත් නිෂ්පාදන පරිචයන් සඳහා ප්‍රාදේශීය වශයෙන් තක්සේරු කිරීම.**

| කලාපය | ය.නි.ක්‍රි. තක්සේරු කිරීම |
|---|---|
| බණ්ඩාරවෙල | 5 |
| ගම්පොල | 65 |
| ශැටන් | 26 |
| රත්නපුර | 16 |
| මාතර | 45 |
| ගාල්ල | 26 |
| මතුගම | 28 |
| එකතුව | 211 |

## 3.1.5. හරිත තේ දළු බෙදා හරින්නන්හට බලපත්‍ර ලබා දීම

තේ පාලන පනත ප්‍රකාරව, සියලුම හරිත තේ දළු බෙදා හරින්නන්, තේ කොමසාරිස්වරයාගේ අංශයෙන් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වේ

## 3.1.6. කසල තේ පිරිසැකසුම

කසල තේ පිරිසැකසුම, පරිභෝජනයට නුසුදුසු කසල තේවලින් පරිභෝජනය කළ හැකි කසල තේ වෙන්කර ගැනීම සඳහා සිදුකරන ක්‍රියාවලියකි. කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ වැඩපිළිවෙලක් 2009 වර්ෂයේ සිට ස්ථාපිත කර ඇත. 3.7 වගුවෙන් දැක්වෙන්නේ 2012 වර්ෂය තුළ කලාපීය මට්ටමින් නිකුත් කරන ලද සමස්ත බලපත්‍ර සංඛ්‍යාව වේ.

**3.7 වගුව 2012 වර්ෂයේදී කසල තේ පිරි සැකසුම් මධ්‍යස්ථාන සඳහා නිකුත් කරන ලද බලපත්‍ර.**

| කලාපය | 01.01.2012 දින වනවිට ලියාපදිංචි පිරිසැකසුම් කරුවන් | වර්ෂය තුළ අළුත් කිරීම | වර්ෂය තුළ නව නිකුත් කිරීම් | 31.12.2012 දිනට එකතුව | 31.12.2012 දිනට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 2 | 1 | 0 | 1 | 283 |
| හැටන් | 3 | 238 | 49 | 287 | 1058 |
| ගම්පොල | 235 | | | 0 | |
| මාතර | 10 | 10 | 3 | 13 | 572 |
| ගාල්ල | 31 | 31 | 14 | 45 | 442 |
| රත්නපුර | 4 | 4 | 3 | 7 | 895 |
| මතුගම | 2 | 2 | 4 | 6 | 249 |
| එකතුව | 287 | 286 | 73 | 359 | 3499 |




Colombo Harbour

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

# 3.2.තේ අපනයන අංශය

1959 අංක 16 දරන තේ පනතේ (අපනයන මිළ බදු සහ පාලනය) බලතල සහ කාර්යයන් මෙන් ම 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ සකස් කරන ලද රෙගුලාසි තේ අපනයන අංශය විසින් මෙහෙයවනු ලැබේ. තේ අපනයනකරුවන් තේ ඇසුරුම්කරුවන්, තොග ගබඩා, ආනයනකරුවන් සහ ඇසුරුම් වර්ග ලියාපදිංචි කිරීම, තේ පිළිබඳ තොරතුරු ලබා ගැනීම, තේවල අවම ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම, තේ අපනයන සඳහා බලය ලබා දීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛන එකතු කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් අධීක්ෂණය කිරීම (ඉන්දු ශ්‍රී ලංකා /පකිස්තාන් , ශ්‍රී ලංකා) සඳහා අදාළ වූ කාර්යයන් අංශය විසින් ඉටු කරනු ලබයි.

## 3.2.1. ප්‍රධාන ජයග්‍රහණ

2012 වර්ෂය තුළ උණුසුම් මුද්‍රා තබන ලද නියැදි ඇසුරුම් මෙන් ම කණ්ඩායම් චාරිකා සහිතව තත්ත්ව පරීක්ෂණ හා නියැදි සැලසුම් සඳහා නව ක්‍රමවේදයන් හඳුන්වා දීමට අපනයන අංශය සමත් විය.

## 3.2.2. ලියාපදිංචිය

මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකක් වනුයේ අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගබඩා හා ආනයනකරුවන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි අළුත් කිරීම වේ. 2012 වර්ෂය තුළ ඒ ඒ කාණ්ඩය යටතේ ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වේ.

ආයතනයේ (නෛතික අස්ථිත්වය), ප්‍රාග්ධනය,ගබඩා පහසුකම් (තේ ගබඩා කිරීම, කලවම් කිරීම සහ ඇසිරීම සඳහා) මණ්ඩලය විසින් සමීපව විමසා බලනු ලබන තේ පරීක්ෂණ සේවාව ආදී නිර්සාධකවලින් සමන්විත අපනයනකරුවන් තේ අපනයනකරුවන් ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලබති.

1986 ජනවාරි 28 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 386/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1986 (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම) ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසිවලට අනුව දේශීය පරිභෝජනය සඳහා තේ කොළ පොලිතින් අසුරණවල ඇසිරීමේ ව්‍යාපාරයේ නිරතවීමට කිසිදු පුද්ගලයෙකුට හැකියාවක් නොමැති අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වීමට වෙනත් ආකාරයේ ඇසුරුම් වර්ග අවශ්‍ය වේ. ලියාපදිංචි එක් කැලැන්ඩර් වර්ෂයක් සඳහා වලංගු වන අතර, වාර්ෂික අළුත් කළ හැකිය.

1959 අංක 16 දරණ තේ පනත (ආනයන බදු හා පාලන) යටතේ තේ අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වී ඇති ඕනෑම අයෙකු/ආයතනයක් තේ ආනයනකරුවකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

03

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

**3.2.1 වගුව අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගබඩා හා ආනයනකරුවන් ලියාපදිංචි කිරීම.**

| ලියාපදිංචි කිරීම් | 01.01.2012 දිනට | 2012 වර්ෂය තුළ නව ලියාපදිංචි කිරීම් | එකතුව 31.12.2012 දිනට |
|---|---|---|---|
| අපනයනකරුවන් | 363 | 20 | 383 |
| ඇසුරුම්කරුවන | 392 | 20 | 412 |
| ගබඩා | 404 | 42 | 446 |
| ආනයනකරුවන | 184 | 7 | 192 |

1984 දෙසැම්බර් 05 දින අංක 326/17 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (තේ තොග ගබඩා කිරීම), 1986 සැප්තැම්බර් 10 වන දින අති විශේෂ ගැසට් අංක 410/11 න් සංශෝධනය කර ඇති පරිදි සහ 2003 මාර්තු 20 වන දින පළ කරන ලද අංක 1280/8 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධියට පත් කරන ලද රෙගුලාසිවලින් තවදුරටත් සංශෝධනය කර ඇති පරිදි කවර හෝ අවස්ථාවක කි.ග්‍රෑ. 1,000 ට වඩා වැඩි කවර හෝ ප්‍රමාණයක් තේ තොග ගබඩා කිරීම සඳහා යොදා ගනු ලබන සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ තොග ගබඩා කිරීම සඳහා සලකා බැලීමේදී සෑහීමකට පත් වන තොග ගබඩා එකී රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය. (3.2.1 වගුව)

ශ්‍රී ලාංකේය තේ සමග වෙනත් ස්ථානයන්හි නිපදවුණු තේ මිශ්‍ර කළ සිල්ලර බහාලුම් අපනයනය කළ යුත්තේ 1981 ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (ආනයන සහ අපනයන) වලට අනුවය. එබදු බහාලුම්/පැකට්ටුවල දැක්විය යුතු වාක්‍යය වන්නේ "ශ්‍රී ලංකාවේදී ලංකා තේ හා වෙනත් තැන්හි නිපදවුණු තේ මිශ්‍ර කරන ලද්දකි" හෝ "වෙනත් තැන්හි නිපදවුණු ශ්‍රී ලංකාවේදී ඇසුරුම් කළ තේ" යනුවෙනි. ඇසුරුම් ලියාපදිංචි කිරීම සඳහා 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත අයදුම්පත්‍ර 360 ක් ලැබිණ.

සියලු ලියාපදිංචි අපනයනකරුවන් විසින් කොළඹ වරායට නැව් භාණ්ඩ ගෙනයාමට ප්‍රථම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශයට රේගු භාණ්ඩ ප්‍රකාශනයක් (CUSDES'S) ඉදිරිපත් කළ යුතු අතර තේ මණ්ඩලය වෙත සියලු ව්‍යවස්ථාපිත ප්‍රකාශන ලබා දෙමින් අධිකාරීත්වය ලබාගත යුතුය. 2012.12.31 දිනට අධිකාරීත්වය ලබාගත් මුළු CUSDES'S සංඛ්‍යාව 36616 ක් විය. එපරිද්දෙන්ම, ප්‍රති- අපනයන සිදුකිරීම කෙරෙහි අපේක්ෂාවක් සහිත ආනයනකරුවන් විසින්ද රේගු භාණ්ඩ ප්‍රකාශයක් (CUSDES'S) අපනයන අංශයට ඉදිරිපත් කළ යුතුය. 2012 වර්ෂය අවසානයේ ප්‍රති- අපනයනකරුවන් සඳහා වූ රේගු භාණ්ඩ ප්‍රකාශන මුළු සංඛ්‍යාව 5108 ක.

## 3.2.3. තේ ආනයනය කිරීම

2012 වර්ෂය සඳහා තේ මණ්ඩලය විසින් තේ ආනයන කි.ග්‍රෑ. 6,799,026.74 ක් සඳහා අවසරය ලබාදී ඇති අතර ආනයන අනුමැති 609 ක් ලබාදී ඇත. කාලච්ඡේදය තුළ, මුළු ආනයන ප්‍රමාණය කි.ග්‍රෑ. 6,232,422 ක් වූ අතර ප්‍රති - ආනයන අනුමැති 1508 ක් නිකුත් කරන ලදී.

## 3.2.2 වගුව : සත්‍ය ආනයන- ජනවාරි - දෙසැම්බර්- 2012

| රට | වර්ගය (කි.ග්‍රෑ) | ආනයන ප්‍රමාණය | CIF අගය (රු.) | අගය (රු.) |
|---|---|---|---|---|
| චීනය | හරිත තේ | 2,663,762 | 331.36 | 882,673,199 |
| | විශේෂ | 221,570 | 592.14 | 131,201,521 |
| | සුදු තේ | 8,485 | 797.42 | 6,766,106 |
| | කැරේන් ඉවත් කළ තේ | 2,000 | 733.00 | 1,466,000 |
| | උප එකතුව | 2,895,817 | 352.96 | 1,022,106,826 |
| ඉන්දියාව | සීටීසී | 1,423,975 | 282.38 | 402,105,021 |
| | විශේෂ (කළු තේ) | 491,544 | 551.32 | 270,996,073 |
| | හරිත තේ | 5,740 | 1,368.36 | 7,854,414 |
| | කැෆෙන් ඉවත් කළ තේ | 28,185 | 615.97 | 17,360,999 |
| | සුදු තේ | 40 | 7,386.00 | 295,440 |
| | ඇසෑම් කළු/සීටීසී | 5,936 | 471.50 | 2,798,824 |
| | උප එකතුව | 1,955,420 | 358.70 | 701,410,771 |
| කෙන්යාව | සීටීසී | 1,230,624 | 348.61 | 429,012,323 |
| | හරිත තේ/සීටීසී | 3,540 | 494.00 | 1,748,760 |
| | කැෆෙන් ඉවත් කළ තේ | 3,540 | 9,191.10 | 32,536,494 |
| | උප එකතුව | 1,237,704 | 374.32 | 463,297,577 |
| ඉන්දුනීසියාව | සීටීසී | 27,800 | 328.12 | 9,121,728 |
| | උප එකතුවක | 27,800 | 328.12 | 9,121,728 |
| ජපානය | හරිත තේ | 220 | 7,252.23 | 1,595,491 |
| | උප එකතුව | 220 | 7,252.23 | 1,595,491 |
| නේපාලය | විශේෂ තේ | 1,500 | 841.86 | 1,262,790 |
| | උප එකතුව | 1,500 | 841.86 | 1,262,790 |
| වියට්නාමය | හරිත තේ | 104,036 | 203.76 | 21,198,599 |
| | උප එකතුව | 104,036 | 203.76 | 21,198,599 |
| ජර්මනිය | විශේෂ තේ | 1,775 | 1,321.03 | 2,344,823 |
| | උප එකතුව | 1,775 | 1,321.03 | 2,344,823 |
| ආර්ජන්ටිනාව | කැෆෙන් ඉවත් කළ තේ | 8,000 | 814.00 | 6,512,000 |
| | උප එකතුව | 8,000 | 814.00 | 6,512,000 |
| තායිවානය | විශේෂ තේ | 150 | 9,945.00 | 1,491,750 |
| | උප එකතුව | 150 | 9,945.00 | 1,491,750 |
| | | | | |
| මුළු එකතුව | | 6,232,422 | 357.86 | 2,230,342,354 |

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

## 3.2.4.අවම තත්ත්ව සහතික ISO 3720 පවත්වාගෙන යාම

සියලු තේ (ISO 3720) අනුමත බාණ්ඩ වලට අයත් වන්නේ දැයි සහතික කරගනු වස් සියලු ලබාදුන් තේ නියැදි සහ තේ කර්මාන්තශාලා වලින් ලබාගත් නියැදි, ආනයනයෙන් අනතුරුව බාගත් තේ බාණ්ඩ සහ පෙර - නැව්ගත කිරීමේ නියැදි, අභඹු ලෙස අපනයන අවස්ථාවේදී පරික්ෂා කිරීම පිණිසද, මිශ්‍ර කිරීමෙන් අනතුරුව ආනයන හා අපනයන කටයුතු සඳහා යෝග්‍ය වන්නේ දැයි සොයා බැලීම පිණිස කිසිදු අවසාධිත කොටසක් නොමැති බවට තහවුරු කිරීම පිණිසද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත්කළ තේ රස බලන්නන්ගේ විශේෂඥ මඩුල්ල විසින් කටයුතු කරයි.

**3.2.3 වගුව : එක් එක් නියැදි මට්ටමේදී අනාවරණය වූ දෝෂ සහිත අවස්ථා සංඛ්‍යාව.**

| නියැදිගත කිරීමේ ආකාරය | ඉවත් කරනු ලැබූ නියැදි සංඛ්‍යාව | අයි. එස්.ඕ. මට්ටමට වඩා තත්ත්වයෙන් පහළ අවස-්ථා හා ක්ෂුද්‍ර ජීවීන් සහිත අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|
| වෙන්දේසියට පෙර | 614 | 68 |
| වෙන්දේසියට පසු | - | - |
| නැව්ගත කිරීමට පෙර | 4915 | 15 |

## 3.2.5.තේවල ස්වභාවය වෙනස් වී තිබීම හේතුවෙන් පරිභෝජනය සඳහා නුසුදුසු වීම

සමාලෝචිත වසර තුළදී, වෙන්දේසියට පෙර තේ කි.ග්‍රෑ.15525 ක් ද, නැව්ගත කිරීමට පෙර තේ කි.ග්‍රෑ.19300 ක් ද, වෙනත් මට්ටම්වලදී තේ කි.ග්‍රෑ.33827 ක් ද, පරිභෝජනය සඳහා නුසුදුසු වීම හේතුවෙන් එම තේවල ස්වභාවය වෙනස් වී ඇති බව අනාවරණය විය

## 3.2.6.නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ කාර්යසාධනය (ඉන්දු - ශ්‍රී ලංකා /පකිස්ථාන - ශ්‍රී ලංකා)

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තේ කි.ග්‍රෑම් 15,000,000 ක් සඳහා අවසර ලබාදුන් අතර 2012 වර්ෂය තුළ එකී ප්‍රමාණයෙන් අපනයනය කරන ලද්දේ තේ කි.ග්‍රෑම් 231,435.80 ක් පමණි.

පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තේ කි.ග්‍රෑම් 10,000,000 ක් සඳහා අවසර ලබදුන් අතර 2012 වර්ෂය තුළ එකී ප්‍රමාණයෙන් අපනයනය කරන ලද්දේ තේ කි.ග්‍රෑම් 45,816.00 ක් පමණි.

| නිදහස් වෙළඳ ගිවිසුම් | වසරකට කෝටා කි.ග්‍රෑ | මුළු අපනයනය කි.ග්‍රෑ. |
|---|---|---|
| ඉන්දු - ශ්‍රී ලංකා | 15,000,000 | 231,435.84 |
| පකිස්තාන් - ශ්‍රී ලංකා | 10,000,000 | 45,816.00 |



## 3.2.7.තේ නැවත ලබා ගැනීම

විදේශීය ගැණුම්කරු විසින් භාර නොගන්නා ලද තේ තොගයක් වේ නම්, එම තේ තොගය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය යටතේ දේශීය අපනයනකරු විසින් නැවත ලබා ගත යුතුය. 2012 වසරේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලය තේ තොග කි.ග්‍රෑ.307, 931.74 ක ප්‍රමාණයක් නැවත ලබා ගැනීම සඳහා බලය ලබා දෙනු ලැබීය.




*Seminar session in parallel to XIAMEN- China*



*Hong Kong International Tea Fair*

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

# 3.3.තේ ප්‍රවර්ධන අංශය

## 3.3.1. අංශයේ ප්‍රධාන අරමුණ /කාර්ය භාරය

පහත දක්වා ඇති පුළුල් කාණ්ඩ යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළවලදී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තේ ප්‍රවර්ධන අංශය වගකීම උසුලයි.

1. අන්තර්ජාතික ආහාර සහ පාන වර්ග පිළිබඳ වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම.
2. ලංකා තේ පිළිබඳව ඒක දේශීය ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
3. වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම.
4. තේ ප්‍රවර්ධන අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහය වීම.
5. තේ පරිභෝජනය කරනු ලබන සියළුම වැදගත් රට-වල් සම්බන්ධයෙන් උපායමාර්ගික වෙළඳපොළ පැතිකඩ සම්පාදනය කිරීම සහ ඒවා ව්‍යාප්ත කිරීම.
6. තේ වෙළඳපොළ සඳහා වන වෙනත් තරගකරුවන්ගේ ක්‍රියාකරකම් පිළිබදව විශ්ලේෂණය කිරීම.
7. සිංහ ලාංජනය ලියාපදිංචි කිරීම සහ එය අධීක්ෂණය කිරීම.
8. ලංකා තේ හා වෙනත් තේ වගා කිරීමේ කලපීය නාම/ලාං-ජන භූගෝලීය හැදින්වීම් ලෙස සලකා ආරක්ෂා කිරීම.
9. ඕසෝන් හිතකාමී පිරිසිදු ලංකා තේ ලියාපදිංචි කිරීම හා පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට එය භාවිතා කිරීම සඳහා බලය පැවරීම.
10. දේශීය තේ ප්‍රවර්ධනය.

03

තේ මණ්ඩලය මඟින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

## 3.3.2.ප්‍රධාන ජයග්‍රහණ

2012 වර්ෂය තුළ, වෙළඳ කවුළු ස්ථාපිත කිරීම, නව වෙබ් අඩවි ප්‍රති - ස්ථාපිත කිරීම,තේ මධ්‍යස්ථාන සඳහා යෝජනාව සම්පූර්ණ කිරීම, තෙවර්ෂ උපාය මාර්ගික වෙළඳ සැලැස්ම සම්පූර්ණ කිරීම සහ තේ ප්‍රවර්ධන කටයුතු සඳහා එහි ඉහලම ඉලක්ක වෙළඳපොළ 25 ක් හඳුනා ගැනීම යන විශේෂිත ජයග්‍රහණ අත්කර ගැනීමට ප්‍රවර්ධන අංශය සමත් විය. අනෙක් අතට ප්‍රවර්ධන හා වෙළඳ අරමුදල හරහා නව ක්ෂේත්‍රයක් සඳහා ගෙත්‍ර වාර්ෂික සවිස්තරාත්මක අයවැය මගින්ද, අරමුදල් වෙන්කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කොළඹ පැවති ජාත්‍යන්තර තේ නිපදවන්නන්ගේ සංසදය විසින් දියත් කරන ලද හා ජනවාරි 30 සිට පෙබරවාරි 1 දක්වා කොළඹදී පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) තේ පිළිබඳ අන්තර් - රාජ්‍ය කණ්ඩායම් (IGG) සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලදී.

## 3.3.3. විදේශීය තේ ප්‍රවර්ධන කාර්යාල සහ වෙළඳපොළ ආවරණය

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සහ රුසියාවේ ශ්‍රී ලංකික රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට අනුබද්ධව විදේශීය තේ ප්‍රවර්ධනය පිළිබඳව කලාපීය ඒකක දෙකක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් වර්තමානයේදී පවත්වාගෙන යනු ලබයි. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පිහිටා ඇති කාර්යාලය මැද පෙරදිග/ ගල්ෆ් /උතුරු අප්‍රිකාවේ තේ ප්‍රවර්ධන කටයුතු පිළිබඳව වගකීම දරන අතර රුසියාවේ පිහිටි කාර්යාලය රුසියානු සමූහාණ්ඩුව සහ නිදහස් රාජ්‍ය එකමුතුව හා සම්බන්ධ තේ ප්‍රවර්ධන කටයුතු පිළිබඳ වගකිව යුතු වේ. තවද, අදාළ වාණිජ නිලධාරීන්/ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමග සහයෝගීතාවයෙන් අනෙකුත් වෙළඳපොළවල තේ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම සම්බන්ධව ද කොළඹ තේ ප්‍රවර්ධන අංශය වගකිව යුතුය.

## 3.3.4. ප්‍රවර්ධන හා අලෙවි කමිටුව(PMC)

කර්මාන්තයේ සහ වෙළඳාමේ ප්‍රමුඛතා සහ අපේක්ෂාවන්ට ගැළපෙන පරිදි ප්‍රවර්ධන හා අලෙවි කමිටුව නැවත ස්ථාපනය කිරීම ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබිය. ඉදිරි වසර තුන තුළදී, සියලුම තේ අපනයන මත කි.ග්‍රෑ. එකක් සඳහා රු. 3.50 ක නව ප්‍රවර්ධන හා අලෙවි බද්දක් අය කිරීම මගින් ලංකා තේ ගෝලීයව ප්‍රචාරණය කිරීම සඳහා රු.බිලියන 6.2 ක (ඇ.ඩො. මිලියන 50 ක) මුදල් ප්‍රමාණයක් උත්පාදනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2013 වසරේ අග භාගය තුළදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අංශයේ අධීක්ෂණ යටතේ දියත් කිරීමට යෝජිතව තිබෙන ක්‍රමෝපායික අලෙවිකරණ සැලැස්ම සම්පාදනය කිරීම සම්බන්ධ වගකීමද මෙම නව ප්‍රවර්ධන හා අලෙවි කමිටුව වෙත පැවරී ඇත.

## 3.3.5.වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීම

පිරිසිදු ලංකා තේ වෙළඳ නාම ප්‍රවර්ධන වෙනුවෙන් තෝරාගත් ප්‍රධාන තේ ආනයනය කරනු ලබන රටවල පවත්වනු ලබන අන්තර්ජාතික ආහාර සහ පාන වර්ග පිළිබඳ ප්‍රදර්ශන වලට සහභාගී වීම සඳහා තේ අපනයනය කරනු ලබන සමාගම් වලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහය ලබා දෙයි. 2012 වසරේදී, පහත සඳහන් කර ඇති ප්‍රදර්ශන වලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහභාගී වීම තුළින් පිරිසිදු ලංකා තේ වල අපනයන පරිමා හා වටිනාකම් වැඩි දියුණු කර ගැනීමට තේ සමාගම්වලට හැකි විය.

# 03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

01. ප්‍රොඩෙක්ස්පෝ - රුසියාව
02. ගල්ෆ් ෆුඩ් 2012 - එක්සත් අරාබි එමීර් රාජ්‍යය
03. එස්එසීසී - කුන්මින් - චීනය
04. ශියමෙන් ජාත්‍යන්තර තේ සල්පිල - චීනය
05. එෆ්එච්සී, ෂැන්ග්හයි - චීනය
06. ඉන්ටනැෂනල් ටී ෆෙයාර් - හොංකොං
07. ෆයින් ෆුඩ් - ඕස්ට්‍රේලියාව
08. ෆුඩෙක්ස් - ජපානය
09. හොරෙකා 2012 - ලෙබනනය
10. සියල් චීනය - චීනය
11. ෆුඩ් තායිපේ - තායිවානය
12. සිබස් - ඉතාලිය
13. සියැල් මොන්ට්‍රියල් - කැනඩාව
14. වර්ල්ඩ් ටී එක්ස්පෝ - ඇ.එ.ජ
15. සියැල් බ්‍රසීලය - බ්‍රසීලය
16. රිගා ෆුඩ් - ලැට්වියාව
17. සියැල් - ප්‍රංශය




*SLTB booth at the XIAMEN- China*




*SLTB booth at the SIAL- France*

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

## 3.3.6.ලංකා තේ එකම දේශීය තේ වර්ගය ලෙස ලොව පුරා ප්‍රවර්ධනය කිරීම

ලංකා තේ එකම දේශීය තේ වර්ගය ලෙස ලොව පුරා ප්‍රවර්ධනය කිරීම යනු වෙනත් සම්භවයක් සහිත තේවලට සාපේක්ෂව ශ්‍රී ලංකා තේ ලොව පුරා ප්‍රචාරය කිරීමේ ව්‍යාපාරයයි. විදේශීය තේ ප්‍රවර්ධන ඒකක මගින් මෙන්ම විදේශීය රටවල ශ්‍රී ලංකා රජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල වාණිජ අංශ මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් අනුමත කරන ලද ලංකා තේ ලොව පුරා ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය විදේශීය වෙළඳපොළවළදී ප්‍රධාන වශයෙන්ම ක්‍රියාත්මක වේ. මාධ්‍ය මගින් සිදුකරනු ලබන ප්‍රචාරණය, බාහිර වෙළඳ ප්‍රචාරය, දියර තේ සේවා, තේ වැඩමුළු සම්මන්ත්‍රණ හා වෙනත් මහජන සම්බන්ධතා කටයුතු ලංකා තේ එකම දේශීය තේ වර්ගය ලෙස ලොව පුරා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වල ප්‍රධාන අංශ වේ. 2012 වසර තුළදී, ලංකා තේ එකම දේශීය තේ වර්ගය ලෙස ලොව පුරා ප්‍රවර්ධනය කිරීම යටතේ සිදුකරනු ලැබූ කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත. මෙම ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන්ම යොමුවී ඇත්තේ අපේක්ෂිත මට්ටමට වඩා අඩුවෙන් සිදුවන තේ වෙළඳ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙනි.;

I. වැව්ලිකරුවන්ගේ සංගමය/ යූ.පී.ඒ.එස්.අයි. ස්පෝර්ට්ස් ෆෙස්ටිවල් - ඉන්දියාව
II. එක්ස්පෝ 2012 ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා දිනයේ දී කරන ලද තේ ප්‍රවර්ධනය - සාන්ත මොනිකා, කැලිෆෝනියාව, ඇ.එ.ජ
III. ආර්ට් ඔෆ් වෙල් බීන් (යහපත් දිවි පැවැත්ම) ප්‍රදර්ශනය දී තේ ප්‍රවර්ධන ඔටාවා, කැනඩාව - 2012 අගෝස්තු 22 වනදා
IV. ඔටාවා ටී ෆෙස්ටිවල් - කැනඩාව - දෙසැම්බර් 1 වනදා

## 3.3.7.වෙනත් පාන වර්ගවලට සාපේක්ෂව තේ ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම

වෙනත් පාන වර්ගවලට සාපේක්ෂව "ලංකා තේ" ලොව පුරා ප්‍රවර්ධන කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය කටයුතු කරයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය එෆ්.ඒ.ඕ. සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේද, එක්සත් රාජධානියේ තේ කවුන්සිලයේද, ඇ.එ.ජ. යේ තේ සංගමයේ, එක්සත් රාජධානියේ අන්තර්ජාතික තේ කමිටුවේ සහ ජපානයේ තේ සංගමයේද සාමාජිකත්වය දරයි. මෙම සංවිධාන මගින් වෙනත් පාන වර්ගවලට සාපේක්ෂව තේ ප්‍රවර්ධන කටයුතු සිදු කරනු ලැබේ. වෙනත් පාන වර්ගවලට සාපේක්ෂව තේ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම්දී, පාරිභෝගිකයන්ට අධ්‍යාපන අවස්ථා සැලසීම මගින් මෙන්ම මහජන සම්බන්ධතා කටයුතු තුළින් ද, තේ හා සෞඛ්‍ය සංකල්පය වර්ධනය කිරීම පිළිබඳව ප්‍රධාන වශයෙන්ම අවධානය යොමුකරනු ලැබේ. 2012 වසරේදී, තෝරා ගත් රටවල්වල වෙනත් පාන වර්ගවලට සාපේක්ෂව තේ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් සිදුකරනු ලබන තේ ප්‍රචාරණය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් තේ සංගම්වලට හා තේ කවුන්සිලවලට අවශ්‍ය මුදල් ලබා දීම සිදුකරයි.

## 3.3.8. වෙළඳ නාම ආරක්ෂණය

සිංහ ලාංජන වෙළඳ නාමට ලියාපදිංචි කිරීම

ලංකා තේ සිංහ ලාංජනයේ හිමිකාරිත්වය දරන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. තේ ප්‍රවර්ධන අංශය මගින් ශ්‍රී ලංකාවේදී හා විදේශීය රටවලදී ලංකා තේ සිංහ ලාංජනය ලියාපදිංචි කිරීම/අළුත් කිරීම සිදු කරනු ලබයි. 2012 වසර අවසානය වන විට ලංකා තේ සිංහ ලංජනය රටවල් 98 ක ලියාපදිංචි කර තිබුණි. 100% ක් ලංකා තේ අඩංගු එක් එක් ගමනාන්තය සඳහා අවම සමුද්දේශ ප්‍රමිතියකට වඩා ඉහළ මට්ටමේ ප්‍රමිතියක් සහිත ශ්‍රී ලංකාවේදී ඇසුරුම් කරන ලද, අයිඑස්ඕ 3720 ප්‍රමිතියට අනුකූල වන, වෙළඳ නාම යෙදූ, එමෙන්ම අගය එකතු කළ තේ නිෂ්පාදන (තේ මළු සහ තේ ඇසුරුම්) සඳහා පමණක් සිංහ ලාංජනය භාවිත කිරීමේ බලය පවරා තිබේ. විදේශීය තේ ප්‍රවර්ධන ඒකක හා විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික දූත මණ්ඩලවල සහය ඇතිව තේ ප්‍රවර්ධන අංශය මගින් සිංහ ලාංජනය භාවිත කිරීමේ බලය පවරා දීමේ යෝජනා ක්‍රමය අධීක්ෂණය කරනු ලැබේ. ලංකා තේ සිංහ ලාංජනය ව්‍යාජ ලෙස භාවිතා කිරීම සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම මෙන්ම රැවටීම් සිදුකිරීම ද වැළැක්වීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් ශ්‍රී ලංකාව, එ.අ.එ. ජෝර්දානය, සිරියාව, ඉරාකය, ඉරානය සහ තුර්කිය යන රටවල්වල දේශීය පුවත්පත්වල සිංහ ලාංජන භාවිතය පිළිබඳ අවවාදාත්මක දැන්වීම් ද පළකර තිබේ

## 3.3.9.ලංකා තේ ලියාපදිංචි කිරීම, කලාපීය නාම සහ ලාංජන

ලෝක වෙළඳ සංවිධානයේ, "ට්‍රිප්ස්" ගිවිසුමේ විධිවිධානවලට අනුව "ලංකා තේ" සහ වෙනත් කෘෂි දේශගුණික කලාප හතක තේ (නුවර එළිය, ඌව, දිඹුල, උඩපුස්සැල්ලාව, මහනුවර, රුහුණ සහ සබරගමුව) භූගෝලීය හැඳින්වීම් ලෙස සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය නීති හා රෙගුලාසි ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සම්පාදනය කරනු ලැබිය. ප්‍රධාන වශයෙන්ම විදේශීය කොන්ත්‍රාත්තු ලැබූ ඇසුරුම්කරුවන් විසින් "ලංකා තේ" සහ වෙනත් කලාපීය තේ වගාකිරීමේ නාමයන් සාවද්‍ය අන්දමින් පරිහරණය කිරීම වැළැක්වීමට මෙය පිටුවහලක් වනු ඇත. "ලංකා තේ" කලාපීය නාමයන් ලෙස මෙන්ම ලාංජන සහතික කිරීමේ සලකුණු ලෙස ද දේශීයව ලියා පදිංචි කිරීම මෙම වසර තුළදී සම්පූර්ණ කරනු ලැබීය.

භූගෝලීය හැඳින්වීම් හෝ සහතික කිරීමේ සලකුණු ලෙස "ලංකා තේ" සහ වෙනත් කෘෂි දේශගුණික කලාප හතක තේ අන්තර්ජාතිකව ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීම 2012 වසරේදී පහත සඳහන් රටවල්වලදී ආරම්භ කරනු ලැබීය.

ලංකා තේ : ජෝර්දාන සහ ලෙබනනය

කලාපීය තේ නාමයන් /ලාංජන : ඇ.එ.ජ සහ ජපානය

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

## 3.3.10.ඕසෝන් හිතකාමී පිරිසිදු ලංකා තේ ලංඡනය ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකාවේදී ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, සහතික කිරීමේ සලකුණක් ලෙස පිරිසිදු ඕසෝන් හිතකාමී ලංකා තේ ලාංඡනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් ලියාපදිංචි කරනු ලැබීය. මොන්ට්‍රියල් ප්‍රඥප්තිය යටතේ, නිරෝධායන නොවන කාර්යයන් හා නැව්ගත කිරීමට පෙර කාර්යයන් ඉවුකිරීම සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් යෙදීම නවතාලීම සඳහා ව්‍යාපෘති දෙකක් ශ්‍රී ලංකාවේදී ක්‍රියාත්මක කරනු ලැබීය. මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතයෙන් තොරව පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ තේ වගාව සිදු කිරීම සඳහා වූ තේ කර්මාන්ත අංශයේ ව්‍යාපෘතිය 2002 වසරේදී සාර්ථකව සම්පූර්ණ කරනු ලැබූ අතර මොන්ට්‍රියල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරන්නන්ගේ සම්මානය දිනා ගැනීමට ද 2007 වසරේදී ශ්‍රී ලංකාව සමත් විය. මේ අනුව, ලෝකයේ තේ නිෂ්පාදනය කරනු ලබන රටවල් අතරින් ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කරනු ලබන පළමු රට බවට ශ්‍රී ලංකාව පත් විය. සමාලෝචිත වසර තුළදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් වෙළඳ නාම විසි එකක් සඳහා ලාංජන භාවිත කිරීමට තේ අපනයනකරුවන් දහඅට දෙනෙකු වෙත බලය පවරා දීමට ක්‍රියා කරනු ලැබීය. එමෙන්ම, සිංහ ලාංජනය දරණ සියළුම තේ ඇසුරුම්වලට පිරිසිදු ඕසෝන් හිතකාමී ලංකා තේ ලාංජනය යෙදීමටද ශ්‍රී ලංකා තේ මණ්ඩලට කටයුතු කරනු ලැබීය.

ඕසෝන් හිතකාමී පිරිසිදු ලංකා තේ ලාංජනය අන්තර්ජාතිකව ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය 2011 වසරේදී ආරම්භ වූ අතර මේ සම්බන්ධයෙන් රටවල් තිහක් හඳුනා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. පළමු අදියර යටතේ, යුරෝපා ප්‍රජාව, ජපානය හා ජෝර්දානය යන රටවල ලියාපදිංචි කිරීම් සම්පූර්ණ කරනු ලැබූ අතර වෙනත් රටවල් 18 ක ලියාපදිංචි කිරීමේ කටයුතු 2012 වසර තුළදී ආරම්භ කරනු ලැබීය.

## 3.3.11.අමාත්‍යංශ මට්ටමින් සිදු කරනු ලැබූ ද්විපාර්ශ්වික සාකච්ජා

2012 මැයි මාසය තුළදී ගරු මහින්ද සමරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් තේ සම්බන්ධ දූත පිරිසක් ඕස්ට්‍රේලියාවේ (මෙල්බර්න් හා සිඩ්නි නගරවල) සංචාරයක නිරත වූහ.

## 3.3.12. අන්තර්ජාතික සංසදවලට සහභාගි වීම

1. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ (IGG) 20 වන සැසිවාරය ජනවාරි 30 වනදා සිට පෙබරවාරි 1 වනදා දක්වා කොළඹදී පවත්වනු ලැබීය.

2. කොළඹ අන්තර්ජාතික තේ සම්මුතිය 2012 පෙබරවාරි මස 1 වනදා සිට 3 වනදා දක්වා පවත්වනු ලැබීය.

3. තේ පිළිබඳ FAO-IGG අන්තර් සම්මන්ත්‍රණ සමුළුව 2012 සැප්තැම්බර් මස 17,18 දෙදින ඇමරිකා එක්සත් ජනපදයේදී පැවැත්විණ.

4. තේ සහ මිනිස් සෞඛ්‍යය පිළිබඳ 5 වන ජාත්‍යන්තර විද්‍යා සම්මේලනය 2012 සැප්තැම්බර් මස 19 වන දින ඇමරිකා එක්සත් ජනපදයේදී පැවැත්විණ.

## 3.3.13. විශේෂ තේ ප්‍රදාන

ඉතාලියේ භූමි කම්පාවෙන් විපතට පත් වූ පුද්ගලයන්ට 2012 ජූනි මාසයේදී විශේෂ තේ ප්‍රදානයක් ලබා දෙනු ලැබීය. තේ අපනයන වෙළඳාම මගින් සිදු කරනු ලබන මානුෂීය පරිත්‍යාග යක් ලෙස පාරිභෝගික ඇසුරුම් සහ තේ මළුවලින් සමන්විත වූ කි.ග්‍රෑ. 1158 ක තේ තොගයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඔවුන් වෙනුවෙන් සුදානම් කරන ලදී.







*Inauguration of the 20th session of the IGG on tea*

# 03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්




*Inauguration of the 20th session of the IGG on tea*



*Inauguration of the 20th session of the IGG on tea*

## 3.3.14. විදේශීය දූත මණ්ඩල

සමාලෝචිත වර්ෂය තුළදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් විදේශීය දූත මණ්ඩලවලට අනුග්‍රාහකත්වය හා පහසුකම් සලසනු ලැබූ අතර දෙරට සඳහා අන්‍යොන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් වෙළඳ සම්බන්ධතා ගොඩනගා ගැනීම, අදහස් හුවමාරු කර ගැනීම්, දැනුම බෙදා ගැනීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සමග වෙළඳ රැස්වීම් ද සංවිධානය කරනු ලැබීය.

I ඇන්ශාන්, නැන්පින් සහ ගුඇන්ඩොන්ග් ප්‍රදේශ වලින් පැමිණි සාමාජිකයන් 21 දෙනෙකුගෙන් සමන්විත වන චීන දූත පිරිසක් 2012 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

II තායිලන්තයේ හොංකොං වෙළඳ සංවර්ධන කවුන්සිලයේ සාමාජිකයන් 2 දෙනෙකුගෙන් සමන්විත වන දූත පිරිසක් 2012 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

III ටොෂිකිහොරි මහතාගේ ප්‍රධානත්වයෙන් සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත වන ජපාන දූත පිරිසක් 2012 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

IV සාමාජිකයන් 7 දෙනෙකුගෙන් සමන්විත වන ජපානයේ ඉටෝචු කෝර්පරේෂන්හි දූත පිරිසක් 2012 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

V සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සමන්විත වන ඊජිප්තුවේ කයිරෝ නගරයේ වණිජ මණ්ඩලයේ දූත පිරිසක් 2012 මාර්තු මාසයේ 27 වනදා 30 වනදා දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

## 3.3.15. ප්‍රවර්ධනය /තොරතුරු සැපයීම සඳහා වූ ප්‍රකාශන

පහත සඳහන් වන ප්‍රවර්ධනය / තොරතුරු සැපයීම සඳහා වූ ප්‍රකාශන වර්ෂය තුළදී නිකුත් කරනු ලැබීය.

i. ද්වි මාසික ප්‍රවෘත්ති ලිපිය (06).

ii. කාර්තුවක් සඳහා නිකුත් කරනු ලබන තේ වෙළඳපොළ සමාලෝචනය 2012 (04).

iii. ලංකා තේ චිත්‍රපටය තේ ප්‍රවර්ධනය කටයුතුවලදී මෙන්ම තේ අලෙවිකරණ කාර්යයන්වලදී උපයෝගී කර ගැනීමේ අරමුණින් "සෙරන්ඩිපිටී" යනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා CTTA මගින් නිපදවනු ලැබූ තේ චිත්‍රපටයේ පිටපත් 1000 ක සංඛ්‍යාවක් උපුටා ගැනීමේ තහනම සමග ඩීවීඩී වලට පිටපත් කරනු ලැබීය. මෙම ඩීවීඩී පටය සියළුම විදේශීය ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට නොමිලයේ ලබා දී තිබේ




*SLTB quarterly tea market review*

## 3.3.16. දේශීය තේ ප්‍රවර්ධනය

සමාලෝචිත වසර තුළදී, පහත සඳහන් කර ඇති දේශීය වෙළඳ ප්‍රදර්ශන/අවස්ථාවලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහභාගි විය. දියර තේ සේවය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඇසුරුම් පරාසය අලෙවිකරණය, ප්‍රවර්ධන ද්‍රව්‍ය බෙදාහැරීම ආදී කටයුතු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රදර්ශන කුටිය තුළදී සිදු කරනු ලැබීය.

- ශ්‍රී ලංකා එක්ස්පෝ 2012 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ප්‍රදර්ශනය හා වෙළඳ සල්පිල (2012 මාර්තු 28 වනදා සිට 31 වනදා දක්වා)
- දැයට කිරුළ 2012 ඔයාමඩුව, අනුරාධපුරය (පෙබරවාරි 4 වනදා සිට 10 වනදා දක්වා)
- දක්ෂිණ කෘෂි නවෝදය, ගාල්ල (2012 සැප්තැම්බර් 12 වනදා , 19 වනදා දක්වා)
- අයි.ඒ.ටී.එස්. ග්ලෝබල් ඒවියේෂන් හියුමන් කැපිටල් සමිට් 2012 (2012 නොවැම්බර් 13, 14 වනදා දක්වා)




*Ceylon tea film*






*Opening ceramony of the Sri Lanka Tea Board / Re-furbished Sales Centre*

# 3.3.17. තේ අලෙවි මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් ප්‍රතිස්ථාපනය කරන ලද අලෙවි මධ්‍යස්ථානය 2012 ඔක්තෝබර් මස 12 වන දින වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මහතා විසින් උත්සවශ්‍රීයෙන් විවෘත කෙරුණු අතර අලෙවි කිරීම සඳහා සමස්තයක් ලෙස වෙළඳ ලකුණු 17 කට අයත් තේ වර්ග තබා තිබිණ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලබන මෙම අලෙවි මධ්‍යස්ථානය මගින් පාරිභෝගිකයන්ට එකම ස්ථානයකින් පුළුල් පරාසයක් තුළ විහිදුණු උසස්ම ලංකා තේ ම වර්ග තෝරා ගැනීමේ අවස්ථාව පමණක් නොව, වර්තමානයේ මිලදී ගත හැකි තේ වර්ගවල විවිධත්වය හා ප්‍රභේද දැකබලා ගැනීමේ සුවිශේෂී අවස්ථාව ද හිමි වේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩල පරිශ්‍රයේ පිහිටා ඇති තේ අලෙවි මධ්‍යස්ථානය මගින් සිංහ ලාංඡනය දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල ඇසුරුම් පරාසයට අයත් තේ නිෂ්පාදන මෙන්ම පුද්ගලික අංශයේ තේ සමාගම් දහ හතකින් තෝරාගත් තේ නිෂ්පාදන ද අලෙවි කරනු ලැබීය. 2012 වර්ෂය තුළදී, පූර්ව වර්ෂයට සාපේක්ෂව 1% ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කරමින් මධ්‍යස්ථානයේ තේ අලෙවිය තුළින් රු. මිලියන 30.8 ක අදායමක් උත්පාදනය විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ඇසුරුම් අලෙවි කිරීමෙන් රු.මිලියන 12.1 ක ආදායමක් ලැබුණු අතර පුද්ගලික අංශයේ තේ වෙළඳ භාණ්ඩ අලෙවි කිරීමෙන් රු.මිලියන 18.7 ක් උපයා ගැනීමට ද හැකි විය.

# 3.3.18.අනුපූරක තේ බෙදා හැරීම

"ලංකා තේ" ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය රු. මිලියන 3 ක් වටිනා තේ පහත දක්වා ඇති පරිදි අනුපූරක පදනමින් නිකුත් කර තිබේ.

1. විදේශීය රටවල ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල 40 ක් සඳහා අනුපූරක තේ
2. දියර තේ සේවාව හා ඒවා අන්තර්ජාතික වෙළඳ සල්පිල්වලදී බෙදා හැරීම.
3. ප්‍රභූවරුන්ට හා ඉහළ පෙළේ නිලධාරීන්ට ප්‍රවර්ධනාත්මක අරමුණු වෙනුවෙන් තේ ප්‍රදානය කිරීම



*Interior of the Sri Lanka Tea Board Sales centre*

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්











# 3.4. තේ රස බැලීමේ ඒකකය

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

## 3.4.1. ප්‍රධාන කාර්යය/අරමුණු

අයි.එස්.ඕ. 3720 අයි.එස්.ඕ 11287 යන අවම තත්ත්ව ප්‍රමිති තේ විකිණීමේ කුමන ස්ථානයකදී හෝ පවත්වා ගැනීම හා අධීක්ෂණය කිරීම. වෙළඳ නාම යෙදූ පාරිභෝගික ඇසුරුම් සඳහා සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම හා පුද්ගලික හා සෘජු අලෙවිකරණ කටයුතු අධීක්ෂණය කිරීම හා ඒවා වලංගු බවට පත් කිරීම.

## 3.4.2. ප්‍රධාන ජයග්‍රහන

2012 වර්ෂය සඳහා 600 කට අධික සිංහ ලකුණ සහත අයදුම්පත් නිකුත් කරන ලදී.

## 3.4.3. තේ රස බලන්නන්ගේ විශේෂඥ මණ්ඩලය

මෙම ස්වාධීන මණ්ඩලය සාමජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විතය.එනම්,

සී.එන.පී.ද සිල්වා මහතා (වසර 40 කට වැඩි තේ රස බැලීමේ පළපුරුද්ද)

වී.ඒ.ඒ. පෙරේරා මහතා (වසර 30 කට වැඩි තේ රස බැලීමේ පළපුරුද්ද)

පාර්ශවකරුවන් නියෝජනය කරමින් පහත දැක්වෙන සංගම්වලින් එක් නියෝජිතයකු බැගින් මණ්ඩලයේ සාමාජිකත්වය දරයි.

CCTA,CBA,CPA,SLFTSHDS,TEA,PTFOA.

## 3.4.4. ඒකකය මගින් අනුගමනය කරනු ලබන තේ රස බැලීමේ ක්‍රමවේදය

ඉන්ද්‍රිය සංවේදී පරික්ෂාවලදී භාවිත කරනු ලබන මද්‍යසාරවලින් තේ සැකසීම පිළිබඳ අයිඑස්ඕ 3102 ක්‍රමවේදය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබයි. කළු තේ සඳහා භාවිතා කරනු ලබන වචන මාලාව සඳහා අයිඑස්ඕ 6078 තේ රස බැලීමේ නාමාවලිය/ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ මොනොග්‍රාෆය , අංක 4 ,ලංකාවේ තේ නිෂ්පාදනය.

03

## 3.4.5. තේ රස බැලීමේ විශේෂඥ මඩුල්ලේ සැසිවාර පැවැත්වීම

පහත සඳහන් කරුණු පිළිබඳව ස්වාධීන ඇගයීමක් සිදු කිරීම සඳහා ප්‍රධාන වශයෙන්ම සඳුදා හා බ්‍රහස්පතින්දා දිනවල එනම් සතියකට දෙවරක් වන පරිදි විශේෂඥ මඩුල්ල හමු වුහ.

- වෙන්දේසියට පෙර තේ
- විශේෂ විමර්ශන සිදු කළ යුතු තේ
- ආනයනයට පෙර නියැදි
- සෑජු අලෙවිය
- නව අපනයන සමාගම් සඳහා තේ රස කරන්නන් තක්සේරු කිරීම.

විශේෂඥ මඩුල්ලේ තීරණය අදාළ අංශවලට ඉදිරිපත් කරනු ලැබේ(තේ කොමසාරිස් අංශය හා නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) අංශය).

## 3.4.6. සිංහ ලාංජන ඇසුරුම් ලියාපදිංචි කිරීම

තම වෙළඳ නාමය යොදන ලද පාරිභෝගික ඇසුරුම් මත ගුණාත්මකභාවයේ සංකේතයක් වන, ශ්‍රී ලංකා තේ මණ්ඩලයට පූර්ණ හිමිකමක් ඇති, සිංහ ලාංජනය යෙදීමට අපේක්ෂා කරන අපනයනකරුවන් අපනයනය කරනු ලබන රට හා වෙළඳ පොළ අනුව ඒවා තක්සේරු කිරීම සඳහා තම අයදුම්පත සමග වෙළඳ නාමය යොදනු ලැබූ නිෂ්පාදනද ඉදිරිපත් කල යුතුය.

සිංහ ලාංජනය භාවිත කිරීමේ අයිතිය පිරිනැමීම සඳහා එක් භාණ්ඩ වර්ගයක් සඳහා රු.5000 (වැට් බද්ද , ජාතිය ගොඩනැගීමේ බද්ද) ක ගාස්තුවක් සහ ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ලෙස අයකර එක් වසරක් සඳහා වලංගු වන සහතිකයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

සිල්ලර ඇසුරුම් මත සිංහ ලාංජනය භාවිත කිරීමේ අයිතිය පිරිනැමීම සඳහා 2012 වසර සඳහා නව වෙළඳ භාණ්ඩ/අලුත්කිරීම් හා අමතර ඇසුරුම් සම්බන්ධ අයදුම්පත් 601 ක් සලකා බලනු ලැබීය.

## 3.4.7. සිංහ ලාංජනය යොදනු ලබන ඇසුරුම් (දේශීය/විදේශීය/තේ මණ්ඩල ඇසුරුම් පරාසය) පිළිබඳ ගුණාත්මකභාවට අධීක්ෂණය කිරීම

කොළඹ සුපිරි වෙළඳසැල් හා සිල්ලර සාප්පුවලින් අහඹු ලෙස ලබා ගන්නා ලද නියැදි විශේෂයෙන්ම, සිංහ ලාංජනය භාවිතා කරනු ලබන භාණ්ඩ වර්ග තක්සේරු කරනු ලැබේ. මනා කීර්තියක් උසුලන, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග දීර්ඝ කාලයක් මුළුල්ලේ ලියාපදිංචි වී සිටින සැලකිය යුතු වෙළඳපොළ කොටසක් හිමි ඇසුරුම් කරුවන්ට සිංහ ලාංජනය භාවිත කිරීමට අවසර ලබා දී තිබෙන අතර ඔවුන්ව ඒ අනුව අධික්ෂණය කෙරේ.

විදේශීය අධීක්ෂණ ක්‍රමය යටතේ, සිංහ ලාංජනය සහිතව නැව්ගත කරන තේ වැඩි ප්‍රමාණයක් (80%) නැව්ගත කිරීමට පෙර අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙළ යටතේ නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) මගින් නියැදි ගත කරනු ලබන අතර නැව් ගත කිරීමට ප්‍රථම සිදු කරනු ලබන අධීක්ෂණ කාර්යයන් සඳහා එම නියැදි තේ රස බැලීමේ ඒකකයට ඉදිරිපත් කරනු ලැබේ. එසේම, තේ මණ්ඩලයේ විදේශ කාර්යාල මගින් හා ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල ජ්‍යෙෂ්ඨ වාණිජ නිලධාරීන් විසින් ඇගයීම හා වාර්තා කිරීම සඳහා විදේශීය වෙළඳපොළවල සිංහ ලාංජනය යොදා අලෙවි කරනු ලබන ඇසුරුම් දෛනිකව ඉදිරිපත් කරනු ලැබේ.

# 03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

සිංහ ලාංඡනය සහිත ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ඇසුරුම් ප්‍රධාන වශයෙන් අපගේ වෙළඳපොළෙහි අලෙවි කරනු ලබන අතර විදේශීය තනාපති කාර්යාලවලට, තේ මණ්ඩලයේ විදේශීය කාර්යාංශවලට සහ වෙළඳ ප්‍රදර්ශන වලටද ඒවා යවනු ලැබේ. තේ නිල ඇසුරුම්කරු විසින් තේ රස බැලීමේ ඒකකයේද අනුමැතිය ඇතිව වෙන්දේසි මගින් හෝ පුද්ගලික අලෙවි මාර්ග මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් තේ තෝරා ගැනීම හා මිලදී ගැනීම සිදු කරයි. තේ රස පිරික්සුම් ඒකකය මගින් අවසාන වරට ඇසුරුම් කිරීමට පෙර මිලදීගත් තේ නියැදි, මිශ්‍ර කරන ලද තේ නියැදිවලද රස පරීක්ෂා කිරීම හා අනුමත කිරීම  සිදු කෙරේ.

එෆ්.එෆ්.සී.ටී. (ග්‍රෑම් 500),

ප්ලාන්ටරස් පන්ච් (ග්‍රෑම් 100 සහ ග්‍රෑම් 250),

මිස්ටි හිල්ස් (ග්‍රෑම් 200),

රොයල් සිලෝන් (ලෝහ කෑන් ග්‍රෑම් ණී 200),

ෆැමිලි පැක් (ග්‍රෑම් 500 සහ ග්‍රෑම් 250),

පොලි පැක් (ග්‍රෑම් 250),

හරිත ටී (ග්‍රෑම් 100),

ටී ප්ලර්කර් (ග්‍රෑම් 250 සහ ග්‍රෑම් 100),

ලක්සරි බ්ලෙනඩ්, දැව ඇසුරුම (ග්‍රෑම් 125),

ලක්සරි බ්ලෙන්ඩ් කඩදාසි පෙට්ටි ඇසුරුම (ග්‍රෑම් 125),

කොනෙයසියර් (ග්‍රෑම් 250,ග්‍රෑම් 200,ග්‍රෑම් 125 සහ ග්‍රෑම් 100)

## 3.4.8. පෙර - වෙන්දේසි තේ පෙර - නැව්ගත කිරීම් පෙර - ආනයන තේ වල තත්ත්ව පාලනය සඳහා තේ රස බැලීම සහ විශේෂ විමර්ශන

විකුණුම් වලට සති දෙකකට පෙර ඇගයීම් කටයුතු සඳහා තැරැව්කරුවන් අට දෙනා විසින්, සිය පෙර වෙන්දේසි තේ නියැදි ඉදිරිපත් කරනු ලැබේ. ඒකකය විසින් ප්‍රථමයෙන් ශ්‍රේණියෙන් බැහැර වූ දුහුවිලි කුඩු, අතිරේක සහ BOP1A නියැදි දෘෂ්‍ය පරිදි ඇගයීමට ලක් කරනු ලැබේ. අනතුරුව කාබනික ඇගයීම සිදුකරනු ලැබේ. ඇගයීමෙන් අනතුරුව තෝරාගත් නියැදි කමිටුව/මණ්ඩලය වෙත ඉදිරිපත් කරමින් සැමුහික තීරණයක් ලබා දීම සඳහා ඉදිරිපත් කර, එසේ නොවී නම්, ඉදිරියෙහිදී පැවාත්වෙන වෙන්දේසිය සඳහා නියොජ්‍ය තේ කොමසාරිස් (DTC) (අපනයන) වෙත තීරණය ලබාදෙනු නොලැබේ.

| | |
|---|---|
| දෘෂ්‍ය වශයෙන් පරික්ෂාවට ලක් කරන ලද නියැදි සංඛ්‍යාව | 134,193 |
| කාබනික | 13,810 |
| කමිටුව / මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ පෙර, වෙන්දේසි තේ නියැදි සංඛ්‍යාව | |
| මද්‍යාසාර අවසාධිත පිළිබඳව අනුමාන සඳහා | 180 |
| සිලිකාමය (සිලිසියස්) ප්‍රමාණ අන්තර්ගත | 93 |
| අපද්‍රව්‍ය කෙදි | 243 |
| අහඹු ලෙස (SL/ESL) පිළිබඳ DTC (ව්‍යා.) මගින් ඉදිරිපත් කළ පෙර / වෙන්දේසි තේ නියැදි | |
| පරික්ෂා කළ බාණ්ඩ සංඛ්‍යාව | 7,004 |
| සැක සහිත බාණ්ඩ සංඛ්‍යාව | 267 |



Colombo Tea Auction

උක්ත මෙහෙයුම් ක්‍රමයේ නියැදි නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන.) විසින් සිංහ සළකුණ/ලාංඡනය භාවිතා කිරීම පිළිබඳ ඇගයීම් කිරීම සඳහා, ISO 3720 පරාමිතීන් හෝ නැව්ගත කිරීම් වලට පෙර අනෙකුත් අවසාධිතයන් තිබේදැයි ඇගයීම සඳහා ඉදිරිපත් කෙරේ.

පෙර  නැව්ගත කිරීමේ මෙහෙයුම් යෝජනා ක්‍රමය යටතේ

පරීක්ෂා කරන ලද පෙර, නැව්ගත කිරීමේ නියැදි (සංඛ්‍යාවේ) එකතුව  4,915

නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) සමග ආනයනය සඳහා යෝග්‍ය වන ඇගයීම් ආකෘති පත්‍රය, පෙර ආනයන නියැදි සඳහා ඉදිරිපත් කෙරේ. සෑම අයදුම්පත්‍රයක් සමගම උපත, ශ්‍රේණිය, ආදිය පිළිබඳ රේඛීය නියැදි විස්තර ළකුණු කර ඇත.

රස බලන්නන් මඩුල්ල විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩල චක්‍රලේඛ අංක : OR/1/65 සහ සංශෝධනයන්හි උපදෙස් මාලාවන්ට අනුකූලව තේ වර්ග ඇගයීම සිදුකරනු ඇත.

TTU විසින් පරීක්ෂාවට ලක්කළ නියැදි ගණනෙහි එකතුව ,1,907

ආනයනික තේ භාරගත් නියැදි ලබාගෙන තේ අපනයන අංශය විසින් මෙම ඒකකය වෙත අනුමැතිය සඳහා බා ගත් තොග සියල්ල යොමු නියැදි යටතේ මෙම ඒකකය වෙත ඉදිරිපත් කෙරේ. ලබාදුන් නියැදි වලට සාපේක්ෂව මෙම නියැදි ඇගයීමට ලක් කෙරෙන අතර නියැදි පැමිනි විට ඒවා තේ රස බැලීමේ ඒකකයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා (තාක්ෂණ) විසින් ඒවා තේ රස බැලීමේ ඒකකයට පැමිණිවිට ඇගයීමට ලක් කෙරේ.

TTU මගින් පරයේෂණයට ලක් කල නියැදි සංඛ්‍යව 1,299

ශ්‍රේණිය, අවසාධිත ISO හෝ වෙනත් ඕනෑම විශේෂ තත්ත්වයක් ඇගයීම පිණිස අනුමත කළ උපලේඛනයක් පිළිබඳව බ්‍රහස්පතින්දා කමිටුව සඳහා කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) විසින් නියැදි ඉදිරිපත් කරනු ලැබේ.

## 3.4.9. පෞද්ගලික විකුණුම් කමිටු තක්සේරු සහතික කිරීම සහ සෘජු විකුණුම් තහවුරු කිරීම

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතියද සමග විකුණුම සිදු කරන තැරැව්කරු විසින් මෙම ඒකකය වෙත කමිටුව සමග සම්බන්ධිතව නියැදිය ඉදිරිපත් කළ විට පෞද්ගලික විකුණුම සහතික කරනු ලැබේ. උක්ත සේවාව වෙනුවෙන් රු. 500/, (වැට් (VAT) + ජාතික තැරැව්කාර බදු (NBT) ක සහතික කිරීමේ ගාස්තුවක් අයකරනු ලැබේ.

වර්තමානය වන විට උක්ත යෝජනා ක්‍රමය, හරිත තේ, ඓන්ද්‍රීය තේ, සුවිශේෂ තේ වර්ග සහ කොළඹ තේ වෙන්දේසි හරහා විකුණනු නොලබන කෑලි තේ සඳහා පමණක් භාවිතා වන ලෙස සීමා වී ඇත.

තේ රස කිරීමේ ඒකකය මගින් පරීක්ෂා කර

සහතික කරන පෞද්ගලික විකුණුම් බාණ්ඩ සදබ්‍යාවේ එකතුව 6,632

උක්ත යෝජනා ක්‍රමය මගින් නිශ්පාදක අපනයනකරු වෙත සිය නිශ්පාදන විදේශිය ගැනුම්කරුවන් වෙත සෘජුවම විකුණා ගැනීමට අවකාශ ලබා දේ. තවද, දේශීය තේ ගැනුම්කරුවන් වෙත හරිත තේ, ඓන්ද්‍රීය තේ සහ සුවිශේෂී තේ වර්ග විකුණාගත හැකිය. සෘජු විකුණුම් සහතික කරනුයේ බ්‍රහස්පතින්දා කමිටුව මගින් සහතික කරනු ලැබේ.

ඒකකය මගින් සහතික කළ සෘජු විකුණුම් රේඛාවන්හි එකතුව 1,768



Micro biological analysis



Chemical analysis



Coli form analysis in microbiological lab



Pesticide residue analysis

# 3.5. විශ්ලේෂණ රසායනාගාරය

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

සමාලෝචනය වන වර්ෂය වන 2012 දී, විශ්ලේෂණ විද්‍යාගාර අංශය විසින් රසායනික ක්ෂුද්‍රජීව විද්‍යා සහ කෘමිනාශක අවශේෂ තේ නියැදිවල ඇතිදැයි පරීක්ෂා කිරීම පිණිස තේ නියැදි 5042 ක් පරීක්ෂා කරන ලදි. පර්යේෂණය සඳහා ලද එබදු තේ නියැදි අංශ දෙකක් හරහා ලැබිණ. අභ්‍යන්තර මෙහෙයුම් සේවාව (IMS) සහ බාහිර සහතිකකරණ සේවාව (ECS)ස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව වෙන්දේසියට පෙර හා නැව්ගත කිරීමට පෙර තේ මණ්ඩල විසින් සිය පරීක්ෂකයන් කණ්ඩායමට විසිර ගොස් තේ නියැදි අහඹු ලෙස ලබාගන්නා මෙන් තේ මණ්ඩලය යොමු කරනු ලැබේ.IMS යෝජනා ක්‍රමය විසින් තේ ඉවත් කිරීමේ සියළු ස්ථාන ආවරණය කරනු ලැබේ. තේ නිෂ්පාදකයින්, තේ තැරැව්කරුවනගේ ගබඩා/ගුදම්, තේ සම්මිශ්‍ර කිරීම සහ ඇසුරුම් කිරීම සහ තේ අපනයනකරුවන්ගේ සහතික කිරීමේ අවශ්‍යතා ඔවුන්ගේ ගැනුම්කරුවන්ගේ අවශ්‍යතා වලට අනුව ආවරණය කෙරේ. 2012 කාලය තුලදී, සම්පූර්ණයෙන් සිදු කරන ලද කාර්යයන් අතර IMS යටතේ ලද නියැදි මත පදනම්ව, පරීක්ෂණ 2445 (49% ක් පමණ) ක් සිදුකරන ලද අතර, ECS යටතේ සිදුකරන ලද මුළු පරීක්ෂණ සංඛ්‍යාව 2571 ක් (51% ක් පමණ) විය. මේවා අතරින් පරීක්ෂණ 3950 ක් රසායනික විශ්ලේෂණ අංශය මගින්ද (78.5% ක් පමණ), පරීක්ෂණ 1066 ක් (21% ක් පමණ) ක්ෂුද්‍රජීව විශ්ලේෂණ අංශය මගින්ද සිදුකරන ලදී. අනෙක් ඉතිරි පරීක්ෂණ එනම් පරීක්ෂණ 26 ක් (0.5%) පළිබෝධ විශ්ලේෂණ ඒකකය මගින් සිදුකරන ලදී.

තේ ඉහලම තත්ත්වයෙන්ද ප්‍රමිතියෙන්ද යුතු බවට තේ නියැදි හඳුනාගැනීම හැරුණු විට පරීක්ෂණ සේවා සැපයීම වෙනුවෙන් විශ්ලේෂණ රසායනාගාරය විසින් ගාස්තු අයකරනු ලබන අතර, 2012 වර්ෂයේදී රසායනාග ාරය විසින් උත්පාදනය කරන ලද සම්පූර්ණ ආදායම රු.4,858,000.00 කි. අපනයනකරුවන්ගේ දායකත්වය රු.2,815,000.00 (58%) ක් වු විට අභ්‍යන්තර අංශයන්හි ආදායම් දායකත්වට රු.2,043,000.00 (42%) ක් විය.

# 03

## 3.5.1 වගුව : 2011/2012 වර්ෂය තුල කාර්යසාධන පරීක්ෂණයන් හා සාරංශය

| රසායනික විශ්ලේෂන ඒකකය | පරීක්ෂණ ගණන | |
|---|---|---|
| | 2011 | 2012 |
| **පරීක්ෂණයෙහි නම** | | |
| 01. තේ වල ඇති තෙතමනය තීරණය කිරීම | 184 | 538 |
| 02. තේ වල ඇති සම්පූර්ණ අළු ප්‍රමාණය තීරණය කිරීම | 691 | 198 |
| 03. තේ වල ඇති ජලයේ දියවන අළු ප්‍රමාණය තීරණය කිරීම | 482 | 188 |
| 04. තේ වල ඇති දියනොවන ආම්ලික අළු ප්‍රමාණය තීරණය කිරීම | 651 | 188 |
| 05. තේ වල ඇති ජල කොටස් තීරණය කිරීම | 511 | 188 |
| 06. තේ වල ඇති ජලයේ දියවන අළු ප්‍රමාණයේ භාෂ්මිකතාවය තීරණය කිරීම | 522 | 190 |
| 07. තේ වල ඇති අපද්‍රව්‍ය කෙඳි ප්‍රමාණය තීරණය කිරීම | 642 | 347 |
| 08. තේ කහට වල ඇති පී.එච්. අගය තීරණය කිරීම | 35 | 2 |
| 09. තේ වල ඇති සයනයිඩ් අවසාධනය වීම් පිළිබඳ තත්ත්ව විශ්ලේශනය | 711 | 623 |
| 10. තේ වල ඇති ආසනික් අවසාධනය වීම් පිළිබඳ තත්ත්ව විශ්ලේශනය | 720 | 622 |
| 11. මුලික විකිරණය තීරණය කිරීමේ පරීක්ෂණ | 1035 | 727 |
| 12. අනෙකුත් පරීක්ෂණ (වර්ණ ණී සීනා, ජෙල්, මද්‍යසාර, වර්ණක, රසකාරක, එකතු කිරීම් පිළිබඳ රසායනික හදුනාගැනීම්, බයිකබනේට, වෙනත් එකතු කිරීම්) | 163 | 2 |
| 13.ශ්‍රේණිය හදුනාගැනීමේ පරීක්ෂණ/පෙරහන් විශ්ලේශන | - | 16 |
| 14. තේ වල ඇති යකඩ ප්‍රමාණය තීරණය කිරීම | 175 | - |

| | | |
|---|---|---|
| **ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේශන ඒකක** | | |
| 01.සම්පූර්ණ පට්ටිකා ප්‍රමාණය තීරණය කිරම (මුළු බැක්ටීරියා අන්තර්ගතය) | 543 | 352 |
| 02. යීට්ස් සහ දිලීර ප්‍රමාණය තීරණය කිරීම | 561 | 370 |
| 03. මියගිය හෝ සජීවී කෘමීන් සහ වෙනත් අපකාරක/බාහිර ද්‍රව්‍ය තේ වල අඩංගුදැයි බැලීම සදහා අන්වීක්ෂීය පරීක්ෂණ | 08 | 12 |
| 04. තේ වල ඇති ජානමය වැඩිදියුණු කිරීම් වලින් සකසන ලද විශේෂ (GMO) පිළිබඳ තීරණය කිරීම | 117 | 121 |
| 05. මළ කොලිෆෝම් සහ Escherichia coli (E.coli) හදුනා ගැනීම සහ ගණනය කිරීම | 92 | 163 |
| 06. මුළු කොලිෆෝම් ප්‍රමාණය හදුනාගැනීම සහ ගණනය කිරීම | 90 | 169 |
| **පලිබෝධනාශක අවශේෂ විශ්ලේශන ඒකකය** | | |
| 01. ක්‍රමවේද තක්සේරුකරණය සහ ආර හා ඩී වැඩ | - | 26 |
| | | |
| එකතුව | 7933 | 5042 |

## 3.5.1. පරීක්ෂණ සහතිකපත්

2012 වර්ෂයේදී නිකුත් කරන ලද මුළු සහතික ප්‍රමාණය 1178 කි. කෙසේ නමුදු, 2011 ක් වූ පසුගිය වර්ෂය (2028 ක මුළු අගයක්) සමග සංසන්දනය කිරීමේදී, 2012 වර්ෂයේදී පරීක්ෂණ බාණ්ඩ කාර්යසාධනයක් නොකිරීම හේතුවෙන් නිකුත් කළ සහතිකපත් ප්‍රමාණයෙහි සුළු අඩුවීමක් දැකිය හැකි විය.

### නිකුත් කරන ලද සහතික වල බාණ්ඩ

1. තේ වල ඇති තෙතමනය සම්බන්ධ පරීක්ෂණ වාර්තාව
2. ISO 3720 අවම ප්‍රමිති පරාමිතීන් සමග තේ වල ප්‍රමිතිය සහතික කිරීම
3. රසායනික ද්‍රව්‍ය සම්බන්ධ පරාමිතීන් (සහ රසායනික කවලම් කිරීම්) වෙනුවෙන් තේ සහතිකකරණය
4. තේ වල ඇති සිලිසියස් (සිලිකාමය) කොටස්, තේ වල ඇති දුහුවිලි/කුඩු කොටස් විශ්ලේශනය සහ තේ වල පෙරීම පිළිබඳ විශ්ලේශනය පිළිබඳ සහතිකකරණය
5. තේ වල අතිරේක ද්‍රව්‍ය/ මියගිය සහ/හෝ සජීවී කෘමීන්,අනවශ්‍ය ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය සම්බන්ධව අන්වීක්ෂීය පරීක්ෂණ සිදුකිරීම පිළිබඳ සහතිකකරණය
6. බැක්ටීරියා, පුස්, සහ දිලීර වර්ධනය, ඊ කෝලයි, කොලිෆෝම්, සහ සැල්මොනෙල්ලා යන ක්ෂුද්‍රජීවීන් විශේෂයෙන් තේ වල අන්තර්ගත වී ඇති දැයි සහතික කිරීම.
7. ජාන වෙනස් වූ විශේෂ (GMO) තේ වල අඩංගු දැයි සහතික කිරීම.

## 3.5.2.
## විශ්ලේශන රසායනාගාරයෙහි පරීක්ෂණ සේවා හරහා ආදායම් රැස් කිරීම

සේවාලාභීන්ගෙන් ලැබෙන ඉල්ලීම් අනුව සිදුකරනු ලබන පරීක්ෂණ සේවාවන් සඳහා විශ්ලේශන රසායනාගාර ගාස්තු 2010.08.06 දිනැති අංක. OR/1/87 දරණ තේ මණ්ඩල චක්‍රලේඛය ප්‍රකාරව අයකරනු ලැබේ. රසායනාගාරයෙහි මුළු ආදායමට අපනයනකරුවන්ගෙන් සෘජුව ලද පරීක්ෂණ ගාස්තු (එනම් 58%) සහ විශ්ලේශන රසායනාගාරය මගින් ස්ථිර කරන ලද පරිදි "ප්‍රමිතියෙන් අඩු තේ" බාණ්ඩයට ගැනෙන තේ කොමසාරිස්ගේ අංශයෙහි සහ තේ අපනයන අංශයෙහි ඉපයූ මුදල් (එනම් 42%) එකතුව ගැනේ.

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

**3.5.2 වගුව : මුළු ආදායමෙහි කොටස : අභ්‍යන්තර මෙහෙයුම් වලට සාපේක්ෂව භාහිර සහතිකකරණය.**

| | වර්ෂය 2011(Rs.) | % | වර්ෂය 2012 (Rs.) | % |
|---|---|---|---|---|
| අභ්‍යන්තර මෙහෙයුම් සේවාව (IMS) | 2,665,600 | 43.91 | 2,043,000 | 42.05 |
| භාහිර සහතිකකරණ සේවය (Ecs) | 3,405,600 | 56.09 | 2,815,000 | 57.95 |
| මුළු අදායම, රු. | 6,071,200 | | 4,858,000 | |

රසායනාගාර විශ්ලේෂණ සේවාවන්හි සොයාගැනීම් පදනම් කර ගනිමින්, විවිධ රසායනික ද්‍රව්‍ය මුසුවූද ප්‍රමිතියෙන් පහල ගියාවූද තේ තොග වලට එරෙහිව තේ කොමසාරිස් සහ නියෝජ්‍ය කොමසාරිස් (අපනයන) විසින් නිත්‍යනුකූල පියවර ගන්නා ලදී. ඒ අනුව, තොග 556 ක් ප්‍රමිතියෙන් අඩු බවට සලකා සැලකිල්ලට භාජනය වු සමාලෝචිත වර්ෂය වන 2012 දී නීත්‍යානුකූල පියවර ගන්නා ලදී.

**2011 වර්ෂය සමග සසඳද්දී 2012 ජනවාරි 1 සිට දෙසැම්බර් දක්වා කාලය තුල ආදායමෙහි පහල යාමක් විය**

| | වර්ෂය 2012 (Rs.) | වර්ෂය 2011 (Rs.) |
|---|---|---|
| මුළු ආදායම | 4,858,000.00 | 6,071,200.00 |

## 3.5.3.විශ්ලේෂණ රසායනාගාරයෙහි එක් එක් ඒකක වල කාර්යසාධනය

### 3.5.3.1.තත්ත්ව පරීක්ෂණය සහ නියැදිකරණ ඒකකය

ජාත්‍යන්තර සහතිකකරණය සඳහා කටයුතු කරනු ලබන ඕනෑම පරීක්ෂණ රසායනාගාරයක් සඳහා, ලේඛන පාලන පටිපාටියක් පවත්වාගෙන යාම අනිවාර්යය වේ. එබැවින්, තත්ත්ව පරීක්ෂණ ඒකකයෙහි ප්‍රධාන ක්‍රියාකාරීත්වය වන්නේ, ISO 17025 ප්‍රමිතීන් මත, රසායනාගාර සහතිකකරණය සඳහා ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුව රසායනාගාර ලේඛනකරණ පටිපාටිය පවත්වා ගැනීමයි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය වන 2012 දී රසායනික, ක්ෂුද්‍ර ජීවී විද්‍යාත්මක සහ පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකක වල අභ්‍යන්තර ලේඛන පාලන පටිපාටි ස්ථාපිත කොට පවත්වා ගන්නා ලදි. උක්ත කරුණට අමතරව මෙම දායකත්වය මගින් රසායනාගාර නියැදි කොටස් ලැබීම සහ නිකුත් කරන කොටස් වාර්තා කිරීම සිදුකරයි. අධ්‍යපන සුදුසුකම් සහිත නව තත්ත්ව කළමනාකරණ නිලධාරියකු (QMO) පත් කර ගැනීම සහ තත්ත්ව පරීක්ෂණ හා නියැදි ඒකකයට ස්ථානයක් සැපයීම, විශ්ලේෂනාත්මක රසායනාගාර විසින් 2012 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් සාක්ෂාත් කර ගන්නා ලදි.

මිනිස් පරිභෝජනය සඳහා නුසුදුසු යැයි හඳුනාගත් තේ වර්ග අපහරණයට පෙර අවශ්‍යතාවක් ලෙස තේ (රසායනාගාර) සහ තත්ත්ව කළමණාකරණ (QMO) සම්බන්ධ විය. 2012 වර්ෂය තුළ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි සහකාර අධ්‍යක්ෂ (රසායනාගාර) විසින් විශේෂ අවස්ථා ලෙස සලකා නියැදි ක්ෂේත්‍ර හතරක් පරීක්ෂණයට සම්බන්ධ වන ලදී.

### 3.5.3.2. රසායනික විශ්ලේෂණ ඒකකය:

තාක්ෂණික දක්ෂතාවෙන් යුත් විශ්ලේෂකයකු බඳවා ගැනීම 2012 වර්ෂයේදී රසායනික විශ්ලේෂණ ඒකකය විසින් ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයකි. සහකාර අධ්‍යක්ෂවරයාගේ (රසායනාගාර) අධීක්ෂණය යටතේ, විශ්ලේෂක (රසායනාගාර) විසින් පහත දැක්වෙන කටයුතු ඇයගේ කණ්ඩායමත් සමග කටයුතු කරමින් ඉටු කිරීමට සමත් වූවාය..

1. වෙන්දේසිය සහ පෙර නැව්ගත කිරීමට ප්‍රථම, පහත් තත්ත්වයෙන් යුත් නිෂ්පාදිත තේ පිළිබඳව රසායනික ඇගයීම් සිදු කිරම.
2. ස්ථාපිත ISO 3720 තත්ත්ව සහතිකයන්ට සාපේක්ෂව රසායනික ඇගයීම් ඉටු කිරීම (එයට අයත් වන නිර්නායකයන් වන්නේ : සම්පූර්ණ අළු, ජලයේ දියවන අළු , භාෂ්මිකතාව/ක්ෂාරීයතාව, අම්ලයන්හි දිය නොවන අළු, ජල කොටස් ,තෙතමනය, සහ අපද්‍රව්‍ය කෙඳි කොටස්)
3. පෙරහන් විශ්ලේෂණ තාක්ෂණය උපයෝගී කර ගනිමින් තේ දුහුවිල්ල හා පිටි අන්තරගතයන් පිළිබඳ ඇස්තමේන්තුව
4. තේ වල අන්තර්ගත සිලිසියස් (සිලිකාමය) ද්‍රව්‍ය කොටස් පිළිබඳ ඇස්තමේන්තු කිරීම

අනෙකුත් වැදගත් අවස්ථා/කටයුතු අතරම, අන්තර් රසායනාගාර ශක්‍යතාව පරීක්ෂා කිරීමේ වැඩසටහනට සහභාගී වීමද විශේෂයෙන් දැක්විය හැකිය. මෙම වැඩසටහන මගින් රසායනික විශ්ලේෂණ ඒකකයෙහි කාර්යමණ්ඩලයේ දක්ෂතාව වර්ධනය කිරීමට අවකාශ සැලසේ.

රසායනික විශ්ලේෂණ ඒකකයෙහි කාර්ය මණ්ඩල සැකැස්ම වන්නේ, ස්ථානභාර නිලධාරී ලෙස එක් විශ්ලේෂකයකු (රසායනික) තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙක් (කොන්ත්‍රාත් පදනමින්) සහ සහකාර අධ්‍යක්ෂ (රසායනාගාර) ගේ අධීක්ෂණය යටතේ එක් රසායනාගාර සහායකයෙක් ලෙසිනි.

### 3.5.3.3.ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය:

සමාලෝචිත 2012 වර්ෂය තුළ, අනෙකුත් සාමාන්‍ය/ඒකාකාරී රස බැලීම් සමග සංසන්දනය කරද්දී ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පර්යේෂණයන්හි ඉතාමත් කැපී පෙනෙන තත්ත්වයන් වන්නේ සැකසූ තේ වල මළ, කොලිෆෝම්, ඊ - කෝලයි, සහ මුළු කොලිෆෝම් තත්ත්වයන් පිළිබඳ පරීක්ෂා කිරීම සහ ගණනය කිරීමයි, තවද සම්පූර්ණ පට්ටිකා සංඛ්‍යාව (සම්පූර්ණ බැක්ටීරියා ප්‍රමාණය) යීස්ට් සහ දිලීර ප්‍රමාණයන්ද පරීක්ෂාවට ලක් කෙරේ.

ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය සැදුම් ලද්දේ ස්ථානභාර නිලධාරී ලෙස එක් විශ්ලේෂකයකු, එක් තාක්ෂණ සහකාරවරයකු (කොන්ත්‍රාත්) පදනමින් සහ රසායනාගාර සහායකයකු වශයෙන් සහකාර අධ්‍යක්ෂ (රසායනාගාර) යටතේය.

### 3.5.3.4.පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය:

තේ පර්යේෂණ ආයතනයෙහි, අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ බාහිර විශේෂඥයින් දෙදෙනෙකු විසින් පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණයෙහි තාක්ෂණික ඥානය තාක්ෂණිකව හුවමාරු කිරීම, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව හඳුන්වා දෙන ලදී. ඒ අනුව, පළිබෝධනාශක පහක් සඳහා ආනයන පරීක්ෂණ සහතිකකරණය සඳහා අවශ්‍ය වන, පුහුණු විශ්ලේෂනය අඛණ්ඩව සිදු කරගෙන යාමට පියවර ගෙන ඇත. එනම්, ඇල්ෆා එන්ඩොසල්ෆන්, බීටා එන්ඩොසල්ෆන්, බිෆෙන්ත්‍රින්, 2,4,ඩී, සහ MCPA ය. මෙම පුහුණු වැඩසටහන් යටතේ, පවත්නා ක්‍රමය වඩාත් ප්‍රචුලව භාවිතා වන ජර්මානු ක්‍රමවේදවල තත්ත්වයට ඉහළ නංවන ලද අතර පර්යේෂණාත්මක පුහුණුවීම් (QuEChERS )
නම් නව සුළු ISO ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට භාවිතා කරන ලදී.

පළිබෝධනාශක විශ්ලේෂණ ඒකකයෙහි සැකැස්ම වන්නේ, කාර්යභාර නිලධාරී ලෙස එක් විශ්ලේෂකයකු (රසායනික / පළිබෝධනාශක), තාක්ෂණික සහකාරවරු (කොන්ත්‍රාත් පදනමින්) සහ රසායනාගාර සහායකයෙකි. 2012 දෙසැම්බරයේදී විශ්ලේෂක (රසායනික /පළිබෝධනාශක) විසින් ඇයගේ ඉල්ලා අස්වීමේ ලිපිය භාරදුන් අතර අනතුරුව සහකාර අධ්‍යක්ෂ (රසායනාගාර) ගේ අධීක්ෂණය යටතේ පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකයේ විශ්ලේෂක වෙනුවට වැඩ බැලීම සඳහා තත්ත්ව කළමනාකරණ නිලධාරී අනුයුක්ත කරන ලදී.



The New Board Room






*Interior of Sri Lanka Tea Board's re-furbished main secretariat building*

# 3.6. පරිපාලන අංශය

03

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

## 3.6.1.ප්‍රධාන ජයග්‍රහන

2012 වර්ෂය ශ්‍රී ලංකා තේ මණ්ඩලයට විශේෂිත වර්ෂයක් විය. වසර 30ක අතීතයක් ඇති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන ලේකම් කාර්යාල ගොඩනැගිල්ල එබදු කාලයකට පසු 2012 වර්ෂයේදී ප්‍රතිසංස්කරණය කරන ලදි. නව්‍යකරණය කළ ගොඩනැගිල්ලේ ප්‍රතිරූපය තේ මණ්ඩලයේ බාහිර පෙනුමට වැඩ අගයක් එක් කළ අතර එහි විවෘත කිරීමේ උත්සවය සඳහා ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමන් සහ නියෝජ්‍ය අර්ල් ගුණසේකර මැතිතුමන් සහභාගී විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත නව අවශ්‍යතා/බඳවාගැනීම් සිදුකිරීම වළක්වාලීමේ ගැටලුවට විසදුම් සලසා දෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පැවති තනතුරු පුරප්පාඩු පිරවීමට හැකියාව ලැබීම මෙම වසරේ ලබාගත් කැපී පෙනෙන සාර්ථකත්වයක් ලෙස සඳහන් කළ යුතුය. එමගින් පසුගිය වසර කිහිපය තුළ ගැටලු රැසක් ඇති කළ අතර සේවක මණ්ඩල හිගය හේතුකොට ගෙන ඇති වූ ගැටලු විසදාලමින් සේවකයින් වැඩි ප්‍රමාණයක් 2010 වර්ෂය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත බඳවා ගැනීමට හැකියාව ලැබුණි.



*The new look of the secretariat reception*



*Pirith Ceremony on the opening of the Sri Lanka Tea Board's re-furbished main secretariat building*







*The opening of the re-furbished secretariat building was commemorated by the SLTB staff together with the ministry and industry officials with an all night pirith ceremony which was followed by an alms giving to the "maha sangha"*



**03**

තේ මණ්ඩලය මගින් සිදුකරන ලද ක්‍රියාකාරකම්

**8.1 වගුව : 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි කාර්ය මණ්ඩල ව්‍යුහය**

| ශ්‍රේණිය | අනුමත කාර්යමණ්ඩලය | 31.12.2012 දිනට තත්‍ය තත්ත්වය |
|---|---|---|
| කළමනාකරණ ශ්‍රේණිය | 4 | 5 |
| විධායක ශ්‍රේණිය | 27 | 20 |
| මධ්‍යම ශ්‍රේණිය | 193 | 153 |
| පහල ශ්‍රේණිය | 76 | 69 |
| එකතුව | 300 | 247 |

## 3.6.2.
## 2012 වර්ෂය තුලදී පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් දේශීය වැඩසටහන්

| වැඩසටහන් දේශීය | ආයතනය | පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|---|
| තදබල,කාර්මික හා පාරිසරික යෙදුම් පිළිබඳ සම්මන්ත්‍රණය | ලංකා රසායන විද්‍යා ආයතනය | 1 |
| ISO/IEC 17025:2005 – රසායනාගාර කලමනාකරණ පද්ධති අභ්‍යන්තරව විගණනය යන මැයෙන් යුත් පුහුණුව | දින ශ්‍රී ලංකා සහතික කිරීමේ මණ්ඩලය | 2 |
| IA, SAARC, FTA හි වෙලදපොළ අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණයට | ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය | 1 |
| සහායක ආහාර සහ පිරිසිදු පානීය ජලය පිළිබඳ සහතික කිරීමේ ජාතික සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා සහතික කිරීමේ මණ්ඩලය | 1 |
| දත්ත පද්ධති යෙදුම් සඳහා VB.Net වැඩසටහන්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ජාතික ව්‍යාපාර කලමනාකරණ ආයතනය | 1 |
| ඉහළ කම්කරු ඵලදායීතාවක් සඳහා කලමනාකරණය | කම්කරු අධ්‍යන පිළිබඳ ජාතික ආයතනය | 10 |
| ISO/IEC 17025:2005 – තත්ත්ව ආරක්ෂණය, ක්‍රමාංකනය කිරීම, සහ අවිනිශ්චිතතාව මැනීම පිළිබඳ මූලිකාංග යන මැයෙන් යුත් සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා සහතික කිරීමේ මණ්ඩලය | 1 |
| පොදු ප්‍රසම්පාදන පටිපාටිය පිළිබඳ සම්මන්ත්‍රණය | සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල | 1 |
| "2012 අයවැයෙන් පැන නැගි මූල්‍ය ප්‍රතිපත්ති" යන මැයෙන් යුතු වු බදු පිළිබඳ සම්මන්ත්‍රණය | ජාත්‍යන්තර මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සංගමය | 2 |
| තොරතුරු සමග විද්‍යඥයින් බලගැන්වීම පිළිබඳ සම්මන්ත්‍රණයට | ජාතික පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය | 2 |
| තේ නිපදවීම සහ කම්හල් පුරුදු පිළිබඳ වෘත්තීය වැඩසටහන | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | 5 |
| ලද සාර්ථක පිළිගැන්වීමේ නිපුනතා පිළිබඳ වැඩමුළුව | සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල | 2 |
| පිළිගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන | කම්කරු අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය | 1 |
| "ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාවන්හි ප්‍රමිතිය" යන මැයෙන් යුත් සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාවන්හි ප්‍රමිතියම යන මැයෙන් යුත් සම්මන්ත්‍රණය | 2 |
| එකතුව | | 32 |
| **මානව සම්පත් සංවර්ධන වැඩසටහන් විදේශීය** | **ආයතනය** | **පුද්ගලයන් සංඛ්‍යාව** |
| තේ රසබැලීම සහ තත්ත්ව සුරක්ෂිත වෙළදාම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | ඉන්දියාවේ කෝතරි කෘෂිකාර්මික කළමනාකරණ මධ්‍යස්ථානය | 1 |
| තේ වැවිලි කළමනාකරණ පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන පිළිබඳ සම්මන්ත්‍රණයට | ඉන්දියාවේ කෝතරි කෘෂිකාර්මික කළමනාකරණ මධ්‍යස්ථානය | 2 |
| දියුණු වෙමින් පවත්නා රටවල් සඳහා වන දූෂණයෙන් තොර තේ නිශ්පාදන තාක්ෂණයක් පිළිබද පුහුණු පාඨමාලාව | චීනයේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සෙන්ෂු විද්‍යාලයෙහ | 1 |
| සංඛ්‍යාලේඛන සහ ප්‍රක්ෂේපන පිළිබඳ කාර්ය බලකායෙහි වැඩමුළුව | අන්තර් රාජ්‍ය කණ්ඩායම ඉතාලිය | 1 |
| එකතුව | | 5 |

32

03

## 3.7. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය යනු ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුල පිහිටි ස්වාධීන කටයුත්තක් කළ හැකි, කළමනාකරණයෙහි සියළු මට්ටම් වලට සේවාවක් ලෙස කටයුතු සමාලෝචනය කිරීම සඳහා ඇති අංශයකි. අභ්‍යන්තර පාලනයන් විසින් මූල්‍ය හා මූල්‍ය නොවන අංශයන්හි සාර්ථකත්වය තුලින් ආයතනයක් තුල සම්පත් කාර්යක්ෂමව භාවිතා වන්නේ දැයි යන්න මැන බලා, ඇගයීමට ලක්කර වාර්තා කරනු ලබන පාලනයකි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි (SLTB) විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන අනුමත කොට විශේෂ පැවරුම්/පරයේෂණ ඇතුලත්ව අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කරන ලදී. මාසයේ පැවති කෝප් (COPE) රැස්වීමේ වාර්තාද සමාලෝචනය කොට විකල්ප ක්‍රමවේද ඉටුකිරීම සඳහා කළමනාකරණය වෙත උපදෙස් දෙන ලදී.

සමාලෝචිත වර්ෂයෙහිදී විගණන කමිටු රැස්වීම් තුනක් පවත්වන ලද අතර නිවැරදි කිරීමේ පියවර ගැනීම පිණිස පහසුකම් සලසන ලෙසට, වාර්තාද සමග අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

## 3.8. තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණයට සම්බන්ධ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරණ අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පවත්නා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පවත්වාගෙන යන අතරතුර සමස්ත තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කළමනාකරණය කිරීමේ වගකීම තොරතුරු තාක්ෂණ අංශය සතුය.

### 3.7.1. ප්‍රධාන ජයග්‍රහන

SOR අනුව, පළමු වරට සහකාර අධ්‍යක්ෂ ,තොරතුරු තාක්ෂණ තනතුරෙහි පැවති පුරප්පාඩුව පුරවන ලදී.

2011/12 කාලය තුල, තොරතුරු තාක්ෂණ අංශය විසින් තාක්ෂණය උපයෝගී කොටගත් ව්‍යාපෘති කිහිපයකට සම්බන්ධ විය. සාර්ථක වෙබ් අඩවියක් ලබාදීම පිණිස පවත්නා ඉහල යන ඉල්ලුමට පිටුබලයක් ලෙස නවතම තාක්ෂණය උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුව පැවති යල්පිනු වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී. ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන ආයතනය (ICTA) සමග එක්ව දියත් කරන ලද වෙබ් අඩවිය මගින් එක් ස්ථානයක දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථානයක් පරශීලක හිතකාමී වෙබ් අතුරු මුහුණතක් (user friendly web interface) සමග ආකර්ෂණීය ආකාරයට සියලු පාර්ශවයන් වෙත ලබාදීමට සහාය ලබාදේ.

"තනි කවුළු" (single window) ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රේගුව සමග එක්ව ක්‍රියාත්මක කරන ලද ඇසිකියුඩා පද්ධතිය (Ausicuda System) මගින් සාර්ථකත්වය ඉහල නංවමින්ද, තදබදය අවම කරමින්ද, ලිපිද්‍රව්‍ය කටයුතු අවම කරමින්ද, තේ වලට සම්බන්ධ සියලු අපනයන සඳහා අනුමැතිය ලබාදීමට අපනයන අංශයට හැකියාව ලබා දේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අභියෝග මගහැරවීම පිණිස සහාය වීමෙන් සහ අපනයන අංශයේ උපදෙස් ලබා ගැනීමෙන් තොරතුරු තාක්ෂණ අංශය ඉතා වැදගත් කටයුත්තක් සිදුකරන ලදී.




*Home page view of the newly re-designed web site of Sri Lanka Tea Board*

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2012 දෙසැම්බර් 31 දිනට

| වත්කම් | සටහන | 31.12.2012 දිනට රු. | 31.12.2011 දිනට රු.. | 01.01.2011 දිනට රු. |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 7 | 669,074,922 | 650,161,765 | 657,531,888 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් අයිතීන | 13 | 3,007,283 | 3,079,183 | 3,151,083 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | 9,311,278 | 7,419,800 | 7,516,589 |
| මූල්‍ය වත්කම් | 8 | 4,813 | 4,813 | 33,482,278 |
| | | 681,398,296 | 660,665,561 | 701,681,838 |
| ජංගම වත්කම් | | | | |
| භාණ්ඩ තොග | 9 | 19,948,861 | 21,943,323 | 21,860,568 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් | 10 | 39,019,571 | 37,238,603 | 40,956,574 |
| තැන්පතු සහ පෙර ගෙවීම් | | 13,111,889 | 18,359,812 | 14,676,103 |
| වෙනත් මූල්‍ය වත්කම් | 11 | 2,804,609,593 | 1,467,848,421 | 352,572,978 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | | 42,831,205 | 40,118,006 | 35,676,933 |
| | | 2,919,521,119 | 1,585,508,165 | 465,743,156 |
| මුළු වත්කම් | | 3,600,919,416 | 2,246,173,726 | 1,167,424,994 |

| හිමිකම් සහ වගකීම් | සටහන | 31.12.2012 දිනට රු. | 31.12.2011 දිනට රු. | 01.01.2011 දිනට රු. |
|---|---|---|---|---|
| දායක ප්‍රාග්ධනය | | 652,067,602 | 652,067,602 | 647,117,602 |
| රඳවා ගත් ඉපැයුම් | | (399,284,580) | 94,039,399 | 157,322,682 |
| ප්‍රවර්ධන හා අලෙවි බදු | 16 | 2,710,683,852 | 1,348,778,067 | 194,275,470 |
| විශේෂ සංචිත | 16 | 481,933,543 | | |
| මුළු හිමිකම | | 3,445,400,417 | 2,094,885,068 | 998,715,754 |
| ජංගම නොවන වගකීම් | | | | |
| සේවක ප්‍රතිලාභ | 12 | 44,034,691 | 45,640,715 | 40,861,136 |
| බැඳීම් | | 44,034,691 | 45,640,715 | 40,861,136 |
| ජංගම වත්කම් | | | | |
| විලම්බිත අලුත් කිරීමේ ආදායම් | | 7,233,260 | 9,356,260 | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 15 | 104,251,048 | 96,291,683 | 127,848,104 |
| | | 111,484,308 | 105,647,943 | 127,848,104 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 3,600,919,416 | 2,246,173,726 | 1,167,424,994 |

පිටු අංක 119 සිට 126 දක්වා සඳහන් වන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන් හි වැදගත් අංශයක් නිර්මාණය කරයි

මණ්ඩලය සඳහා ඒ වෙනුවෙන් අත්සන් කළේ

Asst.Director General (Finance) 15/05/2013

සහකාර අධ්‍යක්ෂ ජනරාල් (මුදල්)

Director General 15/05/2013

අධ්‍යක්ෂ ජනරාල්

Chairperson

සභාපති

# ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

| හිමිකම් සහ වගකීම් | සටහන | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| ආදායම | 03 | 264,677,137 | 282,996,145 |
| විකුණුම් පිරිවැය | | (8,884,992) | (11,116,474) |
| දළ ලාභය | | 255,792,145 | 271,879,671 |
| කර්මාන්තශාලා නවීකරණ / නැවත වගා කිරීමේ වියදම් | 04 | - | (27,934,212) |
| පරිපාලන වියදම් | 05 | (273,447,203) | (238,632,602) |
| අනෙකුත් මෙහෙයුම් පිරිවැය | 06 | (1,782,851) | (139,783) |
| මෙහෙයුම් ප්‍රතිලාභ | | (19,437,909) | 5,173,074 |
| මුල්‍ය පිරිවැය | | (194,353) | (523,223) |
| මුල්‍ය ආදායම් | | 8,241,826 | 4,454,110 |
| කාල පරිච්ඡේදය තුළ ලාභය | | (11,390,437) | 9,103,961 |
| පූර්ව වර්ෂයට අදාළ වෙනස් නොකරන ලද ගැලපුම් | | - | 1,756,028 |
| කාල පරිච්ඡේදය තුළ ලාභය | | (11,390,437) | 10,859,989 |

පිටු අංක 119 සිට 126 දක්වා සඳහන් වන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මුල්‍ය ප්‍රකාශනයන් හි වැදගත් අංශයක් නිර්මාණය කරයි.

# වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය

| | 2012<br>රු.. | 2011<br>රු. |
|---|---|---|
| කාල පරිච්ඡේදය තුළ ලාභය | (11,390,437) | 10,859,989 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | - | - |
| බදු අඩු කළ පසු කාල පරිච්ඡේදයට අදාළ මුළු විස්තීර්ණ ආදායම් | (11,390,437) | 10,859,989 |

පිටු අංක 119 සිට 126 දක්වා සඳහන් වන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන් හි වැදගත් අංශයක් නිර්මාණය කරයි

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය

| | දායක ප්‍රාග්ධනය රු. | ප්‍රවර්ධන හා අලෙවි බදු රුශ | විශේෂ සංචිත රු. | සමුච්චිත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 2010 දෙසැ. 31 දිනට ශේෂය | 647,117,602 | 194,275,470 | - | 157,322,683 | 998,715,755 |
| 2011 ජන. 01 දිනට ශේෂය | 647,117,602 | 194,275,470 | - | 157,322,683 | 998,715,755 |
| රජයෙන් ලැබිය යුතු මුදල් | 4,950,000 | | | | 4,950,000 |
| වර්ෂය තුළ ලාභය | | | | 10,859,989 | 10,859,989 |
| ප්‍රවර්ධන සහ අලෙවි බදු (සටහන් 16) | | 1,154,502,597 | | | 1,154,502,597 |
| භාණ්ඩාගාරයට කළ ගෙවීම් | | | | (74,143,274) | (74,143,274) |
| 2011 දෙසැ. 31 දිනට ශේෂය | 652,067,602 | 1,348,778,067 | | 94,039,398 | 2,094,885,068 |
| 2012 ජන. 01 දිනට ශේෂය | 652,067,602 | 1,348,778,067 | | 94,039,398 | 2,094,885,068 |
| ප්‍රවර්ධන සහ අලෙවි බදු (සටහන් 16) | | 1,361,905,785 | | | 1,361,905,785 |
| වර්ෂය තුළ ලාභය | | | | (11,390,437) | (11,390,437) |
| විශේෂ සංචිත (සටහන් 16) | | | 481,933,543 | (481,933,543) | - |
| 2012 දෙසැ. 31 දිනට ශේෂය | 652,067,602 | 2,710,683,852 | 481,933,543 | (399,284,582) | 3,445,400,415 |

පිටු අංක 119 සිට 126 දක්වා සඳහන් වන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන් හි වැදගත් අංශයක් නිර්මාණය කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය

| මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය | (11,390,437) | 10,859,989 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය සඳහා ගැලපුම් | | |
| අස්පෘෂ්‍ය වත්කම් | 26,904,372 | 25,299,620 |
| මූල්‍ය පිරිවැය | 108,522 | 96,789 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 194,353 | 523,223 |
| මූල්‍ය ආදායම් | 5,859,469 | 7,764,121 |
| දේපළ, පිරියත හා උපකරණ අපහරණයෙන් ලද ලාභ හෝ පාඩු | (8,579,826) | (4,454,110) |
| බදු ඉඩම් ක්‍රම ක්ෂය වීම් | 1,582,649 | 3,695,874 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | 71,900 | 71,900 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු අඩුවීම්/ (වැඩිවීම්) | 14,751,003 | 43,857,405 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු වැඩිවීම්/ (අඩුවීම්) | 3,466,955 | 34,262 |
| විලම්භිත අලුත් කිරීම් ආදායම් වැඩිවීම/ (අඩුවීම්) | 7,959,365 | (31,556,421) |
| භාණ්ඩ තොග වැඩිවීම් / (අඩුවීම්) | (2,123,000) | 9,356,260 |
| මෙහෙයුම් වලින් ජනිත මුදල් | 1,994,462 | (82,755) |
| පොලී ගෙවීම් | 26,048,785 | 21,608,751 |
| පාරිතෝෂික ගෙවීම් | (194,353) | (523,223) |
| මෙහෙයුම් කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය | (7,465,493) | (2,984,542) |
| ආයෝජන කටයුතු වලදී (සංචිත) මුදල් ප්‍රවාහ | 18,388,939 | 18 ,100,986 |
| මූල්‍ය ආදායම් ලැබිය යුතු මුදල් | | |
| ආයෝජන | 8,579,826 | 4,454,110 |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම | (1,336,761,172) | (1,081,797,978) |
| මූල්‍ය කටයුතු වලදී (භාවිත) / ශුද්ධ මුදල් ප්‍රවාහ | (49,400,179) | (16,675,367) |
| ඒකාබද්ධ අරමුදලට අරමුදල් මාරු කිරීම් | (1,377,581,525) | (1,094,019,235) |
| | | |
| | | (74,143,274) |
| ප්‍රවර්ධන හා අලෙවි බදු | 1,361,905,785 | 1,154,502,597 |
| මූල්‍ය කටයුතු වලදී භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහ | 1,361,905,785 | 1,080,359,323 |
| මුදල් හා මුදල් සමාන වස්තුවල ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම්) | 2,713,199 | 4,441,073 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන වස්තු | 40,118,006 | 35,676,933 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන වස්තු | 42,831,205 | 40,118,006 |

පිටු අංක 119 සිට 126 දක්වා සඳහන් වන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන් හි වැදගත් අංශයක් නිර්මාණය කරයි.

| 6. වෙනත් වියදම් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. |
|---|---:|---:|
| ව්‍යාපාර පිරිවැටුම් බද්ධ | - | - |
| වට්ටම් දීමනා | 158,144 | 139,783 |
| අලෙවියෙන් ලද පාඩු (විදේශ මුදල් මත) | 604 | - |
| හුවමාරුවල වෙනස - පාඩු | 1,624,103 | - |
| | 1,782,851 | 139,783 |

32

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය

7 දේපළ පිරියත හා උපකරණ

| | සින්නක්කර ඉඩම් | ගොඩනැගිලි | කාර්යාල උපකරණ | ගෘහ භාණ්ඩ හා උපකරණ | මෝටර් රථ සහ වෙනත් වාහන | පුස්තකාල පොත් | පරිගණක | රසායනාගාර උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය හෝ තක්සේරු කිරීම | | | | | | | | | |
| 2011 ජනවාරි 1 දිනට | 350,241,280 | 219,175,010 | 42,014,397 | 16,288,962 | 34,922,879 | 383,044 | 21,015,352 | 83,754,217 | 767,795,141 |
| එකතු කිරීම | - | 1,544,482 | 9,064,130 | 1,067,066 | 4,950,000 | - | 2,787,387 | 3,362,268 | 22,775,333 |
| අපහරණ | - | - | (498,142) | (30,310) | (3,800,000) | - | (89,885) | - | (4,418,337) |
| | 350,241,280 | 220,719,492 | 50,580,385 | 17,325,718 | 36,072,879 | 383,044 | 23,712,854 | 87,116,485 | 786,152,137 |
| 2011 දෙසැ. 31 දිනට | | | | | | | | | |
| එකතු කිරීම | - | 28,607,604 | 2,846,512 | 4,790,423 | 6,910,540 | - | 2,389,093 | 2,283,568 | 47,827,740 |
| අපහරණ | - | - | (4,290,734) | (347,993) | (65,000) | - | (1,151,090) | - | (5,854,817) |
| 2012 දෙසැ. 31 දිනට | 350,241,280 | 249,327,096 | 49,136,163 | 21,768,148 | 42,918,419 | 383,044 | 24,950,857 | 89,400,053 | 828,125,060 |
| ක්ෂය වීම් සහ හානිකරණ | - | | | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට | - | 13,856,758 | 35,713,450 | 9,257,811 | 2,908,456 | 321,939 | 17,968,854 | 34,014,909 | 114,042,177 |
| වර්ෂයට අදාළ ක්ෂය ගාස්තු | - | 4,431,278 | 3,183,088 | 1,173,065 | 3,317,722 | 19,618 | 1,282,320 | 11,892,529 | 25,299,620 |
| අපහරණ | - | - | (430,490) | (25,217) | (190,000) | - | (76,760) | - | (722,467) |
| 2011 දෙසැ. 31 දිනට | - | 18,288,036 | 38,466,048 | 10,405,659 | 6,036,178 | 341,557 | 19,174,414 | 45,907,438 | 138,619,330 |
| ක්ෂය වීම් සඳහා ගාස්තු | - | 4,539,687 | 3,335,616 | 1,320,839 | 4,012,975 | 19,618 | 2,806,531 | 10,869,106 | 26,904,372 |
| අපහරණ | - | - | (3,926,461) | (323,244) | (16,250) | - | (1,151,090) | - | (5,417,045) |
| 2012 දෙසැ. 31 දිනට | - | 22,827,723 | 37,875,203 | 11,403,254 | 10,032,903 | 361,175 | 20,829,855 | 56,776,544 | 160,106,657 |
| කෙරිගෙන යන වැඩ | | | | | | | | | |
| 2011 ජනවාරි 1 දිනට | | 1,149,966 | 236,428 | | | | 2,392,530 | | 3,778,924 |
| 2011 දෙසැ. 31 දිනට | | | 236,428 | | | | 2,392,530 | | 2,628,958 |
| 2012 දෙසැ. 31 දිනට | | | | | | | 1,056,519 | | 1,056,519 |
| ශුද්ධ පොත් අගය | | | | | | | | | |
| 2012 දෙසැ. 31 දිනට | 350,241,280 | 226,499,373 | 11,260,960 | 10,364,894 | 32,885,516 | 21,869 | 5,177,521 | 32,623,509 | 669,074,922 |
| 2011 දෙසැ. 31 දිනට | 350,241,280 | 202,431,456 | 12,350,765 | 6,920,059 | 30,036,701 | 41,487 | 6,930,970 | 41,209,047 | 650,161,765 |
| 2011 ජනවාරි 01 දිනට | 350,241,280 | 206,468,218 | 6,537,375 | 7,031,151 | 32,014,423 | 61,105 | 5,439,028 | 49,739,308 | 657,531,888 |

32

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය

| 8. මූල්‍ය වත්කම් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. | 2010.12.31 දිනට රු. |
|---|---|---|---|
| තැන්පතු | - | - | 33,477,465 |
| වෙනත් | 4,813 | 4,813 | 4,813 |
| | 4,813 | 4,813 | 33,482,278 |

| 9. භාණ්ඩ තොග | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. | 2010.12.31 දිනට රු. |
|---|---|---|---|
| රසායනාගාර හා අනෙකුත් සේවා | 6,527,173 | 5,319,852 | 5,998,967 |
| තේ | 11,381,133 | 15,174,051 | 15,083,413 |
| පරිභෝජන ද්‍රව්‍ය | 2,040,555 | 1,449,420 | 778,188 |
| | 19,948,861 | 21,943,323 | 21,860,568 |

| 10. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රුග | 2010.12.31 දිනට රු. |
|---|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල් | 961,175 | 472,756 | 1,543,759 |
| වෙළඳ ලැබිය යුතු මුදල් - මොස්කව් | - | 533 | 21,468 |
| කර්මාන්තශාලා නවීකරණය සහ නැවත වගා කිරීමේ ලැබිය යුතු සහනාධාර | 2,669,759 | | |
| කාර්ය මණ්ඩල ලැබිය යුතු මුදල් | 31,760,973 | 56,111,794 | 56,982,606 |
| ලැබිය යුතු මුදල් -ජ.න.ව.ස.ම. | 25,000,000 | 25,000,000 | 25,000,000 |
| සුළු මුදල් අග්‍රිම | - | - | 18,076 |
| පෙර ගෙවුම් කාර්යය මණ්ඩල වියදම් | 2,637,639 | 2,990,801 | 3,224,146 |
| අත්තිකාරම් සහ වෙනත් | 990,025 | 128,135.00 | 1,631,935 |
| අඩු කළා : | | | |
| බොල්ණය සහ විශේෂ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | (25,000,000) | (47,465,416) | (47,465,416) |
| | 39,019,571 | 37,238,603 | 40,956,574 |

සී.ටී.සී. ව්‍යාපෘතිය සඳහා කළුබෝවිටියන තේ කර්මාන්තශාලාවට ලබා දී තිබුණු රු. 22,465,416 ක මුදල 2012 වර්ෂයේදී කපාහැර තිබුණි.

| 11. වෙනත් මූල්‍ය වත්කම් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. | 2010.12.31 දිනට රු. |
|---|---|---|---|
| කෙටි කාලීන ආයෝජන | 2,804,609,593 | 1,467,848,421 | 352,572,978 |
| | 2,804,609,593 | 1,467,848,421 | 352,572,978 |

| 12. සේවක ප්‍රතිලාභ බැඳීම් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. | 2010.12.31 දිනට රු. |
|---|---|---|---|
| පාරිතෝෂික ආරම්භක ශේෂය | 45,640,715 | 40,861,136 | 56,682,351 |
| වර්ෂයට අදාළ පාරිතෝෂික වෙනස්වීම් | 5,859,469 | 7,764,121 | (12,970,451) |
| වර්ෂය තුළ ගෙවන ලද/ ගෙවිය යුතු ප්‍රතිලාභ | (7,465,493) | (2,984,542) | (2,850,764) |
| | 44,034,691 | 45,640,715 | 40,861,136 |

| 13. ඉඩම් සඳහා පෙරගෙවුම් බදු අයිතීන් | 2012.12.31 දිනට රු. | 2012.12.31 දිනට රු. | 2012.12.31 දිනට රු. |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | 3,079,183 | 3,151,083 | 3,595,000 |
| ක්‍රමක්ෂය වීම් | (71,900) | (71,900) | (443,917) |
| අවසාන ශේෂය | 3,007,283 | 3,079,183 | 3,151,083 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය

| 14. අස්පෘශ්‍ය වත්කම් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. | 2010.12.31 දිනට රු. |
|---|---:|---:|---:|
| මෘදුකාංග | 1,077,307 | 1,009,829 | 1,106,618 |
| කෙරීගෙන යන මෘදුකාංග නැඩ | 8,233,971 | 6,409,972 | 6,409,972 |
| | 9,311,278 | 7,419,800 | 7,516,589 |

| 15. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. | 2010.12.31 දිනට රු. |
|---|---:|---:|---:|
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 41,016,920 | 31,767,673 | 56,199,125 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | 51,128,665 | 55,664,729 | 47,714,166 |
| උපචිත වියදම් | 12,105,463 | 8,859,281 | 23,934,813 |
| | 104,251,048 | 96,291,683 | 127,848,104 |

16. ප්‍රාග්ධන සහ සංචිත

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අවසරලත් ප්‍රාග්ධනයන්හි වෙනස්වීමක් නොමැත

දායක ප්‍රාග්ධනය

2012 දෙසැම්බර් 31 දිනට රු. 652,067,602 ක් වූ රජයේ ප්‍රදාන මගින් දායක ප්‍රාග්ධනය සමන්විත වේ.

## ප්‍රවර්ධන සහ අලෙවි බදු

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තේ අපනයනය සඳහා අවසර දීම පිණිස CUSDEC යට බලය ලබා දී ඇති විට තේ අපනයනය සඳහා ලියාපදිංචි වී ඇති සෑම අපනයනකරුවෙකු ගෙන්ම අපනයනය කරනු ලබන සෑම තේ කිලෝග්‍රෑම් එකක් සඳහා රු. 3.50 ක මුදලක් අයකරගත යුතුය. රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූලව එකතු කරන ලද සියලුම මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි නම් කරන ලද ගිණුමකට බැර කළ යුතුය. මෙම රෙගුලාසි බලාත්මක වීමෙන් පසු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නම් කරන ලද ගිණුමේ බැර වී ඇති මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත තේ ප්‍රවර්ධනය කිරීමේ සහ අලෙවි කිරීම් උපායමාර්ගික කටයුතුවලට අදාළ ක්‍රියාකාරකම්වලට අනුකූලව වන කාර්යයන් සඳහා පමණක් ම භාවිතා කළ යුතුය.

| | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 1,348,778,067 | 194,275,470 |
| අපනයනකරුවන්ගෙන් රැස්කර ගත් මුදල් | 1,186,445,976 | 1,113,814,616 |
| ආයෝජන මත පොලී | 211,481,173 | 66,443,637 |
| ප්‍රවර්ධන පිරිවැය - විදේශ | (17,491,926) | (10,320,861) |
| ප්‍රවර්ධන පිරිවැය - දේශීය | (4,942,201) | (3,150,408) |
| ජාත්‍යන්තර තේ මණ්ඩලයේ දායකත්වය | (2,900,111) | (2,286,956) |
| දුක මණ්ඩලවලට තේ පරිත්‍යාග, අනෙකුත් තේ ප්‍රදානයක් සහ පරිත්‍යාග | (3,036,776) | (4,497,426) |
| ජාත්‍යන්තර වෙළ!ද පොළවල්වලට සහභාගී වීම | (7,650,352) | (5,500,005) |
| අවසාන ශේෂය | 2,710,683,852 | 1,348,778,067 |

## විශේෂ සංචිත

රු. 481,933,543 ක විශේෂ සංචිතයක් ඇති කිරීමට මණ්ඩලය තීරණය කරනු ලැබ ඇති අතර එහි භාවිතය පිළිබ!ද සුදුසු පරිදි මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

## 17. වගකීම් සහ ප්‍රතිපාදන

බේරුම්කාර විනිශ්චය සභාව විසින් අසන ලද නඩුවක තීන්දුවක් ශ්‍රී.ලං.තේ.ම. එරෙහිව ලබා දීම හේතුවෙන් වර්ෂය තුළ රු. 15,556,355 ක මුදලක් ගෙවීමට නියම වී තිබුණි. කෙසේ වෙතත් ශ්‍රී.ලං.තේ.ම. මෙම තීන්දුවට එරෙහිව අභියාචනයක් ගොනුකර ඇති අතර ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග තවදුරටත් සිදුවෙමින් පවතී.

## 18. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය වගකීම් වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අභිප්‍රාය වූ කලී ශ්‍රී.ලං.තේ.ම. මෙහෙයුම්වලට අරමුදල් සැපයීමයි. ශ්‍රී.ලං.තේ.ම. සතුව වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සහ එහි මෙහෙයුම් වලින් සෘජුව ලැබෙන මුදල් හා කෙටිකාලීන තැන්පතු පවතී. ශ්‍රී.ලං.තේ.ම. ද්‍රවශීල අවදානමකට මුහුණ පා සිටී. මෙම අවදානම් කළමනාකරණය පිළිබඳ ශ්‍රී.ලං.තේ.ම. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පරීක්ෂාවෙන් සිටී. මණ්ඩලයේ සාමාජිකයෝ පහත සාරාංශකොට දක්වන ලද මෙම එක් එක් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කර එකඟතාව පළ කරති.

### ද්‍රවශීල අවදානම

ශ්‍රී.ලං.තේ.මණ්ඩලයේ අභිප්‍රාය වනුයේ අඛණ්ඩ අරමුදල් සම්පාදන තුළනය කර පවත්වාගෙන යාමයි. ශ්‍රී.ලං.තේ.මණ්ඩලයේ ගිවිසුම්ගත වට්ටම් රහිත ගෙවීම් මත පදනම් වූ මූල්‍ය වගකීම් පිළිබ!ද පැතිකඩක් පහත වගුවේ සාරාංශකොට දක්වා ඇත.

| | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. |
|---|---:|---:|
| 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය (රු.) | | කල්පිරීම |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 104,251,048 | සාමාන්‍යයෙන් මාස 3 කි |
| 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය (රු.) | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 96,291,683 | සාමාන්‍යයෙන් මාස 3 කි |
| 2011 ජනවාරි 01 දිනට | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 127,848,104 | සාමාන්‍යයෙන් මාස 3 කි |
| | 2012 | 2011 |
| | Rs. | Rs. |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 104,251,048 | 96,291,683 |
| අඩු කළා : මුදල් සහ කෙටි කාලීන තැන්පතු | (42,831,205) | (40,118,006) |
| ශුද්ධ ණය | 61,419,843 | 56,173,677 |
| ප්‍රාග්ධනය | 652,067,602 | 652,067,602 |
| ප්‍රාග්ධනය සහ ශුද්ධ ණය | 713,487,445 | 708,241,279 |
| ගියරුම් අනුපාතය | 1061.66% | 1160.81% |

## 19 අදාළ පාර්ශ්ව සමඟ ගණුදෙනු

### 19.1 රාජ්‍ය සහ රජය මගින් පාලනය වන ආයතන සමඟ සිදු කරන ගණුදෙනු

ශ්‍රී.ලං.තේ.ම. සාමාන්‍යයෙන් එහි මෙහෙයුම් වලදී අදා පාර්ශ්ව සමඟ ගණුදෙනු වල නිරත වෙයි. අදාළ පාර්ශ්ව යන්නට ශ්‍රී ලංකා රජය, රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කරනු ලබන ආයතන ඇතුළත් වේ. ගණුදෙනු පිළිබඳ විස්තර, වෙන්වල වශයෙන් වැදගත් කමක් ගන්නා සහ ඇතැම් ගණුදෙනු සම්බන්ධයෙන් සමූහ වශයෙන් වැදගත්කමක් ගන්නා ගණුදෙනු පිළිබඳ ශ්‍රී.ලං.තේ.ම. රජය සහ රජය මගින් පාලනය කරනු ලබන ආයතන සමගඑළඹ ඇති වැඩපිළිවෙලවල් පිළිබඳ විස්තර පහත සා්දහන් පරිදි වේ.

| | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. |
|---|---:|---:|
| ගණුදෙනු | | |
| ආදායම | 117,110,000 | 122,000,000 |
| උපයෝගිතා වියදම් | 17,880,913 | 16,323,656 |
| | | |
| හිඟ ශේෂ | | |
| ලැබිය යුතු මුදල් | | |
| ජ.න.ව.ස.ම. (වැවිලි අමාත්‍යාංශය) | 25,000,000 | 25,000,000 |

### 19.2 ප්‍රධාන කළමනාකරණ සංයුතිය

ශ්‍රී.ලං.තේ.ම. ප්‍රධාන කළමනාකාරීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත වේ.

| | 2012.12.31 දිනට රු. | 2011.12.31 දිනට රු. |
|---|---:|---:|
| කෙටි කාලීන රැකියා ප්‍රතිලාභ | 53,250 | 359,500 |

## ශේෂපත්‍ර දිනට පසුව සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසුව සිදු වු සියලු වැදගත් සිදුවීම් පිළිබඳ අවධානය යොමු කරනු ලැබ ඇති අතර අවශ්‍ය අවස්ථා වලදී උචිත ගැලපුම් සහ අනාවරණයන් සිදු කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එල්පි/ඩී/එස්එල්ටීබී/එෆ්ඒ/2012 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2014 ජූනි 26 දින

සභාපතිනිය,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

මාගේ සමාංක හා 2014 අප්‍රේල් 25 දිනැති මාගේ ලිපියට යොමුවේ.

02. ඉහත ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාවේ දෙමළ අනුවාදය මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

පිටපත්:
1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්පී/ඩී/එස්එල්ටීබී/එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2014 අප්‍රේල් 25 දින

සභාපතිනිය,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2014 ජනවාරි 31 දින මණ්ඩලයේ සභාපතිනිය වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 දරන 38 මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS /LKAS )

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 (LKAS 16)

(i) ස්ථාවර වත්කම් ගිණුමේ රු.17,000 ක් හා රු.224,280 ක් ලෙස දැක්වෙන පිළිවෙලින් ගම්පොළ හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලවල ඉඩම්වල සාධාරණ අගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ii) රු.මිලියන 56.3 ක පිරිවැයට මිලදී ගන්නා ලද ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලවල දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 (LKAS 39)

1995 වර්ෂයේ සිට පොල්හේන තේ කම්හලෙන් ලැබිය යුතු රු.4,329,769 ක මුදලක් අයකර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගැනීමෙන් තොරව ගිණුම්වලට ගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී තේ නිෂ්පාදකයින්ගෙන් හා වෙළඳුන්ගෙන් ලැබී තිබුණු බලපත්‍ර අලුත්කිරීමේ ගාස්තු රු.7,233,260 ක් හදුනාගැනීමෙන් හා ගිණුම්වල ගැලපීම් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරි වර්ෂය සඳහා ලැබුණු විලම්භිත අලුත්කිරීමේ ආදායමෙහි පැවතුණි.

(ආ) කසළ තේ බෙදාහරින්නන්, තේ පැකට්කරුවන්, තේ අපනයනකරුවන් හා ගුදම්වලින් 2011 වර්ෂය සඳහා 2010 වර්ෂයේදී ලැබුණු රු,5,621,928 ක් වූ ලියාපදිංචි ගාස්තු සමාලෝචිත වර්ෂය අවසානයට ආදායමට ගැලපීමෙන් තොරව ලැබුණු අත්තිකාරම් ගිණුමේ පැවතුණි.

(ඇ) කසළ තේ හා හරිත තේ බෙදාහරින්නන්ගෙන් 2013 වර්ෂය සඳහා 2012 වර්ෂයේදී ලැබුණු බලපත්‍ර ගාස්තු පිළිවෙලින් රු.2,870,000 ක් හා රු.8,992,795 ක් ඉදිරි වර්ෂය සඳහා ලැබුණු විලම්භිත අළුත්කිරීමේ ආදායම් ගිණුම යටතේ දක්වනු වෙනුවට ගෙවිය යුතු වෙළඳ ශේෂ යටතේ දක්වා තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් මාසය සඳහා අර්ථ සාධක අරමුදල සඳහා සේවක හා සේව්‍ය දායකය රු.1,350,250 ක් සමාලෝචිත වර්ෂය සඳහා වියදම් ලෙස ගිණුම්වලට ගෙන තිබුණු අතර ඒ අනුව සේවක අර්ථසාධක අරමුදල් වියදම් එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 හා 2011 වර්ෂවලදී පවත්වා තිබුණු වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වූ අයගෙන් ලැබුණු රු.1,464,094 ක් වූ අත්තිකාරම් වෙළඳ ප්‍රදර්ශන වියදමට ගැලපීමෙන් තොරව ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු ලෙස අපනයනකරුවන් විසින් කලින් ගෙවන ලද තේ ප්‍රවර්ධන හා අලෙවි බදු ජංගම වගකීමක් ලෙස දක්වනු වෙනුවට හිමිකම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම තැන්පතු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් (ජනවසම) ලැබිය යුතු ලෙස වර්ෂ 5 කට වැඩි කාලයක් දක්වා තිබූ රු.25,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි. කෙසේ වුවද, අයකර ගැනීම සැක සහිත වූ හෙයින් මෙම මුදල සඳහා බොල් හා අඩමාන ණය යටතේ ප්‍රතිපාදනයක් කර තිබුණි. තවද, 2012 ජුනි 19 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමට අනුව ජනවසමට අයත් රු.මිලියන 16 ක් වටිනාකම වූ හන්තාන පිහිටි "සිලෝන් ටී මියුසියම් "හි අයිතිය ලබා ගැනීමට හා රු.මිලියන 8 ක ශේෂය කපා හැරීමට ජනවසම හා තේ මණ්ඩලය තීරණයකට එළඹ තිබුණි.

කෙසේ වුවද, මෙම ක්‍රියාවලිය 2014 ජනවාරි 31 විගණන දිනය දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

ජනවසම සමග මෙම කරුණ අවසන් කිරීමට අයිතිය මාරුකිරීමේ ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් සමග රැස්වීම් කිහිපයකට මණ්ඩලය සහභාගී වූ බව මණ්ඩලයේ සභාපතිනිය විසින් දන්වා තිබුණි.

(ආ) කම්හල් නවීකරණය හා නැවත වගා කිරීම සඳහා මණ්ඩලයේ අරමුදල් වලින් රු.2,669,759 ක සහනාධාරයක් තේ කම්හල්වලට හා වතුවලට මේ කාරණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබූ භාණ්ඩාගාර ප්‍රදාන ඉක්මවා මණ්ඩලය විසින් ලබා දී තිබුණි. මෙම මුදල භාණ්ඩාගාරයෙන් අයකර ගත නොහැකි වුවද, එය භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මණ්ඩලය ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සුභසාධක සංගමයෙන් ලැබිය යුතු රු.261,383 ක අත්තිකාරමක් වර්ෂ 3 කට වැඩි කාලයක් අයකර නොගෙන පැවතුණ අතර සමාලෝචිත වර්ෂයේදී හෝ එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දත්ත සැකසුම් ගාස්තු හා කාර්ය මණ්ඩල ගමන් වියදම් සඳහා වූ රු.53,602 ක ප්‍රතිපාදන වර්ෂ තුනකට වැඩි කාලයක් ජංගම වගකීම යටතේ දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී හෝ අයකර ගැනීමට මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

2.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | | නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | (i) | 1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වගන්තිය හා 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියේ 25 (3) වගන්තිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබානොගෙන සහ පනත් වලට අනුව රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ නොකර, 2010 ජූලි 29 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 2011 සිට ලියාපදිංචි ගාස්තු, ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු හා බලපත්‍ර ගාස්තු සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කර තිබුණි.<br>මෙම කරුණ දැනටමත් නීතිපතිවරයා වෙත යොමුකර ඇති බව මණ්ඩලයේ සභාපතිනිය දන්වා තිබුණි. |
| | (ii) | 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියේ 13 හා 14 වගන්ති | සෙස් අරමුදල පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම පනතේ විධිවිධාන අනුව සිදුකර නොතිබුණි.<br>පනත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බවත් ඒ අනුව පනතට සිදුකළ යුතු අවශ්‍ය සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා උප කමිටුවක් පත්කළ බවත් සභාපතිනිය දන්වා තිබුණි. |
| (ආ) | | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 132 වගන්තිය | තේ ප්‍රවර්ධන අංශය සඳහා පත්කරන ලද ව්‍යාපෘති උපදේශකවරයෙකුගෙන් උපයන විට ගෙවීම් බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |

(ඇ) රජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 507 | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට පොත් ශේෂයන් හා වටිනාකම් ඇතුළත් කර නොතිබුණි. එබැවින් පොත්වල සටහන් කර තිබූ ප්‍රමාණයන් හා භෞතිකව තිබූ ශේෂයන් අතර වෙනස්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල දක්වා නොතිබූ අතර සමීක්ෂණ මණ්ඩලයෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 676 (2) | රෙගුලාසි පිළිපැදීමෙන් තොරව කාර්යාල දැන්වීම් 09 ක් භාෂාත්‍රයෙන් ප්‍රසිද්ධ කර නොතිබූ අතර කාර්යාල දැන්වීම් 07 ක් එක් භාෂාවකින් පමණක් අවස්ථා එකකට වැඩි ගණනකදී ප්‍රසිද්ධ කර තිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර විධිමත්ව පවත්වා නොතිබුණි.<br><br>ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතින බව මණ්ඩලයේ සභාපතිනිය විසින් දන්වා තිබුණි. |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය මාස 6 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2008 ජූනි 26 දිනැති අංක 14 /2008 | | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව 2011 දෙසැම්බර් සිට 2012 මැයි දක්වා මණ්ඩලයේ සභාපතිනියට මාසික ප්‍රවාහන කුලී ලෙස රු.75,000 ක දීමනාවක් ගෙවා තිබුණි.<br>දීමනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව මණ්ඩලයේ සභාපතිනිය දන්වා තිබුණි. |
| (ඊ) | 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය | (i) | රු.මිලියන 6.28 ක් වටිනා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි. |
| | | (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (යොමුව 3.4) පිළිපැදීමෙන් තොරව රු.මිලියන 4.68 ක් වූ ලී බඩු මිලදී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ට ප්‍රදානය කර තිබුණි. |
| | | (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට (යොමුව 2.4) පටහැනිව රු.මිලියන 6.5 ක් වටිනා මෝටර් වාහනයක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට පෙර රු.500,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි.<br>රේගු බදු වැඩිවන හෙයින් රු.මිලියන 2 ක් ඉතිරි කර ගැනීම සඳහා ක්ෂණිකව මෝටර් වාහනයක් මිලදී ගත් බවත් ප්‍රසම්පාදන කමිටුව සාකච්ඡා කර අනුමැතිය විධිමත්ව ලබා ගැනීමට හැකිවන පරිදි ඊට පෙර අත්තිකාරම් ගෙවීමට එකග වූ බවත් මණ්ඩලයේ සභාපතිනිය දන්වා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.11,390,437 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.10,859,959 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.22,250,396 ක පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ බලපත්‍ර ගාස්තු, ලියාපදිංචි හා අළුත් කිරීමේ ආදායම අඩුවීම හා පරිපාලන සහ මෙහෙයුම් වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 කාර්ය සාධනය

---

#### 3.2.1 මණ්ඩලයේ කටයුතු

---

මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ කටයුතු ක්‍රමවත් කිරීම, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි "ලංකා තේ" අලෙවිකරණය හා ප්‍රවර්ධනය , තේ පිළිබඳ වෙළඳපොල පර්යේෂණ හා තේ කර්මාන්තය සඳහා වෙළඳපොල දැනුම ලබා දීම, තේ වෙළඳාමට අවශ්‍ය රසායනාගාර සහ තාක්ෂණ සේවා සැපයීම, තේ කොමසාරිස් අංශය, තේ අපනයන අංශය, තේ ප්‍රවර්ධන අංශය, විශ්ලේෂණාත්මක රසායනාගාරය සහ තේ රස බැලීමේ ඒකකය මගින් සිදු කෙරේ.

(අ) තේ කර්මාන්තයේ කාර්ය සාධනය

---

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබා ගත හැකි වූ දත්ත අනුව සමාලෝචිත වර්ෂය හා එයට සාපේක්ෂව ඉකුත් වර්ෂ 4 සඳහා තේ නිෂ්පාදනය හා ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය සහ තේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ තේ අපනයන ප්‍රවර්ධනය සඳහා මණ්ඩලය විසින් දරන ලද වියදම් පහත දැක්වේ.

| වර්ෂය | ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය | තේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා තේ මණ්ඩලය විසින් දරන ලද සංවර්ධන වියදම | ශ්‍රී ලංකා තේ අපනයනය (නැවත අපනයනය ඇතුළත්ව) | තේ අපනයනය වැඩි කිරීම සඳහා මණ්ඩලය විසින් දරන ලද ප්‍රවර්ධන වියදම | කිලෝග්‍රෑමයට නිෂ්පාදන පිරිවැය | කිලෝග්‍රෑමයක විකුණුම් මිල |
|---|---|---|---|---|---|---|
| ----- | ------------ | ---------------------- | ------------------- | ------------------ | --------------- | ---------- |
| | කිලෝග්‍රෑම් මිලියන | රු. | කිලෝග්‍රෑම් මිලියන | රු. | රු. | රු. |
| 2008 | 318.7 | 3,644,246 | 319.8 | 109,358,718 | 231.49 | 310.81 |
| 2009 | 291.1 | 24,552,506 | 289.7 | 102,286,182 | 269.01 | 360.45 |
| 2010 | 331.4 | 10,394,094 | 324.4 | 58,843,391 | 313.17 | 370.61 |
| 2011 | 327.5 | 29,133,757 | 322.6 | 25,755,657 | 355.02 | 360.53 |
| 2012 | 328.4 | 23,669,759 | 319.9 | 36,021,266 | ලබා දී නැත. | 392.03 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර වර්ෂය සමග සැසඳීමේදී තේ ප්‍රවර්ධන වියදම රු.මිලියන 10.26 කින් වැඩි වී තිබුණද, තේ අපනයනය කිලෝග්‍රෑම් මිලියන 2.7 කින් අඩු වී තිබුණි.

(ii) පෙර වර්ෂය සමග සැසඳීමේදී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 0.9 කින් පමණක් වැඩි වී තිබුණි.

(iii) 2011 හා 2012 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා අනුව, විශේෂයෙන් කුඩා තේ වතු හිමියන්ගේ හා තේ කම්හල්වල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනය , කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ මණ්ඩලය එක්ව කම්හල් පදනම් කරගත් තේ සංවර්ධන වැඩසටහනක් සැලසුම් කරන ලදී. කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායීතාවය හා හරිත තේ කොළ පිළිබඳ කටයුතු කිරීම අධීක්ෂණය සඳහා මෙම වැඩ සටහන යටතේ ව්‍යාප්ති නිලධාරියකු (ක්ෂේත්‍ර සම්බන්ධීකරණ නිලධාරියකු) පත් කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වුවද, මෙම කාර්යය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.

මෙම වැඩ සටහන මාතර හා මතුගම ප්‍රාදේශීය කාර්යාලවල දියත් කළ බවත් කණ්ඩායම් වැඩ සම්බන්ධයෙන් ඇතැම් ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් අනිකුත් ප්‍රාදේශීය කාර්යාලවල ක්‍රියාත්මක කළ නොහැකි වූ බවත් මණ්ඩලයේ සභාපතිනිය දන්වා තිබුණි.

(ආ) විදේශ වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීම

විදේශ වෙළඳ ප්‍රවර්ධන කටයුතු මණ්ඩලය භාරගෙන තිබුණු අතර, ප්‍රධාන තේ ආනයන රටවල්වල පවත්වනලද ජාත්‍යන්තර ආහාරපාන වර්ග වෙළඳ ප්‍රදර්ශනවලදී "පියෝර් සිලෝන් ටී බ්‍රෑන්ඩ්ස්" ප්‍රවර්ධනය සඳහා 2009 වර්ෂයේ සිට සෑම වර්ෂයක් වෙනුවෙන්ම අනුග්‍රාහකත්වය ලබා දී තිබුණි. 2009 සිට සහභාගිවනලද විදේශ වෙළඳ ප්‍රදර්ශන සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| මණ්ඩලය විසින් පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | 17 | 15 | 18 | 25 |
| සහභාගී වූ සමාගම් සංඛ්‍යාව | ලබා දී නොතිබුණි. | 94 | 101 | 81 |

(ඇ) ලියාපදිංචි කටයුතු

2009 වර්ෂය සිට එක් එක් වර්ෂය අවසානයේ පහත සඳහන් තේ නිෂ්පාදකයින් හා වෙළඳුන් ලියාපදිංචි කිරීම, සහතික කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම පහත දැක්වේ.

| ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| තේ දළු වෙළඳුන් | 1982 | 1914 | 1866 | 1703 |
| ක්‍රියාත්මක තේ කම්හල් | 702 | 695 | 712 | 697 |
| තේ අපනයනකරුවන් | 383 | 363 | 347 | 325 |
| තේ පැකට්කරුවන් | 412 | 392 | 375 | 351 |
| ආනයනකරුවන් | 192 | 184 | 57 | 51 |
| තේ ගබඩා | 446 | 404 | 359 | 229 |
| වෙළඳ නාමයන් (සිංහ ලාංඡනය ) | 98 | 99 | 96 | 94 |

(වාර්ෂික වාර්තා 2009 – 2012 )

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අනුව, පෙර වර්ෂය සමග සැසඳීමේදී කම්හල් නවීකරණය සඳහා සහනාධාර රු.මිලියන 8.2 කින් අඩු වී තිබුණු අතර ක්‍රියාත්මක නොවන කම්හල් 16 ක වැඩිවීමක්ද නිරීක්ෂණය විය.

(ඇ) තේ පරීක්ෂා කිරීම් ඒකකයේ කටයුතු

තේ පරීක්ෂා කිරීම් ඒකකය විසින් තේ අලෙවි කිරීම පිළිබඳ ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය/ අයිඑස්ඕ 3720 තාක්ෂණය පවත්වා ගැනීම සහ පාරිභෝගික ඇසුරුම් සඳහා වෙළඳ නාම නිෂ්පාදනයන්ට සිංහ ලාංඡන සහතිකය (Lion Logo Certificate) නිකුත් කිරීම පුද්ගලික විකුණුම් හා සෘජු විකුණුම් අධීක්ෂණය හා වලංගු කිරීම සඳහා එක් එක් වර්ෂය තුළදී සිදු කරන ලද තේ සාම්පල් පරීක්ෂා කිරීම් පහත දැක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| තත්ත්ව පාලනය සඳහා තේ පරීක්ෂා කිරීම් | | | | |
| - වෙන්දේසියට පෙර | 299,770 | 151,767 | 164,336 | 130,007 |
| - නැව්ගත කිරීමට පෙර | 4,915 | 4,981 | 6,183 | 6,620 |
| - ආනයනය කිරීමට පෙර | 1,907 | 4,615 | 6,404 | 5,552 |
| - ආනයනයට පසු | 1,299 | 3,068 | 2,761 | 2,597 |
| පෞද්ගලික විකුණුම් නාමාවලි තක්සේරු සහතිකය වලංගු කිරීම | 6,632 | 5,255 | 5,025 | 11,523 |
| සෘජු විකුණුම් වලංගු කිරීම | 1,768 | 1,550 | 1,470 | 1,349 |

(ඉ) විශ්ලේෂණාත්මක රසායනාගාර සේවා

---

අභ්‍යන්තරිකව තේ කොමසාරිස් අංශයෙන් හා බාහිරව තේ අපනයනකරුවන්, ආනයනකරුවන් හා නිෂ්පාදකයන්ගෙන් ලැබෙන සාම්පල සඳහා ගුණාත්මක තත්ත්ව ප්‍රමිති සහතික නිකුත් කිරීම මගින් තත්ත්ව ප්‍රමිති කළමනාකරණය වැඩි දියුණු කිරීමේ අරමුණද සමග පවත්වාගෙන යන විශ්ලේෂණාත්මක රසායනාගාර සේවය විසින් එක් එක් වර්ෂයේ තේ සාම්පල පරීක්ෂා කිරීම් හා උපයන ලද ආදායම් පහත පරිදි වේ.

| වර්ෂය | පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව | ආදායම |
|---|---|---|
| 2012 | 5,042 | 4,858,000 |
| 2011 | 7,933 | 6,071,200 |
| 2010 | 7,025 | 4,171,600 |
| 2009 | 7,679 | 3,787,900 |

(2009 -2012 වාර්ෂික වාර්තා )

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර වර්ෂය සමග සැසදීමේදී සාම්පල පරීක්ෂා කිරීම සියයට 36.4 කින් අඩු වී තිබූ හෙයින් සාම්පල පරීක්ෂා කිරීමෙන් ලද ආදායම රු.මිලියන 1.2 කින් 2012 වර්ෂයේදී අඩු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) සාම්පල් පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයේ සේවක ඌනතාවය හේතුවෙන් 2011 ඔක්තෝබර් සිට වර්ෂයක් සඳහා තේ පර්යේෂණ ආයතනයෙන් උපදෙස් හා සේවක සහායන් රසායනාගාරයේ ශුද්ධ ආදායමින් සියයට 50 ක් ගෙවීමේ පදනම මත හා මසකට උපදේශක ගාස්තු රු.30,000 ක් හා වෙනත් කාර්ය මණ්ඩලයට රු. 25,000 ක් ගෙවීම පදනම මත ලබාගෙන තිබුණි. 2011 හා 2012 වර්ෂවලදී උපදේශක ගාස්තු හා වෙනත් ගෙවීම් ලෙස පිළිවෙලින් රු.52,000 ක් හා රු.335,000 ක් ගෙවා තිබුණද, ප්‍රගති වාර්තා අනුව පරීක්ෂා කිරීම් විධිමත්ව සිදුකර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. රසායනාගාරයේ ශුද්ධ ආදායමෙන් සියයට 50 ක්ද එකග වූ කාල පරිච්ඡේදය සඳහා ගෙවා නොතිබුණි.

කාර්යමණ්ඩල ඌනතාවයක්ද ඇතිව සිදුකරනු ලබන කර්මාන්ත අවශ්‍යතාවයක් වන පරීක්ෂණ කටයුතු ඉටුකර ගැනීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත විද්‍යාඥයින් ලබා ගැනීමට 2011 සැප්තැම්බර් මාසයේදී තේ පර්යේෂණ ආයතනය සමග මණ්ඩලය අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු බව මණ්ඩලයේ සභාපතිනිය දන්වා තිබුණි. අවබෝධතා ගිවිසුම ප්‍රකාරව අරමුණු ඉටුකර නොගැනීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ආදායම උපයා නොතිබුණි.

3.2.2 තේ ප්‍රවර්ධන හා අලෙවි උපාය මාර්ග සඳහා බදු

---

2010 ඔක්තෝබර් 27 දින ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව අපනයනය කරන ලද තේ කිලෝ ග්‍රෑම් එකකට රු.3.50 බැගින් 2010 නොවැම්බර් 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ තේ ප්‍රවර්ධනය හා අලෙවි උපාය මාර්ග සඳහා තේ අපනයනකරුවන්ගෙන් රු.මිලියන 2,535.22 ක මුදලක් මණ්ඩලය විසින් රැස් කර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධිමත් සැලැස්මක් හා කළමනාකරණයක් නොතිබීමෙන් හා ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම ප්‍රමාදවීම හේතුවෙන් එම රැස් කරගත් රු.මිලියන 2,535.22 ක් වූ මුළු මුදලින් රු.මිලියන 120.62 ක් එනම්, සියයට 4.76 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රවර්ධනය හා අලෙවි උපායමාර්ග සඳහා යොදාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රවර්ධන හා අලෙවි උපායමාර්ග සඳහා රු. මිලියන 1,150 ක අයවැය ප්‍රතිපාදනයක් සලසා තිබුණි. තථ්‍ය බදු එකතුකිරීම රු.මිලියන 36.44 කින් ඉක්මවා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී මෙයින් රු.මිලියන 36.02 ක් එනම් සියයට 3.13 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) බදු රැස්කිරීමේ ප්‍රධාන අරමුණ තේ ප්‍රවර්ධන හා අලෙවි උපාය මාර්ග සඳහා යෙදවීම වුවද ප්‍රවර්ධන කාර්යයන් සිදුකිරීමේ ප්‍රමාදය හේතුවෙන් කෙටිකාලීන ආයෝජනවල එම මුදල් ආයෝජනය කර රු.මිලියන 211.48 ක මුදලක් පොලී ලෙස සමාලෝචිත වර්ෂය තුළදී උපයා තිබුණි.

(ඇ) තේ වතුයායන් අතර වාර්ෂික තේ තරග පැවැත්වීමට රු.මිලියන 2.3 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද, සැලසුම් කළ පරිදි මෙම කාර්යය සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා නොතිබුණි.

(ඉ) 2010 ඔක්තෝබර් 27 දිනැති ගැසට් නිවේදනය අනුව කර්මාන්තයට උනන්දුවක් දක්වන පුද්ගලයින් විසින් සෑම වර්ෂ දෙකකට වරක් ප්‍රගතිය පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදු කළ යුතු නමුත් උනන්දුවක් දක්වන්නන් විසින් එවැනි සමාලෝචනයක් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව, වැවිලි කර්මාන්ත ගරු අමාත්‍යවරයා විසින් කර්මාන්තයේ හා වෙළඳාමේ ප්‍රමුඛතා හා අපේක්ෂාවන්ට අනුකූල වන පරිදි ප්‍රවර්ධන හා අලෙවි කමිටුව (Promotion and Marketing Committee) ප්‍රතිසංවිධානය කර තිබුණු අතර 2013 අවසාන භාගය තුළදී දියත් කළ යුතු වූ නව උපායමාර්ගික අලෙවි සැලැස්මක් විධිමත්ව සකස්කිරීම සඳහා නව ප්‍රවර්ධන හා අලෙවි කමිටුව වගකිව යුතු වනු ඇත.

(ඊ) නව අලෙවි කණ්ඩායම සඳහා ගෝලීය සංවිධානය පිළිබඳ යෝජිත ප්‍රවර්ධනාත්මක කාර්යය වෙනුවෙන් 2012 අගෝස්තු 02 දින රු.130,000 ක් වූ මාසික වැටුපකට ව්‍යාපෘති උපදේශකවරයකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. කෙසේ වුවද, මෙම කාර්යය 2013 සැප්තැම්බර් 30, විගණන දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2013 අගෝස්තු 01 දින ව්‍යාපෘති උපදේශකවරයාද සේවයෙන් ඉවත් වී තිබුණි.

(උ) 2012 ජාත්‍යන්තර තේ කමිටු සංඛ්‍යා ලේඛන තොරතුරු ප්‍රකාශනයට අනුව, තුර්කිය, එක්සත් රාජධානිය, ඊජිප්තුව, මොරොක්කෝ හා ඇෆ්ගනිස්ථානය ලෝකයේ ප්‍රධාන තේ පරිභෝජනය කරන්නන් පස්දෙනා වේ. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එම රටවල්වල කිසිදු ප්‍රවර්ධනාත්මක කාර්යයක් මණ්ඩලය විසින් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඉහත තොරතුරු ප්‍රකාශනය අනුව පසුගිය වර්ෂ හතර සඳහා "සිලෝන් ටී" වල තත්ත්වය අඛණ්ඩව තුන්වන ස්ථානයට වැටී තිබුණි. කෙසේ වුවද, ගෝලීය වෙළඳපොළ හසුකර ගැනීමට මණ්ඩලය විසින් විධිමත් ප්‍රවර්ධන සැලැස්මක් හඳුන්වා දී නොතිබුණි.

### 3.2.3 ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් ක්‍රියාත්මක නොකිරීම

සැලසුම් කළ පරිදි පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි.

| කාර්යය | ඇස්තමේන්තු කළ මුදල |
|---|---|
| | රු. මිලියන |
| පූර්ව පසු වෙන්දේසි ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම | 60 |
| චක්‍රීය අරමුදල යටතේ පහසු ණය යෝජනා ක්‍රමය | 10 |
| පසු අස්වනු හානි අවම කිරීම | 20 |

වෙන්දේසි වැඩ සටහන ස්වයංක්‍රීය කිරීම කොළඹ තේ වෙළඳ සංගමය මගින් සිදුකිරීමට යෝජනා කළ බව මණ්ඩලයේ සභාපතිනිය විසින් දන්වා තිබුණි. කෙසේ වුවද, ප්‍රතිපත්තිමය තීරණයක් අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. චක්‍රීය අරමුදල යටතේ පහසු ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබූ අතර සමිති සංවිධාන 09 ක් සඳහා රු.මිලියන 05 ක් වැයකර තිබුණි. පසු අස්වනු හානි අවම කිරීමේ වැඩ සටහන අරමුදල් නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාරකණය

මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සේවක සංඛ්‍යා තත්ත්වය පහත දැක්වේ.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත තනතුරු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 | - |
| ද්විතියික මට්ටම | 27 | 23 | 12 | 04 |
| තෘතියික මට්ටම | 193 | 155 | 40 | 06 |
| ප්‍රාථමික මට්ටම | 76 | 69 | 07 | - |
| එකතුව | 300 | 250 | 60 | 10 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 දෙසැම්බර් 01 දිනැති අංක ඩීඑම්එස්/සී/2/02/62 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලද ලිපියට අනුව, සේවක සංඛ්‍යාව 300 ක් අනුමත කර තිබූ අතර , අතිරික්ත තනතුරු 10 ක් එම අවස්ථාවේ සේවයේ යෙදී සිටි සේවකයන්ට පෞද්ගලික වනසේ අනුමත කර තිබුණි. අධ්‍යක්ෂ (පරිපාලන හා මුදල් ) නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය) , නියෝජ්‍ය හා සහකාර තේ කොමසාරිස්වරු ,තාක්ෂණ සහකාර (රසායනාගාර) ආදී තනතුරු ඇතුළත්ව 2012 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 60 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී රු.803,483 ක් වැය කරමින් මණ්ඩලයේ පුරප්පාඩුවක් සඳහා දැන්වීම් 13 ක් පුවත්පත්වල පළ කර තිබුණි. ඉහත දැන්වීම් දහතුනෙන් රු.151,782 ක් වූ දැන්වීම් දෙකක් දෝෂ සහිතව පළ කර තිබූ අතර කිසිදු ඉල්ලුම්කරුවෙකු තෝරා නොගැනීම හේතුවෙන් රු.317,296 ක් පිරිවැය වූ තවත් දැන්වීම් හයක් ඵල රහිත වී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ල 2002 දෙසැම්බර් 31 දින සිට හිස් වී තිබුණු අතර, පරිශ්‍රයේ අයිතිකරු වෙත තැන්පත් කරන ලද රු.මිලියන 2.4 ක කුලී අත්තිකාරම 2005 වර්ෂයේ සිට 2011 මැයි 30 දක්වා රු.මිලියන 2.8 ක මුදලක් වැය කරමින් තීරකවරයෙක් මගින් මණ්ඩලය විසින් අයකර ගෙන තිබුණි. කෙසේ වුවද පරිශ්‍රයේ අයිතිකරු විසින් ගොඩනැගිල්ලට වූ හානි වෙනුවෙන් හා 2003 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කුලියට දීම සඳහා ගොඩනැගිලි භූමිය ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට නොහැකි වීම වෙනුවෙන් සියයට 20 ක පොළිය හා සියයට 15 ක එකතු කළ අගය මත බදු සමග රු.මිලියන 4.9 ක වන්දි මුදලක් ඉල්ලමින් 2008 ඔක්තෝබර් මාසයේදී මණ්ඩලයට එරෙහිව තීරකවරයෙක් පත්කර තිබුණි. මණ්ඩලය මෙම නඩුවට එරෙහිව අභියාචනයක් කර ඇති අතර තීන්දුවක් අපේක්ෂාවෙන් තවමත් පවතී.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් එක් අංශයේ කටයුතුවලට සහාය වීම සඳහා " Specialized Application " මෘදුකාංගය හා ආශ්‍රිත දෘඩාංග සපයා සවි කිරීමට මණ්ඩලය විසින් 2009 දෙසැම්බර් 31 දක්වා පෞද්ගලික ආයතනයකට රු.9,038,930 ක මුදලක් ගෙවා තිබුණි. 2005 අප්‍රේල් 07 දින එළඹි දෙපාර්ශවයේ ගිවිසුම ප්‍රකාරව මෙම ජාල පද්ධතිය ගෙනැවිත් සවි කර භාර දීම දින 90 ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණද, දෙපාර්ශවයේම අඩුපාඩු හේතුවෙන් , නිම කිරීමේ කාලය 2008 අප්‍රේල් 01 දින දක්වා අන්‍යෝන්‍ය එකඟතාවය මත දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, මෙම කාර්යයේ රු.2,628,958 ක් වටිනා කොටසක් පමණක් නිම කර තිබූ බවත්, ඉතිරි වැඩ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිම කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්වල දක්වා තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) පහත සඳහන් අත්තිකාරම් අරමුණු කළ කාර්යයන් සඳහා යොදාගැනීමෙන් තොරව ආපසු ගෙවා තිබුණි.

| අත්තිකාරම් දිනය | කාරණය | මුදල | ආපසු ගෙවූ දිනය | අත රඳවා ගත් දින ගණන |
|---|---|---|---|---|
| | | රු. | | |
| 2012 ජනවාරි 30 | පානයන් සඳහා FAO /IGG සියයට 50 ක් | 100,000 | 2012 මාර්තු 02 | 31 |
| 2010 ඔක්තෝබර් 11 | විවිධ වියදම් | 20,000 | 2012 ඔක්තෝබර් 22 | 10 |
| 2012 ජූලි 18 | සාම්පල 08 ක් විශ්ලේෂණය | 16,800 | 2012 ඔක්තෝබර් 26 | 96 |

(ඇ) කැනඩාව, පෝලන්තය, ජර්මනිය හා බැංකොක් තානාපති කාර්යාලවල එකතුව රු.611,178 ක් වූ බැංකු ශේෂ වර්ෂ තුනකට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණයන් මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ඉන්වෙන්ට්‍රි පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

(ඈ) ප්‍රවර්ධන කටයුතු

(ඉ) ගිණුම් වාර්තා පැවැත්වීම

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල සංයුතිය

32

## ප්‍රධාන කාර්යාලය

සභාපතිනි/අධ්‍යක්ෂ ජනරාල්
574,ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව

තැ.පෙ. 1750, කොළඹ, ශ්‍රී ලංකාව

දුරකථන : 94 11 2587814 /0112583687
ෆැක්ස් : 2589132

විද්‍යුත් තැපෑල : chairman@pureceylontea.com
: dgsltb@pureceylontea.com
වෙබ් අඩවිය : www.pureceylontea.com

**සභාපති**

දුරකථන: 011 2587814 /2590968
ෆැක්ස්: 0112585701
විද්‍යුත් තැපෑල:Chairman@pureceylontea.com

**අධ්‍යක්ෂ ජනරාල්**

දුරකථන: 011 2587814 /2508991
ෆැක්ස්: 0112582122
විද්‍යුත් තැපෑල:dgsltb@pureceylontea.com

**තේ කොමසාරිස් අංශය**

දුරකථන: 0112580182/2580152/2502485/2584845/ 2587814/ 2587773
විදුලිපණිවිඩ : Comtea
ෆැක්ස්: 0112580161
විද්‍යුත් තැපෑල: teacomm@pureceylontea.com

## තේ ප්‍රවර්ධන අංශය

**අධ්‍යක්ෂක (තේ ප්‍රවර්ධන)**

දුරකථන: 0112583343/2587814/2581418/2580169
ෆැක්ස්: 0112587341
විද්‍යුත් තැපෑල:promotion@pureceylontea.com

## තේ අපනයන අංශය

**නියෝජ්‍ය කොමසාරිස් (අපනයන)**

දුරකථන: 0112502485/2584845/2587814/2504090/2587773
විදුලිපණිවිඩ: Comtea
ෆැක්ස්: 0112584844
විද්‍යුත් තැපෑල: exports@pureceylontea.com

## විශ්ලේෂණ රසායනාගාරය

**අධ්‍යක්ෂක (විශ්ලේෂණ සේවා)**
දුරකථන: 0112587814/2581576
ෆැක්ස: 0112581576
විද්‍යුත් තැපැල: lab@pureceylontea.com

## ප්‍රාදේශීය කාර්යාල

**ගම්පොල**
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
140, අඹගහමුව පාර, ගම්පොල
දුරකථන/ෆැක්ස් : 081-2352279
විද්‍යුත් තැපැල : atcgp@pureceylontea.com

**මාතර**
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
46, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත,මාතර
දුරකථන/ෆැක්ස් : 041-2222636
විද්‍යුත් තැපැල : atcmt@pureceylontea.com

**මතුගම**
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
281, අගලවත්ත පාර, මතුගම
දුරකථන/ෆැක්ස් : 034-2247444
විද්‍යුත් තැපැල : atcgl@pureceylontea.com

**රත්නපුර**
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
61/1, නව නගරය, රත්නපුර
දුරකථන/ෆැක්ස් : 045-2222136
විද්‍යුත් තැපැල : atcrt@pureceylontea.com

**බණ්ඩාරවෙල**
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
විසාකා මාවත, නව බදුල්ල පාර,බණ්ඩාරවෙල
දුරකථන/ෆැක්ස් : 057-2222812
විද්‍යුත් තැපැල : atcbw@pureceylontea.com

**ගාල්ල**
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
20,පහළ ඩික්සන් පාර, ගාල්ල
දුරකථන/ෆැක්ස් : 091-2232052
විද්‍යුත් තැපැල : atcgl@pureceylontea.com

## විදේශීය කාර්යාලය

**ලංකා තේ ප්‍රවර්ධන ඒකකය - එක්සත් අරාබි එමීර් රාජ්‍යය**

ඇමති උපදේශක - තේ ප්‍රවර්ධන
තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය
විලා අංක 2, ප්ලොට් බී - 33,322 - බී වීදිය,
තැ.පෙ. 51528
ඒ හුදායිබා, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය.

| | |
|---|---|
| දුරකථන | : 00971 4 3987871 |
| ෆැක්ස් | : 00971 4 3987872 |
| විද්‍යුත් තැපෑල | : ctbureau@emirates.net.ae / ceylonte@eim.ae |

**ලංකා තේ ප්‍රවර්ධන ඒකකය - රුසියාව**

ප්‍රධාන ලේකම්
තේ ප්‍රවර්ධන අංශය
ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
24 ෂෙප්කිනා වීදිය
මොස්කව් රුසියාව

| | |
|---|---|
| දුරකථන/ෆැක්ස් | : 007-495-688-1363 / 007-495-688 3511 |
| විද්‍යුත් තැපෑල | : ceyteabu@online.ru |

ශ්‍රී ලංකා තේ මණ්ඩලය
2012 වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

නො 574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව

දුරකතන : 011 2582121/ 0112583687 ඊ-මේල් : teaboard@pureceylontea.com
වෙබ් : www.pureceylontea.com